

සන්න සහිත

# කච්චායන භේදය

THE

# KACCAYANA BHEDA.

BY

VENERABLE STHAVIRA MAHAYASA.

TRANSLATED BY

VENERABLE J. S. PANNASARA MAHATHERA

ස න් න ස හි ත

# කච්චායන භෙදය.

කො ස් ගො ඩ

තල්ගහපිටියේ අභයසිරිවඩ්ඪනාරාම වාසී

**පඤ්ඤාරාම ස්ථවිරයන් විසින්**

ප්‍රතිසංසකාරණයකාරණලදි.

**ශ්‍රී. බු. ව. 2450.**

# සංඥාපනය.

කාත්‍යායන ව්‍යාකරණ රත්නාකර ප්‍රවේශයෙහි නිරතවූ ආධුනික ජනතාවට නිරායාශ මාර්ගවූ “කච්චායන භෙද” නම් මේ ග්‍රන්ථය මීට දෙසිය අට අනූ වර්ෂයකින් පෙර එනම් ශ්‍රී බුද්ධ වර්ෂයෙන් 2152 පමණ කාලයෙහි බුරුම රට විසූ කීර්තිමය මූර්ති ඇති පාලි සංස්කෘතාදි නානාභාෂාවන්හි විසාරද බුද්ධිමත්වූ දෙඹගීසිංහ වෘත්තිය ඇසුරුකොට කරණලද “සම්බන්ධාපදෙශ” නම් සංස්කෘත ග්‍රන්ථය නිශ්‍රයකොට “කච්චායනසාර” නම් පාලි ව්‍යාකරණ ග්‍රන්ථය නිර්මානයකළ **මහායස** නම් මහාස්ථවිරයන් විසින් රචනාකරණලදි.

මීට **අරියාලඞ්කාර** මහතෙරුන් විසින් විරචිත ප්‍රමාණයෙන් කුඩාවූවත් කච්චායනභෙදගත අර්ථාවබොධයෙහි මහොපකාරීවූ “සාරත්ථවිකාසිනී” නම් පුරාණ ටීකාවද **උත්තමසික්ඛ** මහාස්ථවිරයන් විසින් පෙළ අටුවා ටීකා ප්‍රකරණ ආදියෙන් හා නොයෙක් පාලිව්‍යාකරණ ග්‍රන්ථාන්තරයන්ද දෘෂ්ටාන්ත දක්වා සූවිසි බණවරකින්පමණ ඉතා විස්තරව රචනා කරණ ලද “කච්චායනභෙද පදීපක සංවණ්ණනා” නම් අභිනව ටීකාවදැයි ටීකාවෙක් විද්‍යමානයි.

මේ කච්චායනභෙද ග්‍රන්ථය ග්‍රහණ ධාරණ විසින් පරිශීලනය කරණුවන්ට කාත්‍යායන ව්‍යාකරණාවබොධය සුකරවූයේවීනමුත් නවීණයන්ට ව්‍යාඛ්‍යාවිරහිත කච්චායනභෙදයෙන් ප්‍රතිෂ්ඨා ලැබීම සුකර නොවේමය.

එබැවින් මෙයින් සම පනස් වර්ෂයකට පෙර දක්ෂිණ ලඞ්කාවේ කොස්ගොඩ ගණේගොඩැල්ලේවිජයසිරිවර්ධනාරාමයෙහිවිසූ ප්‍රෙතවත්ථු අටුවාසන්නයෙහිද අභිනව සාසනවංස සන්නයෙහිහා කුසජාතක කාව්‍ය ව්‍යාඛ්‍යායෙහිකර්තෘවූ පාලි සංස්කෘතාදි භාෂාතන්ත්‍ර විජානනයෙහි සුනිපුණපාණ්ඩිත්‍යයක් දැරූ **ජිනවංස සිරි පඤ්ඤාසාර** මහාස්ථවිරයන්වහන්සේ විසින් මේ(කච්චායන භෙද)ප්‍රකරණයට සන්න ලියන ලදි. භෙද ගූඪාර්ථ ප්‍රදිපනයෙන් ආධුනික ජනතාවගේ විපුල ප්‍රයොජනයට බාධාවේයෙයි ලිහිල්බසින් අභිනව ටීකාමතානුසාරිව

උදාහරණදක්වමින් විස්තර කටයුතු තැන්සවිස්තරවදසුබොධස්ථාන සංක්ෂෙපවද ඇතම් තැන ටීකාපාඨද දක්වමින් භාවයම ගරුකොට සලකා ඉතා පරිශ්‍රමයෙන් ලියනලද බැව් පෙනේ.

මෙය නූතන ශිෂ්‍යසමූහයා අතර පතලකිරීම මෙකල ආවශ්‍යක කර්තව්‍යයක් හෙයින් සත්තකතෘන්වහන්සේගේ අනු ශිෂ්‍යයෙක්වූ කොස්ගොඩ තල්ගහපිටියේ අභයසිරිවඩ්ඪනාරාමවාසී පඤ්ඤාරාම ස්වාමීන්වහන්සේලවා මුද්‍රණයට යොග්‍යපරිද්දෙන් ප්‍රතිසංස්කරණය කරවාගෙණමෙසේ ප්‍රසිද්ධ කෙළෙමු.

මේ පොත මුද්‍රණය කරවීම සඳහා කොස්ගොඩ අගම්පොඩි චාර්ලිස් මැන්ඩිස් විසින් කඩදාසි අරන් දීමෙන් ආධාර කරණලද බව සතුටින් ප්‍රකාශකරමු.

ස න් න ස හි ත

# කච්චායන භෙදය.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

1 ජිතමාරාදිකං බුද්ධං ධම්මං මොහවිධංසකං,
වන්දිත්වාඋත්තමං සඞ්ඝං කච්චායනස්ස වණ්ණිතං

2 කච්චායනස්ස භෙදග්ගං සප්පයොගං යථාරහං,
සොතුජනානමත්ථාය පවක්ඛාමි සමාසතො.

---

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

බුද්ධං කාරුණිකං ලොකෙ ධම්මං මොහවිහිංසකං,
සඞ්ඝං සුප්පටිපන්නාඤ්ච වන්දෙ'ග්ගං සිරසා සදා 'ති,

ශ්‍රී ලොකෛක තිලක සකලඥෙය සාගර පාරගත ශ්‍රී ගුණරත්න මන්දිරාය මාන වූ බුද්ධාදිරත්නත්‍රය විෂයෙහි ඉෂ්ටදෙවතා නමස්කාර ප්‍රදීපක පූර්ව වාක්‍යය කාරණකොටගෙණ. විහායා ශෙෂාපද්‍රවාදීන් ඇතිව කප්සුවනස් මුලුල්ලෙහි සමුපචිත දානාදී පුණ්‍යසම්භාරයෙන් ජනිත ප්‍රඥාප්‍රදීපා ලොකයෙන් විගතාශෙෂ මොහාන්ධකාරය කරණකොටගෙණ වෙදත්‍රයෙහි පරතෙරට පැමිණි මහාකාත්‍යායන ස්ථවිර ස්වාමිපාදයන්වහන්සේ විසින් සර්වඥභාෂිතවූ පරම ගම්භීර සුවිසුද්ධකෙවල පරිපූර්ණ වූ මනොරම්‍ය සමස්ත පර්‍යාප්ති ධර්මය මනාව උද්ග්‍රහණ ධාරණාදිය පිණිස තදනුරූපවූ නිරුක්ති ශාස්ත්‍රය තැනූබැවින් ඒ නිරුක්ති ශාස්ත්‍රය සංක්ෂෙපයෙන් මනාව බොධනය පිණිස යශොධාසස්යයන් වහන්සේ විසින් කරණලද “කච්චායනභෙද”

නාම් ප්‍රකරණයෙහි ඉෂ්ටදෙවතා නමස්කාරය ප්‍රකාශක "ජිතමාරාදිකං" යනාදි පූර්ව වාක්‍යයාගේ පටන් කච්චායන භෙදය සම්බන්ධ ගාථාවන්ගේ සංක්ෂෙප අර්ථකථනයට මාගේ ඥාන ප්‍රමාණයෙන් ආරම්භ කරණු ලැබේ.

අහං කච්චායනස්ස භෙදං පවක්ඛාමි; යනු මෙහි ක්‍රියාකාරක පදසම්බන්ධයි.

කො පවක්ඛති? අහං පවක්ඛාමි; කිං පවක්ඛසි? අහං කච්චායනස්ස භෙදං පවක්ඛාමි; කිං කත්වා කච්චායනස්ස භෙදං පවක්ඛසි? වන්දිත්වා කච්චායනස්සභෙදං පවක්ඛාමි; කිං වන්දිත්වා කච්චායනස්ස භෙදං පවක්ඛසි? බුද්ධං වන්දිත්වා කච්චායනස්සභෙදං පවක්ඛාමි; කිං විසිට්ඨං බුද්ධං වන්දිත්වා කච්චායනස්සභෙදං පවක්ඛසි? ජිතමාරාදිකං බුද්ධං වන්දිත්වා කච්චායනස්සභෙදං පවක්ඛාමි; පුනරපි කිං වන්දිත්වා කච්චායනස්සභෙදං පවක්ඛසි? ධම්මංච වන්දිත්වා කච්චායනස්සභෙදං පවක්ඛාමි; කිං විසිට්ඨං ධම්මංච වන්දිත්වා කච්චායනස්සභෙදං පවක්ඛසි? මොහවිද්ධංසකං ධම්මංච වන්දිත්වා කච්චායනස්සභෙදං පවක්ඛාමි; පුනරපි කිං වන්දිත්වා කච්චායනස්සභෙදං පවක්ඛසි? සඞ්ඝංච වන්දිත්වා කච්චායනස්සභෙදං පවක්ඛාමි; කිං විසිට්ඨං සඞ්ඝංච වන්දිත්වා කච්චායනස්සභෙදං පවක්ඛසි? උත්තමං සඞ්ඝංච වන්දිත්වා කච්චායනස්සභෙදං පවක්ඛාමි; පුනරපිකිං වන්දිත්වා කච්චායනස්සභෙදං පවක්ඛසි? කච්චායනංච වන්දිත්වා කච්චායනස්ස භෙදං පවක්ඛාමි; කිං විසිට්ඨං කච්චායනංච වන්දිත්වා කච්චායනස්සභෙදං පවක්ඛසි? වණ්ණිතං කච්චායනංච වන්දිත්වා කච්චායනස්ස භෙදං පවක්ඛාමි;—යනු මෙහි චොදනා සහිත පරිහාරයි

ජිතමාරාදිකං යන පදය, බුද්ධං යන පදය, ධම්මං යන පදය, මොහවිද්ධංසකං යන පදය, වන්දිත්වා යනපදය උත්තමං යන පදය, සඞ්ඝං යන පදය, කච්චායනං යන පදය. ච යන පදය, වණ්ණිතං යන පදය, යි කියා මෙසේ මේ ගාථා තොමෝ විභක්ත්‍යන්තපද විභාග වශයෙන් දසපදයකින් යුක්තාවී.

කච්චායනස්ස යන පදය, භෙදං යන පදය, අහං යන පදය, සප්පයොගං යනපදය, යථාරහං යන පදය, සොතුජනානං යන පදය, අත්ථාය යන පදය, පවක්ඛාමි යන පදය, සමාසතො යන පදය, යි කියා මේ ගාථා තොමෝ නවපදයකින් යුක්තාවී. මේ පදවිනතා සංවණ්ණිතාවයි.

ජිතමාරාදිකං බුද්ධංච මොහවිද්ධංසකං ධම්මංච, උත්තමං සඞ්ඝං

ච, වණ්ණිතං කච්චායනං ච, වන්දිත්වා සොතුජනානං අත්ථාය කච්චායනස්ස සප්පයොගං යථාරහං භෙදං සමාසතො අහං පවක්ඛාමි, යනු පදාර්ථ සංවණ්ණනාවයි.

මෙහි ප්‍රථම ගාථාවෙන් මුඛ්‍ය ප්‍රයොජනය හා පශ්චිම ගාථාවෙන් ආනුෂඞ්ගික ප්‍රයොජනයද දැක්වී; ඒ උභය ප්‍රයොජනයන්ම ආදි පඤ්චකයනමිවී—ගේ කවරේද?

සඤ්ඤා, නිමිත්තං කත්තාච පරිමාණං පයොජනං,
සබ්බාගමස්ස පුබ්බෙව වත්තබ්බං වත්තු මිච්ඡතා.

යන මේ පඤ්චකයවේ. මෙහි සංඥනම් ප්‍රකරණයාගේ නාමයවී; නිමිත්තනම් ප්‍රකරණය සාධන පිණිස ආධ්‍යාත්මික බාහිරවශයෙන් පැවැති කාරණයනම්; කර්තෘනම් ප්‍රකරණ කාරක කර්තෘහුය; පරිමාණනම් ප්‍රකරණයාගේ ග්‍රන්ථප්‍රමාණාදියය; ප්‍රයොජනනම් යම් ප්‍රකරණයක් සෑදීමෙන් වන්නාවූ ප්‍රයොජනයයි.

පශ්චිම ගාථාවෙහි “භෙදං” යන්නෙන් ප්‍රකරණයාගේ නාමය හා “ පවක්ඛාමි ” යන්නෙන් මේ ප්‍රකරණ කාරක යශාචාර්‍ය්‍යයන් වහන්සේ විසින් සත්ත්වයා විෂයෙහි ප්‍රවෘත්තිත කරුණාව නමැති ආධ්‍යාත්මික නිමිත්තහා “ සොතුජනානං ” යන්නෙන් ය්ථොක්ත ලක්ෂණ වූ කරුණාවට නිමිත්තවූ සත්ත්වසමූහ නමැති බාහිර නිමිත්තද ප්‍රකාශිතය; “අහං” යන්නෙන් ප්‍රකරණකර්තෘසංඛ්‍යාත යශාචාර්‍ය්‍යයන්ද ප්‍රකාශය. “සප්පයොගං යථාරහං සමාසතො” යන්නෙන් නාතිසංක්ෂෙප නාතිවිස්තාරවූ ප්‍රකරණයාගේ ප්‍රමාණය ප්‍රකාශිතය; “භෙදං” යන මේ පාඨයාගේ සාමර්ථ්‍යයෙන් මේ කච්චායනභෙද ප්‍රකරණය නිසා ශබ්දභෙද සංඛ්‍යාත අභිප්‍රාය දැන ශබ්දානුරූප උතුම්වචනා විය තෙමේ දැන්මද අන්‍යයන්ලවා දැන්වීමද අර්ථානුරූපශබ්ද උච්චාරණයහා උච්චාරාපනයද යන මුඛ්‍යප්‍රයොජනයහා ශීලාදිවූ නිර්වාණය කෙළවරකොට ඇති ආනුෂඞ්ගික ප්‍රයොජනයද කියන ලදහ.

මෙහි ප්‍රමාණනම් “කච්චායනස්ස භෙදං” යන මෙහි ග්‍රන්ථභෙද පරිච්ඡෙදභෙද සූත්‍රභෙද සමූහභෙද පයොගභෙදයයි කියා පඤ්චප්‍රකාරවේ.

එහි ග්‍රන්ථභෙදය විශෙෂ වශයෙන් සන්ධි ග්‍රන්ථය නාම ග්‍රන්ථය කාරකග්‍රන්ථය සමාසග්‍රන්ථය තද්ධිතග්‍රන්ථය ආඛ්‍යාතග්‍රන්ථය කිතක ග්‍රන්ථය උණාදි ග්‍රන්ථයයි අටවැදෑරුම්වී; නොහොත් සන්ධි ග්‍රන්ථ නාමග්‍රන්ථ ආඛ්‍යාත ග්‍රන්ථ කිතක ග්‍රන්ථ වශයෙන් සතරවැදෑරුම්වී.

පරිච්ඡේද වශයෙන් සන්ධිපරිච්ඡේද පසෙක. නාමපරිච්ඡේද පසෙක, කාරකපරිච්ඡේද එකෙක; සමාසපරිච්ඡේද එකෙක; ආඛ්‍යාතපරිච්ඡේද සතරෙක; කිබ්බිධානපරිච්ඡේද පසෙක; උණාදි පරිච්ඡේද එකෙකැයි මෙසේ පරිච්ඡේද තෙවිස්සෙක් වෙති—

**සූත්‍රභෙදය වනාහි-**

“ සන්ධිම්හිඑකපඤ්ඤාසං නාමම්හි ද්විසතම්භවෙ,
අට්ඨාරසාධිකඤ්චෙව කාරකෙ පඤ්ච තාලිසං.

සමාසෙ අට්ඨවීසඤ්ච වාසට්ඨි තද්ධිතෙ මතං,
අට්ඨාරස සතාඛ්‍යාතෙ කිතෙ සුත්තසතම්භවෙ.

උණාදිම්හිච පඤ්ඤාසං ඤෙය්‍යං සුත්තපභෙදතො.
සබ්බං සම්පිණ්ඩ පානන්තු ඡසතසත්තති භවෙ හි, යි.

මේ සූත්‍රයෝ මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ විසින් කරනලද්දහ. වෘත්තිය සංඝනන්දි නම් ස්ථවිරයන්වහන්සේ විසින් කරනලදි. ප්‍රයොගයන් (තවත් උදාහරණයෝ) බ්‍රහ්මදත්ත නම් ස්ථවිරයන් වහන්සේ විසින් කරනලද්දහ. න්‍යාසය විමලබුද්ධි ස්ථවිරයන් වහන්සේ විසින් කරනලදි.

**කියේ මැනෙ.**

“කච්චායනෙන කතොයොගො වුත්තිච සංඝනන්දිනො, †
පයොගො බ්‍රහ්මදත්තෙන න්‍යාසො විමල බුද්ධිනා”—යි.

මේ සූත්‍රසංඛ්‍යාව ප්‍රක්ෂේප සූත්‍රයා සමග ප්‍රමාණයයි.

බණවර වශයෙන් ගාථාපණසක් ඌනසැතබණවරෙක් වෙයි. අෂ්ටාක්ෂර ප්‍රතිමණ්ඩිත සතරපදයෙකනෙක් ග්‍රන්ථයෙක් වේ, නොහොත් දෙතිස් අක්ෂරයෙක් ග්‍රන්ථයෙක් නම් වෙයි, දෙසිය පනස් ග්‍රන්ථයෙක් නොහොත් අක්ෂර අට්දහසෙක් බණවරෙක් වෙයි; ඒ බව මෙසේ දක්වනලදි.

“බාත්තිංසක්ඛර ගන්ථානං පඤ්ඤාස ද්විස තම්පිච,
භාණවාරොති සො වුත්තො අට්ඨක්ඛර සහස්සකො”—යි.

ප්‍රයොගභෙදය වනාහි සන්ධිභෙද නාමභෙද කාරකභෙද සමාස භෙද තද්ධිතභෙද ආඛ්‍යාතභෙද කිතකභෙදවශයෙන් සත්වැදෑරුම් වේ- සන්ධිභෙදය වනාහි ආගම සන්ධිතුනෙක, ලොපසන්ධි තුනෙක,

† එත්ථච සඞ්ඝනන්දිනොති තතියත්ථෙ සාමිවචනං, යි. ටීකා

ආදෙශසන්ධි තුනෙක, විකාරසන්ධි දෙකෙක, දීර්ඝසන්ධි දෙකෙක, ප්‍රකෘති සන්ධිදෙකෙක; මෙසේ සන්ධිභෙදය සතළොස් වැදෑරුම්වේ—

ඉතිරිභෙද විස්තර ග්‍රන්ථබාහුල්‍ය භයින් මෙතන්හි නොදක්වමි. ටීකාහයින් විස්තර දතයුතුයි.

“ ජිතමාරාදිකං ” යනාදි ගාථාවන්ගේ පද විග්‍රහ සංවර්ණනා වනාම්.

1 (ජිනිතබ්බො 'ති=ජිතො; මරති වජ්ජති 'ති=මාරො; ජිතො ච සො මාරොචා 'ති=ජිතමාරො; ආදියති සමුද්දයො එතෙහී 'ති= ආදයො, ජිතමාරාආදයො යෙසංතෙ=ජිතාමාරාදයො; තෙසස අත්'ති= ජිතමාරාදිකො තං-*සබ්බධම්මෙ බුජ්ඣතී'ති=බුද්ධො; තං-යථානුසිට්ඨං පටිපජ්ජමානෙ සත්තෙ චතුසු අපායෙසු වට්ටදුක්ඛෙ සුච අපතමානෙ ධාරෙතී'ති=ධම්මො; තං—මුය්හන්ති සම්පයුත්ත ධම්මා එතෙනී ති= මොහො; විසෙසෙන ධංසතී 'ති= විධංසනො; මොහස්ස විධංසකො=මොහ විධංසකො; තං—තමෙනන්ති සම්පයුත්තාධම්මා එතෙනා 'ති=තමො; තමනං වා= තමො; උඩ්ඩතො තමොතෙන සො= උත්තමො; තං— සංසුට්ඨං කිලෙසෙ හනති 'ති= සඞ්ඝො; ( අරියපුග්ගල සමූහො) තං-වණ්ණිතබ්බං පසංසිතබ්බන්ති=වණ්ණිතං; තං කසි වණිජ්ජාදීහි කචති දිප්පතී 'ති=කච්චො; කච්චස්ස අපච්චං (පුත්තො) කච්චායනො; තං— )

ජිතමාරාදිකං, ජයගත්තාලද දෙවිපුත්‍රාදී පඤ්චවිධ මාරයන් ඇත්තාවූ; බුද්ධංච, (සකලඥෙය ධර්මය සර්වඥතාඥානයෙන් කරතලාමලකක්‍රමයෙන් අවබොධකළාවූ) සර්වඥයාද; මොහවිධංසකං, අවිද්‍යා සංඛ්‍යාතඅන්ධකාරයදුරුකරන්නාවූ; ධම්මංච, නවලොකොත්තර ශ්‍රීසද්ධර්මයද; උත්තමං, උද්ධරණය කරණලද තමසංඛ්‍යාත මොහය ඇත්තාවූ; හෙවත් උතුම්වූ; සඞ්ඝංච, අෂ්ටාර්‍ය්‍ය පුද්ගල සඞ්ඝයාද; වණ්ණිතං, බුදුන් විසින් වර්ණනා කරණලද්දාවූ; කච්චායනංච, (නිරුක්තිශාස්ත්‍රකාරක මහා) කාත්‍යායන ස්ථවිරයන්ද; වන්දිත්වා, (භය ලොභ කුලාචාරාදීන් විනිර්මුක්තව කායාදී මාරත්‍රයෙන් සත්කොට) වැඳ;

2 (කචති දිප්පති 'ති= කච්චො; කච්චස්ස අපච්චං පුත්තො=කච්චායනො; කච්චායනස්ස ඉදං= කච්චායනං; තස්ස— භිඥති එතෙනා

* “ජිතාමාරාදයො යෙන සො= ජිතමාරාදිකො: සමාසන්තෙන කපච්චයොති වදන්ති” යනු ටීකායි·

3 කසිකම්මාදිනා බ්‍යාපාරෙනදිප්පති යොපිතා,
ඉති කච්චස්ස පුත්තෙනාතු තස්සකච්චායනො මතො

4 පතනෙනවකත සත්ථම්පි කච්චායනනාති ඤායති,
කච්චායනස්සිදං සත්ථං ඉමිනාවචනත්ථතො.

5 සත්ථං අට්ඨවිධං හොති සන්ධිනාමඤ්ච කාරකං,
සමාසං තද්ධිතා ඛ්‍යාතං කිතකං උණ්ණිකං ඉති.

---

ති=භෙදං උදාහරණං පන භින්දති පකාරං කරොතී 'ති=භෙදො; (පකාරො) තං— පයොගෙන සහ වත්තතී 'ති= සප්පයොගං; තං—භෙදස්ස අනුරූපං පයොගං පයොගස්ස අනුරූපංවා භෙදං අරහතී 'ති= අරහං; අරහස්ස භෙදස්ස පයොගස්සච යථානුරූපං= යථාරහං; සුණාතී 'ති= සොතා; සොතාච සොතාච= සොතාරො; කිලෙසෙ ජහතී'ති=ජනා; සොතාරොච තෙ ජනාචා'ති=සොතුජනා; තෙසං— අත්ථං ගච්ඡති පවත්තතී 'ති= අත්ථො; තස්ස—සමසනං—සමාසං; තතො –)

කච්චායනස්ස, කාත්‍යායන ස්ථවිරයන්වහන්සේගේ; සප්පයොගං උදාහරණ සංඛ්‍යාත ප්‍රයොග සහිතවූ; යථාරහං, ප්‍රයොගාර්හවූ; භෙදං භෙදය; නොහොත් කච්චායන භෙදය; සොතුජනානං අත්ථාය, ශ්‍රවණාලය ජනයන්ට (මුඛ්‍ය ප්‍රයොජන ආනුෂඞ්ගික ප්‍රයොජන සංඛ්‍යාත ලෞකික ලොකොත්තර) ප්‍රයොජනය පිණිස; සමාසතො, (නාතිසංක්ෂෙප නාතිවිස්තාරව) මධ්‍යස්ථාකාරයෙන්; හෙවත් සංක්ෂෙපයෙන්; පවක්ඛාමි, ප්‍රව්‍යාඛ්‍යා කෙරෙමි; (ප්‍රකාරයෙන් කියමි.)

3 යොපිතා, යම්පිතෘකෙනෙක්; කසිකම්මාදිනා බ්‍යාපාරෙන, කෘෂිකර්මාදිවූ ව්‍යාපාරයෙන්; හෙවත් උත්සාහයෙන්; දිප්පති ඉති, දීප්තිමත් වන්නේනුයි; (සො, හෙතෙම; කච්චො, කච්චනාමි;) තස්ස කච්චස්සාතු, ඒ කච්චයාගේ වනාහි; පුත්තො, පුත්‍රතෙම; කච්චායනොමතො, කාත්‍යායනයයි දන්නාලද්දේය.

4 ඉදං සත්ථං, මේ ධනසඞ්ඛ්‍යාත ශාස්ත්‍රය; කච්චායනස්සඉති, කාත්‍යායනයාගේය යන; ඉමිනා වචනත්ථතො, මෙකී වචනාර්ථයෙන්; නොහොත් මේ වචනාර්ථය හෙතුකොටගෙණ; තෙන එව, ඒ කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ විසින්ම; කතසත්ථම්පි, කරණලද නිරුක්ති ශාස්ත්‍රයද; කච්චායනං ඉති, කාත්‍යායන නිරුක්ති ශාස්ත්‍රයයි; ඤායති, හැඟේ; නොහොත් දතයුතුයි—

6 සමාධීයන්ති යං තස්ස අදස්සෙත්වාන මන්තරං,
වඩ්ඪකීනාවධීයන්ති සන්ධියෙන පවුච්චති.

7 සරබ්‍යඤ්ජන වුත්තානං සන්ධීනඤ්ච වසාතිධා,
සරෙසුවා බ්‍යඤ්ජනෙසු විහිතා සරබ්‍යඤ්ජනා.

5 (අත්ථං සුභවති පාකටං කරොතී'ති=සුත්තං; අට්ඨවිධා පකාරා යස්ස සුත්තස්ස තං අට්ඨවිධං; සමාධියන්ති එත්ථා'ති=සන්ධි; අත්ථං නමන්ති එත්ථා 'ති= නාමං; කිරියං කරොන්ති නිප්ඵාදෙන්ති එත්ථා 'ති= කාරකං; සමාසීයන්ති එත්ථා 'ති= සමාසං, තෙසං අපච්චාදි අත්ථානං හිතං= තද්ධිතං; විභත්තීහියො ආඛ්‍යායන්ති එත්ථා'ති=ආඛ්‍යාතං; සිස්සානංහිතං කරොති එත්ථා'ති– කිතං; කිතං එව කිතකං; උණ ණ ආදියස්සසො= උණාදි; උණාදියස්ස අත්ථි තස්මිංවා විජ්ජතී'ති=උණාදිකං; ¶ )

සුත්තං, ශාස්ත්‍රය; සන්ධිච, සන්ධිශාස්ත්‍රයද; නාමංච, නාමශාස්ත්‍රයද; කාරකංච, කාරකශාස්ත්‍රයද; සමාසංච, සමාස ශාස්ත්‍රයද; තද්ධිතංච, තද්ධිතශාස්ත්‍රයද; ආඛ්‍යාතංච, ආඛ්‍යාත ශාස්ත්‍රයද; කිතකංච, කිතක ශාස්ත්‍රයද; උණාදිකංච ඉති, (උණාදිප්‍රත්‍යය ආදිකොට ඇතිහෙයින් උණාදිකයයි කියනලද) උණාදික ශාස්ත්‍රය දැයි කියා; අට්ඨවිධං හොති, අටවැදෑරුම්වේ; හෙවත් අෂ්ටප්‍රකාරයයි දතයුතු.

6. තත්‍ර, ඒ අටවැදෑරුම්වූ නිරුක්ති ශාස්ත්‍රය අතුරෙන්; (සන්ධිශාස්ත්‍රයනම්) වඩ්ඪකීනා, වඩුවාවිසින්; අවධීයන්ති, ‡ (යම්සේ පුවරු දෙකක් අතරක් විවරක් නොදක්වා) සටනාලැබෙද්ද; (එමෙන් සන්ධිකරණු කැමති ආචාර්‍ය්‍යයා විසින් දෙපදයන්ගේ) අන්තරං, අතරක් (විවරයක්) අදස්සෙත්වාන, නොදක්වා; යං, යම්කාරණයකින්; සමාධියන්ති, සම්බන්ධකරණු ලැබෙද්ද; තෙන, ඒකාරණයෙන්; සන්ධි, සන්ධියයි, පවුච්චති, කියනුලැබේ.

7 සරබ්‍යඤ්ජන වුත්තානං, ස්වරසන්ධි බ්‍යඤ්ජන සන්ධි වශාදි සන්ධි සංඛ්‍යාතවූ; සන්ධීනඤ්ච වසා, සන්ධීන්ගේද වශයෙන්; තිධා, තුන් පරිද්ඡෙදක්වේ; සරෙසුවා, ස්වරයන් කෙරෙහි හෝ; (ස්වරයන් පරකල්හි හෝ;) විහිතා, යම් සන්ධියක් කියන ලද්දීද; බ්‍යඤ්ජනෙසුවා, ව්‍යඤ්ජනයන් කෙරෙහි හෝ; (බ්‍යඤ්ජනයන් පරකල්හි හෝ) යම් සන්ධියක්

¶ ආදි සද්දස්ස ලොපං කත්වා එවං දට්ඨබ්බං—යනු ටීකායි;

‡ “ වඩ්ඪකී නාධීයන්ති ඉච ” යිද, “ ඉචාති උපමා චොදකො නිපාතො ” යිද ටීකායි.

8 ගාථා සුවුත්තභාවත්ථං වාචාසිලිට්ඨතාය ච.
ලොපාගමං කරිත්වාන විහිතා වුත්තසන්ධිකා.

9 සද්ධීධ විත්තං කිං සූධ තස්මිහ තස්ස මුසා භවෙ,
සෙය්‍යථපි කොපදමනො ඉදං තෙසං නිදස්සනං

10 ලොපා දෙසඤ්චආගමො විකාරො පකති තථා,
දීඝරස්සවසෙනාපි සන්ධි සත්ත විධා මතා.

---

කියන ලද්දීද; සරබ්‍යඤ්ජනා, ඒ ස්වරසන්ධි හා බ්‍යඤ්ජන සන්ධිනම් වෙත්.

ඉක්බිති වෘත්තිසන්ධි ලක්ෂණ දක්වනු පිණිස ශාස්ත්‍රාචාර්‍ය්‍යතෙම "**ගාථා සුවුත්තභාවත්ථං**" යනාදිය කීහ.

8 ගාථාසු, ගාථාපාදයන් කෙරෙහි: වුත්තභාවත්ථං, වෘත්තිය නොපිරිහීම පිණිස; හෙවත් ඡන්දස් පිණිස; (අත්ථං වුත්තවහි එතායාති වුත්ති, යනු විග්‍රහයි; "ගරුලහු නියමො හවෙවුත්තිං" සි ස්‍යාද දැක් වී) වාචාසිලිට්ඨතාය ච, වාක් සිලුටු භාවය පිණිස හෝ, ලොපාගමං කරිත්වාන, වර්ණලෝපය හා වර්ණාගමයද කොට; (ලොපඤ්ච ආගමඤ්ච ලොපාගමං"සි නිර්වචනය) විහිතා, කියනලද්දී; වුත්තසන්ධිකා, වෘත්ති සන්ධිනම්වී; ("සන්ධි එව සන්ධිකා" ස්වාර්ථයෙහි කප්‍රත්‍යයවූනැති)

ඒ තුන්සන්ධීන්ට උදාහරණ දක්වන්ට ශාස්ත්‍රාචාර්‍ය්‍යතෙම "**සද්ධීධ විත්තං**" යනාදිය කීහ—

9 සද්ධීධ විත්තං කිංසූධ, සද්ධීධ යනුහා කිංසූධ යනුද; තස්මිහ තස්ස මුසාභවෙ, තස්මිහ තස්ස මුසාභවෙ යනුද; සෙය්‍යථාපිකොපදමනො, සෙය්‍යථාපිකො පදමනො යනුද; ඉදං, මේ; තෙසං, ඒ ත්‍රිවිධ සන්ධීන්ට; නිදස්සනං, නිදර්ශනයි; හෙවත්, උදාහරණය. ("නිද්දිස්සියති එතෙනාති නිදස්සනං" සි නිර්වචනය; සද්ධා+ඉධ; කිංසු+ඉධ; යි ඡේද්‍යකල්පකල්හි ස්වරපරවතිබිහෙයින් ස්වරසන්ධිනම, තස්මිහි යන තැන, තං+හි; කියා ඡේද්‍යකල්පකල්හි බ්‍යඤ්ජන පරවසිටිහෙයින් බ්‍යඤ්ජනසන්ධිනම; "සෙය්‍යථාපිකො අක්ඛරපදං" සී, කියයුතුතන්හි වෘත්තියගේ නොපිරිහීම පිණිස අක්ඛරශබ්දය ලොප්කොට "සෙය්‍යථාපිකොපදං" සි වූබැවින් වෘත්තිසන්ධිනමැයි සේයි)

මෙසේ ත්‍රිවිධාකාරයකින් සාමාන්‍ය සන්ධිදක්වා නැවත සත්වැදෑරුම් සන්ධිප්‍රභෙදදක්වන්නේ ආචාර්‍ය්‍යපාදයෝ "**ලොපාදෙසඤ්ච**" යනාදිය කීහ.

**11** **තයො තයො තයො ද්වෙ ද්වෙ ද්වෙ චෙව යථාක්කමං,**
**තිඌන වීසති සන්ධි පණ්ඩිතෙහි විජානියං.**

**12** **සරබ්‍යඤ්ජන බින්දූනං වසෙනෙහි තයොමතා,**
**යස්සින්ද්‍රියානි චත්තාරොමෙ ඉති සරලොපතො.**

**13** **එවං සතෙ අග්‍යාගාරං ඉති බ්‍යඤ්ජන ලොපතො,**
**තාසාහන්ති මතං නිග්ගහීත ලොපනාසි මිසඳැනා.**

---

10 ලොපඤ්ච, ලොප සන්ධියද; ආදෙසඤ්ච, ආදෙශ සන්ධියද; ආගමොච, ආගම සන්ධියද; විකාරොච, විකාර සන්ධියද; පකතිච, ප්‍රකෘති සන්ධියද; තථා, එපරිද්දෙන්; දීඝරස්ස වසෙන අපි, දීර්ඝසන්ධි හ්‍රස්වසන්ධි වශයෙන්ද; සන්ධි, සන්ධිහු; සත්තවිධා, සත්ප්‍රකාරයකින්; මතා, දන්නාලද්දුහ.

මෙසේ උදෙසුන් විසින් දක්වා නිදෙසුන් විසින් සතළොස්ප්‍රකාරයකින් සන්ධි දක්වන්නේ “**තයො තයො**” යා දෙය කීහ.

11 තයොච එව, ලොපසන්ධිහුද තුනෙක්ම වන්නාහ; තයො ආදෙශ සන්ධිහුද තුනෙක්ම වන්නාහ; තයො, ආගමසන්ධිහුද තුනෙක්ම වන්නාහ; ද්වෙච එව, විකාරසන්ධිහුද දෙකෙක්ම වන්නාහ; ද්වෙ, ප්‍රකෘතිසන්ධිහුද දෙකෙක්ම වන්නාහ; ද්වෙ, දීර්ඝසන්ධිහුද දෙකෙක්ම වන්නාහ; ද්වෙ, හ්‍රස්වසන්ධිහුද දෙකෙක්ම වන්නාහයි; තිඌනවීසති සන්ධි, සතළොස් සන්ධිහු; යථාක්කමං, පිළිවෙළින්; පණ්ඩිතෙහි, පණ්ඩිතයන් විසින්; විජානියා, දතයුත්තාහුයි.

මෙසේ සංඛ්‍යාවශයෙන් ප්‍රභෙද දක්වා ඒ සන්ධීන්ට උදාහරණ සහ ස්වරූප දක්වන්ට “**සරබ්‍යඤ්ජන බින්දූනං**” යනාදිය කීහ.

12 සරබ්‍යඤ්ජන බින්දූනං වසෙනෙහි, ස්වරලොපසන්ධි ව්‍යඤ්ජන ලොපසන්ධි නිග්ගහීතලොප සන්ධීන්ගේ වශයෙන්; තයො මතා, ත්‍රිවිධ ලොප සන්ධිහුද දන්නාලද්දුහ; යස්සින්ද්‍රියානි චත්තාරොමෙ ඉති, යස්සින්ද්‍රියානි චත්තාරොමෙ යනු; සරලොපතො, ස්වරලොප වශයෙන්; (මතං, දන්නාලදි;) යස්ස + ඉන්ද්‍රියානි, යනතැන පූර්වස්වර ලොපයහා චත්තාරො × ඉමෙ, යනතැන පරස්වර ලොපයද කීහ.

මෙසේ ස්වරලොපය දක්වා ඉක්බිති ව්‍යඤ්ජන ලොපය දක්වන්ට “**එවංසතෙ**” යනාදිය කීහ.

13 එවංසතෙ අග්‍යාගාරං ඉති, එවංසතෙ අග්‍යාගාරං යනු,

14 ම්‍යායං ත්‍යාහං සරාදෙසං ඔනද්ධො බ්‍යඤ්ජනොමතො,
තමහන්ති මතං නිග්ගහීතාදෙසන්ති විඤ්ඤුනා.

15 අතිප්පගො පරොචාති සරාගමොති සූචති,
බ්‍යඤ්ජනො නයිමස්සාති පුබ්බංනාමං පරං මතං.

---

බ්‍යඤ්ජනලොපතො, බ්‍යඤ්ජනලොප වශයෙනි; ( එවං+අස්සතෙ යනතැන "බ්‍යඤ්ජනෙනාව විසඤ්ඤොගො" යන මෙයින් පූර්ව සකාර ලොප්ව එවංසතෙ කියාද; අග්ගි+අගාරං, යනතැන මෙම සූත්‍රයෙහි චග්‍රහණයෙන් පූර්ව ගකාර ලොප්ව අග්‍යාගාරං, කියාද බ්‍යඤ්ජනලොපය දැක්වී;) තාසාහං ඉති, තාසාහං, සී; නිග්ගහීත ලොපං ඉති, නිග්ගහීත ලොපයයි; විඤ්ඤුනා, ශාස්ත්‍රඥ පණ්ඩිතයා විසින; මතං, දන්නාලද්දී; තාසං + අහං සි, ජේද්‍යව "ක්වචිලොපං" යන්නෙන් නිග්ගහීතලොප්ව තාසාහං, කියා සිද්ධය වූහයි දතයුතුයි.)

මෙසේ ලොපසන්ධියගේ ස්වරූපදක්වා ආදෙශසන්ධියගෙ උදාහරණ සහ ස්වරූපදක්වන්ට ආචාර්‍ය්‍යතම "ම්‍යායං ත්‍යාහං" යනාදිය කීහ.

14 විඤ්ඤුනා, නුවණැත්තහු විසින්; ම්‍යායං ත්‍යාහං, ම්‍යායං ත්‍යාහං යනු; සරාදෙසං, ස්වරාදෙශ සන්ධියයි; (මතං, දන්නාලද්දී;) ඔනද්ධො, ඔනද්ධො යනු; බ්‍යඤ්ජනො, බ්‍යඤ්ජනාදෙශ සන්ධියයි; මතො, දන්නාලද්දේය; තමහං ඉති, තමහං යනු; නිග්ගහීතාදෙසං ඉති, නිග්ගහීතාදෙශ සන්ධියයි; මතං, දන්නාලද්දී; (ම්‍යායං යනතන්හි මෙ+අයං කියාද; ත්‍යාහං යනතන්හි තෙ+අහං කියාද ජේද්‍යකොට "යමෙදන්තස්සාදෙසො" යන සූත්‍රයෙන් දෙතන්හිම එකාරයින්ට යකාරාදෙශකොට 'ම්‍යායං ත්‍යාහං' කියා සන්ධිකළහෙයින් ස්වරාදෙශ සන්ධිනම්වී; ඔනද්ධො, යනතැන අව÷නද්ධො, සී කියා ජේද්‍යකොට "ඔ අවස්ස" යන්නෙන් අවශබ්දසහට ඔකාරාදෙශකොට සිද්ධයවූබැවින් බ්‍යඤ්ජනාදෙශ සන්ධිනම; තමහං, යනතැන තං×අහං කියා ජේද්‍යකොට "මදූපරෙ" යන්නෙන් නිග්ගහීතයාහට මකාරාදෙශකොට සිද්ධයවූ හෙයින් නිග්ගහීතාදෙශ සන්ධිනමැයි කියාද දතයුතුයි සේයි)

මෙසේ ආදෙශ සන්ධියට පිළිනිදෙසුන් දක්වා ආගම සන්ධියට පිළිනිදෙසුන් දක්වන්ට ශාස්ත්‍රාචාර්‍ය්‍යතම "අතිප්පගොපරො" යනාදිය කීහ.

15 අතිප්පගො පරොච ඉති, * ( මෙහි ඉතිශබ්දය මර්‍ය්‍යාදාර්ථයි

---

* "ඉති සද්දො මරියාදත්ථො. ඉති සද්දෙන සඞ්ගය්හන්ති පදං සඞ්ගණ්හිතබ්බං" යනු ටීකායි—

**16 සරබ්‍යඤ්ජනතො චෙව මෙ මෙ පුබ්බා විජානියා,**
**නොපෙති දහම්වචාදි විකාරෙහි විජානියා.**

---

එහෙයින්) අභිප්පගො පරො සහස්සං යි; සරාගමො ඉති, ස්වරාගම සන්ධියයි; ඤාය හි, හැගෙනුලැබේ; නයිමස්ස ඉති, නයිම්ස්සැයී; බ්‍යඤ්ජනො, බ්‍යඤ්ජනාගම සන්ධියයි හැඟෙනුලැබේ; පුබ්බංගමං, පුබ්බංගමං යනු; පරම්මතං, අන්‍යවූ නිග්ගහිතාගම සන්ධියයි දක්නාලදි. (මෙහි අභිප්පගොපරො සහස්සං යනතැන්හි අභිප්පගොපර+සහස්සං යී කියා ඡේද්‍යකොට " ක්වචිඔබ්‍යඤ්ජනෙ " යන සූත්‍රෙයෙන් ඔකාරාගමකොට පරොසහස්සං, යී කියා සිඬිස වූබැවින් ස්වරාගම සන්ධිනම්වී; නයිමස්ස යනතැන්හි න × ඉමස්ස, යී ඡේද්‍යකොට " **යවමදනතර ලාචාගමා** " යන්නෙන් යකාරාගමෙව සිඬියවූ බැවින් බ්‍යඤ්ජනාගම සන්ධිනම්වී; පුබ්බංගමං යන තැන්හි පුබ්බ+ගමංයී, ඡේද්‍යව " **නිග්ගහීතඤ්ච** " යී මෙයින් නිග්ගහිතාගමකොට සිද්ධිය කළහෙයින් නිග්ගහිතාගම් සන්ධිනමැයි දතයුතුයි.)

මෙසේ ආගමසන්ධියට උදාහරණ දක්වා නැවත ප්‍රකෘති සන්ධියගේ ප්‍රභෙද දක්වනට ආචාර්‍ය්‍යතෙම "**සරබ්‍යඤ්ජනතොචෙව**" යනාදිය කීහ

16 සරබ්‍යඤ්ජනතොචෙව, ස්වරගා බ්‍යඤ්ජනයන්ගේ වශයෙන්ම; පුබ්බා මෙ මෙ, දීඝ හ්‍රස්ව සන්ධින්යොරෙන් පළමු මෙ මෙ යනානු; විජානියා, දතයුත්තාහ; (තයො නයා යනාදි නිර්දේශ ගාථාවෙහි ප්‍රථමකොට තිබෙන චෙව යන මේ පදයෝදෙදෙන විකාර සන්ධිහා ප්‍රකෘති සන්ධියද සඳහා කිබැවින් ඒ සන්ධිහුද ස්වරහා බ්‍යඤ්ජනයන්ගේවශයෙන් දතයුත්තාහු වෙති; කෙසේද? ස්වරවිකාරය බ්‍යඤ්ජන විකාරයයි කියා විකාරසන්ධිය ද්විප්‍රකාරවේ; ස්වරප්‍රකෘතිය බ්‍යඤ්ජන ප්‍රකෘතියයි කියා ප්‍රකෘති සන්ධියද ද්විප්‍රකාරවේ ) නොපෙති දහම්වචාදි, නොපෙතිදහං, යන මේ ආදිය;විකාරෙහි, විකාර සන්ධියයි; විජානියා, දතයුත්තීය; (මෙහි නොපෙති යනතැන්හි, න× උපෙති යී කියා පදභෙද කොට උකාරයාහට "**ක්වචාසවණ්ණංලුත්තෙ**" යන්නෙන් ඔකාරකොට තැනූබැවින් ස්වරවිකාරනම් වේ, ඉදහං යනතැන ඉධ+අහං, කියා ඡේද්‍යකොට ධකාරයාහට " **දෙධස්සච** " යනනෙන් දකාරව සිඬවූ හෙයින් බ්‍යඤ්ජන විකාරනමැයි දතයුතු)

මෙසේ ද්විප්‍රකාර විකාරසන්ධියට ප්‍රයොගදක්වා ද්විප්‍රකාර ප්‍රකෘති සන්ධියට ප්‍රයෝග දක්වනුයේ " **කො ඉමංනානු** ' යනාදිය කීහ.

17 කො ඉමිනාතු මනොපුබ්බං ගමාති පකතී මතා,
විකාරෙ පකතිඤ්චෙව ඤාතුකාමෙන ඤෙය්‍යා.

18 සනිද්දෙසා නිද්දෙසෙන ද්වෙ ද්වෙ පරා විජානියා,
සද්ධිධාති සනිද්දෙසො මුනිවරෙ පරොමතො.

19 යථයිවසනිද්දෙසො තොවාදි අනිද්දෙසනො,
දීඝරස්ස පාතෙදවං ඤාතුකාමෙන ඤෙය්‍යා.

---

17 කො ඉමං මනොපුබ්බං ගමා ඉතිතු, කො ඉමං මනොපුබ්බං ගමා යනු වනාහි; පකති මතා, ප්‍රකෘති සන්ධියයි දන්නාලදී; (කො ඉමං යනතැන ඉවර්ණයාහට ලොපාදියක් නොව ප්‍රකෘතියෙන්ම සිටිහෙයින් ස්වරප්‍රකෘතියයිද. මනොපුබ්බංගමා යනතැන ව්‍යඤ්ජනයා හට ලොපාදියක් නොව ප්‍රකෘතියෙන්ම සිටිහෙයින් ව්‍යඤ්ජන ප්‍රකෘතිය පද දතයුතුයි;) විකාරෙච,විකාරසන්ධියද, පකතිඤ්ච, ප්‍රකෘතිසන්ධිය ද; එවං,මේ ප්‍රකාරයෙන්; ඤාතුකාමෙන,දන්නා කැමැත්තහු විසින්; ඤෙය්‍යා, දතයුත්තාහ.

මෙසේ විප්‍රකාරවිප්‍රකාර විකාර ප්‍රකෘති සන්ධීන් දක්වා විප්‍රකාර විප්‍රකාර දීර්ඝහ්‍රස්ව සන්ධීන්ට පිළිනිදෙස් දක්වන්නෙත් ආචාර්‍ය්‍යතෙම "**සනිද්දෙසා නිද්දෙසෙන**" යනාදිය කීහ.

18 (නිදස්සනං=නිද්දෙසො; පඨමතරං ආදෙසං දිස්සති කරො තී'ති=වා නිද්දෙසො; නිද්දෙසෙනසහයො වත්තතී'ති=සනිද්දෙසො; නත්‍ථි නිද්දෙසො එතස්සාති අනිද්දෙසො, ආදෙසං අකත්වා සුද්ධිවසෙන දීඝරස්සානිනි අනෙහි, තෙන සනිද්දෙසා නිද්දෙසෙන;යනු ටීකායි) සනිද්දෙසා නිද්දෙසෙන, සනිර්දේශ අනිර්දේශයෙන්; පරා, අන්‍ය දීර්ඝ සන්ධි හ්‍රස්වසන්ධීන්; ද්වෙ ද්වෙ, පදදෙකෙනක් පදදෙකෙනක්; විජානියා, දතයුත්තාහු; (සනිර්දේශ දීර්ඝ සන්ධිය අනිර්දේශ දීර්ඝසන්ධියයි කියා දක්නාඩිහු පදදෙකෙනක්හා, සනිර්දේශ හ්‍රස්වසන්ධිය අනිර්දේශ හ්‍රස්ව සන්ධියයි කියා හ්‍රස්වසන්ධි පදදෙකෙනක්ද දතයුත්තාහුයයි යේස.) සද්ධිධාති, සද්ධිධ යනු, සනිද්දෙසො; සනිර්දේශයයි දන්නාලද්දේය; මුනිවරෙ,මුනිවරෙ යනු; පරො මතො, අන්‍ය අනිර්දේශයයි දන්නාලද්දේය; (මෙහි සද්ධිධ යනු "**සරාසරලොපං**" යන්නෙන් පූර්වස්වර ලොපව, "**දීඝං**" යන්නෙන් පරස්වර දීර්ඝව සිද්ධවී, මේ සනිර්දේශ දීර්ඝ සන්ධියට උදාහරණය මුනිවරෙ යනු "**දීඝං**" යන්නෙන් දීර්ඝව සිද්ධවී මේ අනිර්දේශ දීර්ඝ සන්ධියට උදාහරණය.)

19 යථයිව, යථයිවයනු; සනිද්දෙසො, සනිර්දේශ නම්වේ; (මෙහි

“ ඒවාදිස්සරි පුබ්බෝච රස්සෝ ” යන්නෙන් රිකාරාදේශ හා පූර්ව ස්වර හ්‍රස්වව සිද්ධි, මේසනිර්දේශ හ්‍රස්වසන්ධියට උදාහරණය: හොවාදි, හොවාදි යනු; අනිද්දෙසතො, අනිර්දේශ වශයෙන්වේ; මෙහි “රස්සං” යන්නෙන් ස්වරහ්‍රස්වව සිද්ධි, මේ අනිර්දේශ හ්‍රස්වසන්ධියට උදාහරණ යි:) දීඝරස්ස පභෙද, දීර්ඝහ්‍රස්ව සන්ධි ප්‍රභෙදයො; ඤාතුකාමෙන, දන්නා කැමැත්තහු විසින්; එවං; මේ ප්‍රකාරයෙන්; ජානියා, දතයුත්තාහ;

මෙසේ සප්‍රයොග වශයෙන් සන්ධි සතළොස් ප්‍රකාරවේ. එතකුදු උව සූත්‍රවශයෙන්ද සතළොස් කොටසෙක් වෙත්; හේ කවරේද?

ස්වරලොප සූත්‍රය ව්‍යඤ්ජනලොප සූත්‍රය නිග්ගහිත ලොප සූත්‍රය ස්වරාදෙශ සූත්‍රය ව්‍යඤ්ජනාදෙශ සූත්‍රය නිග්ගහිතාදෙශ සූත්‍රය ස්වරාගම සූත්‍රය ව්‍යඤ්ජනාගම සූත්‍රය නිග්ගහිතාගමසූත්‍රය ස්වරවිකාර සූත්‍රය ව්‍යඤ්ජන විකාරසූත්‍රය ස්වරප්‍රකෘතිසූත්‍රය ව්‍යඤ්ජනප්‍රකෘති සූත්‍රය සනිර්දේශ දීඝ සූත්‍රය අනිර්දේශ දීඝසූත්‍රය සනිර්දේශ හ්‍රස්ව සූත්‍රය අනිර්දේශ හ්‍රස්ව සූත්‍රයයි කියා සතළොස් කොටසෙක් වෙත්.

ඔවුන් අතුරෙන් ස්වරලොප සූත්‍රනම් “ සරාසරෙලොපං ” “ වාපරෝ අසරූපා ” යන මොහුයි; ව්‍යඤ්ජනලොප සූත්‍රනම “වා පරෝ අසරූපා” යන්නෙහි එකවචනග්‍රහණයද * “ ඛං කෑ තොව විසඤ්ඤොගො” යන සූත්‍රය හා මෙහි චග්‍රහණයද, යන මොහුය; නිග්ගහීත ලොප සූත්‍රනම් “ ක්වචිලොපං ” යන්න හා “ ව්‍යඤ්ජනෙ ච ” යන මොහුය; ස්වරාදෙශ සූත්‍රනම “ යමෙදන්තස්සාදෙසො ” “ වමොදුදන්තානං ” “ ඉවණ්ණො යන්නවා ” යනමොහුය; ව්‍යඤ්ජනාදෙශ සූත්‍රනම් “ සබ්බොචන්ති ” “ දොධස්සච ” යන මොහුය; නිග්ගහිතාදෙශසූත්‍රනම් “අංව්‍යඤ්ජනෙ නිග්ගහීතං” “වග්ගන්තං වාවග්ගෙ” “එහෙඤ්ඤං” “සයෙච” “මදාසරෙ” යනමොහුය; ස්වරාගමසූත්‍රයනම් “ලොපඤ්චතත්‍රාකාරො” යන මේසූත්‍රයය, (මෙහි චග්‍රහණයෙන් සතළොස් ස්වරයක් ආගම වෙත් යි, රූපසිද්ධියෙහි සහ චූළනිරුක්තියෙහිත් කියති.) ව්‍යඤ්ජනාගම සූත්‍රනම. “ යවමදනතරලා චාගමා ”යනමේ සූත්‍රයය;මෙයින්ව්‍යඤ්ජනයෝ අටදෙනෙක් ආගමවෙත්;මෙහි චග්‍රහණයෙන් සූත්සිව්‍යඤ්ජනයෙක්ආගම්වෙති;නිග්ගහීතාගමසූත්‍රයනම් ‘නිග්ගහීතඤ්ච”යනමේ සූත්‍රයවේ;ස්වරවිකාර සූත්‍රයනම් “ක්වචාසවණ්ණං ලුත්තෙ”යන සූත්‍රයවේ.ව්‍යඤ්ජනවිකාර සූත්‍ර

* “සරා සරෙ ලොපං” යන්නෙහි ‘ලොපං’ යන එකවචනය හැයි අභිනව චූළනිරුක්ති ශබ්දසාරාර්ථජාලිනී දෙක්හි කියනලදී.

**20 සරෙහෙව සරා පුබ්බා ලුත්තාවාචි පරාරස්සා,¶**
**බ්‍යඤ්ජනාවා ගමාවාචි දීඝරස්සාදිසම්භවා.**

යනාදි “ **සද්දධම්ම** ” යන සූත්‍රයවේ; ස්වරප්‍රකෘති සූත්‍රයනම්, “ සරෙ ක්වචි ” යන සූත්‍රය වේ; ව්‍යඤ්ජන ප්‍රකෘති සූත්‍රය නම් “ **සරාපකති ව්‍යඤ්ජනෙ** ” යන සූත්‍රයවේ; සනිර්දේශ දීර්ඝසූත්‍රනම් “ දීඝං ” “පුබ්බො ච” යන මේ සූත්‍රවේ; අනිර්දේශ දීර්ඝ සූත්‍රයනම්. “ දීඝං” යන සූත්‍රය වේ; සනිර්දේශ හ්‍රස්වසූත්‍රනම් “ **එවාදිස්සරි පුබ්බො ච රස්සො** ” “ **පාසස වණ්ණා රස්සා** ” යන මොහු වෙත්; අනිර්දේශ හ්‍රස්ව සූත්‍රයනම් “ රස්සං ” යන මේ සූත්‍රයවේ; මෙසේ සතළොස් සූත්‍රකෙනෙක් වෙති සි දත යුතුයි; මෙසේ සප්‍රයොග භෙද දක්වා දූන් යථොක්ත සත් වැදෑරුම් සන්ධීන් කෙරෙහි ලොපාගම දීර්ඝ හ්‍රස්වයන්ගේ නය දක්වන්ට “ **සරෙහෙව සරා පුබ්බා** ” යනාදිය කීහ.

20 සරෙහෙව, අටවැදෑරුම් ස්වරයන් කෙරෙන්ම; නොහොත් අටවැදෑරුම් ස්වරයන් පරකල්හිම; ලුත්තා, ලොප්කරණ ලද්දාවූ; පුබ්බා සරා, පූර්වස්වරයෝ; වාචි, සුසැටෙක් වෙති; පරා, පරස්වරයෝ; රස්සා, දෙපනසෙක්වෙති; ආගමා, ආගමවන්නාවූ; බ්‍යඤ්ජනාව, බ්‍යඤ්ජනයෝද; වාචි, සුසැටෙක් වන්නාහුය; දීඝරස්සාදි සම්භවා, දීර්ඝහ්‍රස්වාදීහු සම්ලාභ වශයෙන් වෙති; ලැබෙන පරිච්ඡෙදන් ගණන් ඇත්තාහයි සේයි, මෙහි ආදි ශබ්දයෙන් ආදෙශවිකාර ප්‍රකෘතිසන්ධීන් ගැණෙන්

මෙහි භාවයනම්—පූර්වස්වර ලොප්විය යුත සන්ධීහු පැමිණිකල්හි අකාරයා පරව සිටියතම, එහි ලැබෙන පරිච්ඡෙදන් අකාරයවූ පූර්වස්වරය ලොප්විය යුතුයි,

එසේම ආකාරය පූර්වස්වරයනම් ඔහු ලොප්විය යුතයි, ඉකාරය පූර්වස්වරයනම් එතැන්හි ඔහු ලොප්විය යුතුයි, ඒ ඒ තන්හි ඊකාර උකාර ඌකාර එකාර ඔකාර පූර්වස්වරනම් ඒ ඒ තන්හි ඒ ඒ ස්වරයෝ ලොප් වියයුත්තාහුයි; මෙසේ ස්වරයන් අටදෙනා අතුරෙන් අකාරය පරව සිටි කල්හි ඒ ඒ තැන අකාරය ආකාරය ඉකාරය ඊකාරය උකාරය ඌකාරය එකාරය ඔකාරය යන මෙ අට දෙනම ලැබුන ලැබුන පරිච්ඡෙදන් ලොප්වියයුතු බැවින් අකාරයා පරව සිටිකල්හි පූර්වස්වරවූ අකාරාදී අටදෙනම “ **සරාසරෙලොපං** ” යනසූත්‍රෙයන් ලොප්විය යුතුබව පෙනේ;

මේ නයින්ම ආකාරයා පරකල්හි පූර්වස්වරවූ අකාරාදීවූ අටදෙනම ලොප්විය යුත්තාහු වෙති; ඉකාරයා පරකල්හිද පූර්වස්වරවූ අකා

¶ පුබ්බෙ ජාතා=පුබ්බා; පරෙජාතා=පරා; වි: වී;

රාදි අටදෙනම් ලොප්විය යුත්තාහුවෙති;ඊකාර උකාර ඌකාර එකාර ඔකාරයන් පරකල්හිද අටඅටදෙන ලොප්විය යුතුහෙයින් එකී එකී ස්වරයක්හුපරකල්හි ස්වරඅටෙන් ලැබුනුලැබුනු පූර්වස්වරයක්ලොප්විය යුතුබවට අෂ්ටස්වරම අයිති බැවින් එකී එකී ස්වරයක් පරකල්හි අට අට දෙනෙක් ලොප්වනහෙයින් ලොප්විය යුතු පූර්වස්වරයෝ සූසැටෙක් වෙති; අකාරාදී ඌකාරයා කෙළවරකොටඇති ස්වරයන් සදෙනා අතුරෙන් අකාර පූර්වවූ කල්හි පරස්වරව සිටි අකාර ආකාර ඉකාර ඊකාර උකාර ඌකාර යන මේ සදෙනා **"වාපරො අසරූපා"** යනසුතුරෙන් ලොප් වෙති.

මෙසේ ස්වරයන් සදෙනා අතුරෙන් එකී එකී ස්වරයක්හු පූර්වව සිටිකල්හි පරස්වරවූ අකාරාදීවූ සදෙනා ලොප්විය යුත්තාහු බැවින්. එකී එකී ස්වරයට සදෙන සදෙන ගුණිත කොට සතිසෙක් වෙති. එකාර ඔකාර දෙදෙනාහා ස්වකීය ස්වකීය ශ්‍රැතියෙග් අභාවයෙන් ඔවුන් පූර්වව සිටිකල්හි අට අට දෙන ලොප්වෙති; මෙසේ ඒ ඒ දෙදෙනා කෙරෙන් නොහොත් ඒ ඒ දෙදෙනා කෙරෙන් පරවූ ස්වරයෝ සොළසෙක් ලොප්වෙති, පළමුකී සතිසහා සමග මේ සොළස එකතුවූකල්හි දෙපනසෙක් වෙති, එහෙයින් පරස්වරයෝ දෙපනසෙක් ලොප්වන්නාහුය, * එසේම **"යවමදනතරලා චාගමා"** යන සූත්‍රයෙන් ආගම වන්නාවූ ව්‍යජනයෝ අටදෙන එකී එකී ස්වරයක්හු පරකල්හි අට අට බැගින් ස්වර අටදෙනා පරකල්හි සූසැටෙක් ව්‍යජනයෝ ආගමවෙති, දීර්ඝහ්‍රස්ව ආදිය සම්භවූ පරිදෙදන් සංඛ්‍යාවය යන මෙහි දීර්ඝස්වනාහි ස්වර දීර්ඝය ව්‍යජන දීර්ඝයයි කියා ද්විප්‍රකාර වෙයි. ස්වරදීර්ඝයද පූර්වස්වර දීර්ඝය පරස්වරදීර්ඝයයි කියා ද්විප්‍රකාරය.

---

* මෙහි මෙසේ කීසේ නමුදු අන්‍යග්‍රන්ථාන්තී පරස්වර ලොප සඞ්ඛ දෙපනස දක්වන ලද්දේ මෙසේයි—

අකාරයා කෙරෙන්—ආ ඉ ඊ උ ඌ එ ඔ, යනසතද
ආකාරයා කෙරෙන්— ඉ ඊ උ ඌ එ ඔ, යනසයද
ඉකාරයා කෙරෙන්—අ ආ ඊ උ ඌ එ ඔ, යනසතද
ඊකාරයා කෙරෙන්—අ ආ — උ ඌ එ ඔ, යනසයද
උකාරයා කෙරෙන්—අ ආ — ඉ ඊ එ ඔ, යනසයද
ඌකාරයාකෙරෙන්—අ ආ — ඉ ඊ එ ඔ, යනසයද
එකාරයා කෙරෙන්—අ ආ ඉ ඊ උ ඌ ඔ, යනසතද
ඔකාරයා කෙරෙන්—අ ආ ඉ ඊ උ ඌ එ, යනසතද, ලොප්වෙත් යයි කියාති—

**21 කාලවණ්ණ බ්‍යවධානෙ සන්ධිනාම නසම්භවෙ.**
**ගාථා සු දුතියංතනත තනීසාදිව කාලිකා.**

---

අකාර ඉකාර උකාර යන ත්‍රිවිධ පූර්වස්වරයන් කෙරෙන් පරස්වරවූ අකාරාදි සඳෙන **"වාපරෙ අසරූපා"** යන සූත්‍රයෙන් ලොප්කල කල්හි, යථොක්ත පූර්වස්වරයන් තුන්දෙනාහට දීර්ඝ සම්භවන හෙයින්, ඒ ත්‍රිවිධ හ්‍රස්වස්වරයන් අතුරෙන් එකී එකී ස්වරයක් පරකල්හි අකාරාදි සඳෙන ලැබුනු අඳුමින් ලොප්වුනු කල්හි අකාරාදී සඳෙනාගේ ලොපය හේතුකොටගෙණ පූර්වස්ථිත ත්‍රිවිධ හ්‍රස්ව ස්වරයන්ට ස්වර ස්වර දීර්ඝය ලැබීමෙන් දීර්ඝ අටලොසෙක් වෙති. දෙතිස් ව්‍යඤ්ජනයන් පරකල්හි පූර්වවූ ත්‍රිවිධ හ්‍රස්වස්වරයන්ට දීර්ඝය සම්භවන හෙයින්, එකී එකී හ්‍රස්ව ස්වරයකට දෙතිස් ස්වර දීර්ඝය ලැබීමෙන් දීර්ඝ සයානුවක් වෙති. පූර්වදීර්ඝ අපරදීර්ඝ ව්‍යඤ්ජන දීර්ඝයන් එකතු කල කල්හි එකසිය අටතිස් දීර්ඝයෝයයි දතයුත්තාහ. † හ්‍රස්වය සයානුවක් වෙති. ¶ ආදෙශය හා විකාරය ගණන් වශයෙන් නොගත යුතුවේ. සමසටු පරිච්ඡෙදනී, ප්‍රකෘතිය වනාහි ස්වර ප්‍රකෘති ව්‍යඤ්ජන ප්‍රකෘති වශයෙන් ද්විප්‍රකාරය; එහින් ස්වර ප්‍රකෘතියනම්- අටවැදෑරුම් ස්වරයන් කෙරෙහි අටවැදෑරුම් ස්වරයන්ට ප්‍රකෘතිසම්භවන හෙයින් ගුණනකොට ස්වරයන්ට සූසැටප්‍රකෘතියෙක් වෙති. ව්‍යඤ්ජන ප්‍රකෘතිය දෙසිය පනස්සයකැයි දතයුත්තාහ. ස්වරප්‍රකෘතිහා ව්‍යඤ්ජන ප්‍රකෘති හුද එකතුකලකල්හි තුන්සිය විස්සෙක් ප්‍රකෘති සන්ධි වන්නාහුය" යනු භාවයි.

මෙසේ උදෙස් නිදෙස් පිළිනිදෙස් වශයෙන් සංහිතා ලකුණුද ක්වා අසංහිතා ලකුණු දක්වන්නේ **"කාලවණ්ණබ්‍යවධානෙ"** යනාදිය කීහ.

21 කාලවණ්ණබ්‍යවධානෙ, කාලවර්ණබ්‍යවධානයෙහි; (කාලබ්‍යවධාන වර්ණබ්‍යවධානයෙහි යයිසේයි) සන්ධිනාම නසම්භවෙ, සංහිතාකාර්‍යයනම් සම්භනොවේ: ගාථාසු, ඡන්දනුරූපව කියනලද

---

* බ්‍යවධානෙ සිද කියති.

† "අපරෙ පන අංකාරස්ස ව්‍යඤ්ජනන්තා තෙත්තිංස බ්‍යඤ්ජනෙසු දීඝා සම්භවන්තා එකවත්තාලීසාධිකා සතාදීඝානි වදන්ති" යනුද ටීකා වචනයි—

¶ ඇතැම් ආචාර්‍යයන් කෙනෙක් හ්‍රස්වසන්ධිය එක්සියඅටතිස් වැදෑරුම්යයිද කියති.

22 "සබ්බසඞ්ඛාරා අනිච්චාති යදා පඤ්ඤාය පස්සති,
අථනිබ්බින්දති දුක්ඛෙ එසමග්ගො විසුද්ධියා."

23 "සකිං එව මහාරාජ සබ්බිකුබ්බෙථ සත්‍ථවං,"
ඉච්චාදිසුච වණ්ණාසු බ්‍යවධානං විජානියං,

ගාථාවන්හි; දුතියන්තෙත, දෙවෙනි පාදයාගේ අන්ත අක්ෂරයහා; තතියාදිච, තුන්වෙනිපාදයාගේ ආදි අක්ෂරයද; කාලිකා, කාලබ්‍ය වධානනම;

"කරොති එත්‍ථා'ති=කාලං; නිරුත්තිනයෙන රකාරස්ස ලකාරං කත්වා එවං දට්ඨබ්බන්ති; වණ්ණියති අත්‍ථො එතෙනා'ති=වණ්ණං; නිග්ගහිතං, කාලඤ්ච වණ්ණඤ්ච= කාලවණ්ණං; සමාහාරද්වන්දයං, මරියාද වසෙන අවතිට්ඨති එත්‍ථා'ති=බ්‍යවධානං; කාලවණ්ණස්සබ්‍ය වධානං යස්සා'ති=කාලවණ්ණබ්‍යවධානං; කාලබ්‍යවධානං කාලන්ත රං නාම" යනු ටීකායි—*

මෙසේ කාලවණ්ණ බ්‍යවධාන ලකුණුදක්වා ඔවුන් අතුරෙන් කා ලව්‍යවධානයට උදාහරණ දක්වන්නේ "සබ්බසංඛාරා අනිච්චා ති" යනාදිය කීහ.

22 මේ ගාථාවෙහි දෙවෙනිපාදයාගේ අන්තයවනනාවූ පස්ස ති යන පදයහා තුන්වෙනිපාදයාගේ මුලවන්නාවූ අථ යන පදය දෙවෙනි පාදය තුන්වෙනි පාදයයි පාදවශයෙන් කාලන්තරිත බැ වින් "පස්සථ්‍යත" කියාහෝ "පස්සතථ" කියාහෝ "පස්සත්‍යාථ"කිය. හෝ "පස්සතිථ" කියාහෝ සංහිතාකායයීය සමහනොවේ, හෙවත් නොසෑහේ.

මෙසේ කාලබ්‍යවධානයට උදාහරණ දක්වා වණ්ණබ්‍යවධාන යට උදාහරණ දක්වන්ට "සකිං එව මහාරාජ" යනාදිය කීහ.

23 සකිං එව මහාරාජ සබ්බිකුබ්බෙථ සත්‍ථවං ඉති, සකිං එව මහාරාජ සබ්බිකුබ්බෙථ සත්‍ථවං යන; ආදිසු, මේ ආදිතන්හි; ව ණ්ණෙන, නිග්ගහිත සංඛ්‍යාත වණ්ණයෙන්; බ්‍යවධානං, බ්‍යවධාන ය; විජානියං, දතයුතුයි; (මේ ගාථාවෙහි සකිං එව යන මෙහි වණ්ණ සංඛ්‍යාත නිග්ගහිතය අන්තරිත බැවින් සංහිතාකායයීය නොවේ.

* වි අවතිට්ඨති අන්තිකං කරොතී'ති=බ්‍යවධානං, වි අවධානං අන්තිකං කරණංවා=බ්‍යවධානං; භාවසාධෙ යුපච්චයො, එත්‍ථ වි අ වාති උපසග්ගා, ධාතු අත්තනො අත්‍ථං ජහිතත්තා උපසග්ගඩකු සොත්‍ථාමාති—යනුද ටීකායි—

24 පුඤ්ඤෙනානෙන භවෙය්‍යං සුබුම්මවජ්ජිතො අහං,
වාචා සිලිට්ඨතාචාපි පෙසුඤ්ඤ විගතොපිච.

සප්පයොගං සන්ධිභෙදං සමත්තං–

000

25 අඤ්ඤං නමන්ති නාමෙනාපි ඉතිනාමානි යානිච,
එවං නමන භාවෙන නාමං එකවිධං මතං.

---

මෙහි තකාරය මකාරෙන් ඉකාරය පරවෙයි ඉකාරයාකෙරෙන් නිග්‍රහීතය පරවසිටියේවෙයි නිග්‍රහීතයාකෙරෙන් එකාරය පරවසිටියේවෙයි එහෙයින් ඉකාරයට හා එකාරයටත් මධ්‍යයෙහි නිග්‍රහීතය අනන්තරිත බැවින් "ඉවණ්ණො යනනවා" යන සූත්‍රයෙන් ඉකාරයාහට යකාරකොට 'සක්‍යව' කියා හෝ "සරාසරෙලොපං" යන්නෙන් පූර්වස්වර ලොප්කොට 'සකෙව' කියාහෝ "වාපරො අස රූපා" යන්නෙන් පරස්වරලොප්කොට 'සකිංව' කියාහෝ "පුබ්බො ච" යන්නෙන් දීර්ඝකොට 'සකීව' කියා හෝ "එවාදිස්සරි පුබ්බො ච රස්සො" යන්නෙන් එකාරයාහට රිකාරාදෙශකොට 'සකිං රිව' කියා හෝ සංහිතාකාර්‍ය්‍ය නොවනහෙයින් මේ වර්ණව්‍යවධානය නැමැයි යනු භාවයි)

මෙසේ සහළොස් සන්ධිප්‍රභෙද කාලවර්ණ ව්‍යවධානවශයෙන් ද්විප්‍රකාරයකින් අසන්ධිභෙදය දක්වා සන්ධිග්‍රන්ථයට අනුරූපවූ ප්‍රාර්ථනාව දක්වන්නේ ආචාර්‍ය්‍යතෙම "පුඤ්ඤෙනානෙන" යනාදිය කීහ.

24 අනෙන පුඤ්ඤෙන, මේ සන්ධිග්‍රන්ථකාරක කුසලචේතනා වංශහතුකොටගෙණ; අහං, මම; සුබුම්මවජ්ජිතොභවෙය්‍යං, භවයක් පාසා සුබුම්විජ්ජිතවෙම්වා; වාචාසිලිට්ඨතාචාපි, වාක් සිලිට්ඨතාවයෙන්ද සමන්විතවෙම්වා; පෙසුඤ්ඤවිගතොපිච, පෛශුන්‍ය වචනර හිතදවෙම්වා; යී, (කියා ප්‍රාර්ථනාකළහ)

**උදාහරණසහිත සන්ධිභෙදය සම්පූර්ණවූයේයි,**

මෙසේ ඉහතකී ගාථාවලින් සප්‍රයොගසන්ධිභෙදය දක්වා දැන් නාමභෙදය දක්වන්නේ ආචාර්‍ය්‍යතෙම "අඤ්ඤංනමන්ති" යනාදිය කීහ.

25 යානි, (ගො අස්සො ඉත්ථි පුරිසො යනාදී) යම් පදකෙනෙ

26 අත්ථානුගතරූළ්හීනං වසෙන දුවිධං මතං,
පංසුකූලික තිස්සාදි භාසිතං තං යථාක්කමං.

27 නාම නාමං සබ්බනාමං සමාසං තද්ධිතං තථා,
කිතනාමන්ති විඤ්ඤෙය්‍යං නාමං පඤ්චවිධං මතං

---

ක්; අත්ථං නමන්ති, අර්ථය නමද්ද; වා, නොහොත්; නාමෙන්ති, වාච්‍යභාවයෙන් නමවද්ද; ඉති, එහෙයින්; (ගො අස්සො ඉත්ථි පුරිසො යනාදී ඒ පදයෝ) නාමානි, නාමයෝනම්වෙත්; එවං, මෙපරිද්දෙන්; නමනභාවෙන, නමනභාවයෙන්; නාමං, නාමය; එකවිධංමතං, එක්ප්‍රකාරයයි දන්නාලදී—

මෙසේ නාමශබ්දයට වදහන ලක්ෂණයා පුද්ගලවශයෙන් ද්විප්‍රකාරයකින් විග්‍රහදක්වා විශෙෂලක්ෂණවශයෙන් දක්වන්නේ ආචාර්යතෙම "අත්ථානුගතරූළ්හීනං" යනාදිය කීහ.

26 එසේම, මේ එකවිධනාමයෙහිද; අත්ථරූළ්හීනං වසෙන, අත්ථරූඪීන්ගේ වශයෙන්; (අත්ථං අනුගන්ත්වා පවත්තතී'ති=අත්ථානුගං; රූළ්හෙති සමාරොපෙතී'ති= රූළ්හී යනු විග්‍රහයි;) දුවිධංමතං, නාමය ද්විප්‍රකාරයයි දන්නාලදී; පංසුකූලිකතිස්සාදි, පංසුකූලිකනාම තිස්සනාමාදී උදාහරණයෙහි; යථාක්කමං, පිළිවෙළින්; හෙවත් අත්ථරූඪීනාමානුරූපව; භාසිතං, කියනලද්දේය. තං යනු පකෘණනිර්දේශයයි; (මෙහිදක්වනලද අත්ථරූඪී යන ද්විප්‍රකාරනාමයන්ට උදාහරණනම්—"පංසුකූලිකො" යනු අත්ථනාමයවේ; කුමක්හෙයින්ද? අර්ථානුගතවපැමිණි නාමයහෙයිනි, පංසුකූලං ධාරෙතී'ති=පංසුකූලිකො, මේ ආදි අර්ථානුගතනාමයෝ අත්ථනම්, 'තිස්සො දුස්සො, යනාදිය රූඪීනම්, කුමක්හෙයින්ද? කිසි විග්‍රහඅපීක්ෂාව අනුවනොගොස් උපචාරවශයෙන් නැමෙන හෙයිනී

මෙසේ අත්ථරූඪී වශයෙන් ද්විප්‍රකාර නාමයදක්වා පදවශයෙන් පඤ්චප්‍රකාර නාමය දක්වන්නේ ආචාර්යතෙම "නාමනාමං සබ්බනාමං" යනාදිය කීය.

27 නාමනාමං, නාමනාමය; නොහොත් ශුද්ධනාමයද; සබ්බනාමං; සාමාන්‍යනාමයයි කියනලද සර්වනාමයද; සමාසං, සමාසනාමය; හෙවත් අන්‍යොන්‍යපදයන්ගේ සංක්ෂෙපනාමයද; තද්ධිතං, තද්ධිතනාමය; හෙවත් පදහාප්‍රත්‍යයන්ගේ සංක්ෂෙපනාමයද; තථා, එසේම; කිතනාමං, කිතනාමය; හෙවත් ධාතුප්‍රත්‍යය සං

**28 සාමුඛිකඤ්ච පච්චෙකං විකප්පඤ්ච සංයොගිකං,**
**සම්බන්ධිකං පටිපක්ඛං නාමනාමං ඡධාමතං.**

**29 සාමුඛිකං සටපටො පච්චෙකං කාළවෙළුපසා,**
**විකප්පොච දිසාකාලො කණ්හසප්පො සංයොගිකො.**

**30 සම්බන්ධිකො ගොතමාදි පටිපක්ඛො කිසාදයො,**
**සප්පයොගානි නාමානි පණ්ඩිතෙහි විඤ්ඤෙය්‍යා.**

---

ලොපනාමයද්‍යයි; ඉති, මෙසේ; හෙවත් මේ භෙදයෙන්; විඤ්ඤූහි, නාමලක්ෂණදන්නා පණ්ඩිතයන් විසින්; නාමං, නාමය; පඤ්චවිධං, පඤ්චප්‍රකාරයයි; මතං, දන්නාලද්දේය.

මොවුන් අතුරෙන් නාමනාමයාගේ විශෙෂලක්ෂණ දක්වන්නාවූ ආචාර්‍ය්‍යතෙම "**සාමුඛිකඤ්ච පච්චෙකං**" යනාදිය කීහ.

28 සාමුඛිකඤ්ච, සාමුඛිකනාමයද; පච්චෙකං, පච්චෙකනාමයද; විකප්පඤ්ච, විකප්පනාමයද; සංයොගිකං, සංයොගිකනාමයද; සම්බන්ධිකං, සම්බන්ධිකනාමයද; පටිපක්ඛං, පටිපක්ඛනාමයද්‍යයි; නාමනාමං, නාමනාමය; නොහොත් ශුද්ධනාමය, ඡධාමතං, ෂට්පරිච්ඡෙදකින් දන්නාලදි. ("සමූහො එතස්ස අත්ථිතස්මිංවා විජ්ජතී'ති=සාමුඛිකං; පටිච්චසුං එකො අසම්මිස්සො සයමෙව වත්තතී'ති=පච්චෙකං; පරමත්ථතො අවිජ්ජමානත්ථං විකප්පෙති විතක්කෙතී'ති=විකප්පං; සංයොගො අස්ස අත්ථි තස්මිංවා විජ්ජතී'ති=සංයොගිකං; සම්බන්ධමස්ස අත්ථි තස්මිංවා විජ්ජතී'ති=සම්බන්ධිකං; පටිවිරුද්ධභාවෙන පක්ඛති පවත්තතී'ති=පටිපක්ඛං; යනු ටීකායි)

මෙසේ සපරිච්ඡෙදකින් නාමනාමය දක්වා දූන් ඔවුන්ටම උදාහරණදක්වන්නාවූ ආචාර්‍ය්‍යතෙම "**සාමුඛිකං සටපටො**" යනාදිය කීහ.

29 සටපටො, සටපටො යනාදිය; සාමුඛිකං, සාමුඛිකනාමය නම; කළෙවෙළුයො, කළෙවෙළුයො යනාදිය; පච්චෙකං, පච්චෙකනාමයනම; දිසාකාලො, දිසාකාලොයනාදිය; විකප්පොච, විකප්පනාමයදවේ; කණ්හසප්පො, කණ්හසප්පොයනාදිය; සංයොගිකො, සංයොගිකනාමයනම.

30 ගොතමාදි, ගොතමො යනාදිය; සම්බන්ධිකො, සම්බන්ධිකනාමයනම; කිසාදයො, කිසොථූලො යනාදිය; පටිපක්ඛො, පටිපක්ඛනාමයනම; සප්පයොගානි නාමානි, උදාහරණසහිත ෂට්ප්‍රකාර නාමයන්; පණ්ඩිතෙහි, පණ්ඩිතයන්විසින්; විජානියා, දතයුත්තාහුය.

31 පයොගවචනානං වචනං ගුණපුච්ඡා පමාණිකං,
සබ්බසබ්බංදිසාවත්ථා සංඛ්‍යා කාලනාමදසධා.

32 පයොගවචනානං යං තං හි තුමහාමහවචනං තථා,
නීල පීතං ගුණානාම පුච්ඡාකතර කතමං.

33 අප්පංථොකං පමාණනාමු සබ්බසබ්බ සරමමනං,
දිසාපුබ්බා අපරාච දීඝරස්සාදි අවත්ථා.

---

සාමාන්‍යලක්ෂණ වශයෙන් එකාවිධවූ සර්වනාමයදක්වා විශෙෂ ලක්ෂණවශයෙන් දසවිධ සර්වනාමය දක්වන්නාවූ ආචාය්‍ය්‍යීතෙම "පයොගවචනානං වචනං" යනාදිය කීහ.

31 පයොගවචනානං, ප්‍රයොගවචනන සර්වනාමයද; වචනං; වචන සර්වනාමයද; ගුණ, ගුණසර්වනාමයද; පුච්ඡා, පුච්ඡාසර්වනාමයද; පමාණිකං, ප්‍රමාණිකසර්වනාමයද; සබ්බසබ්බං, සබ්බ සබ්බ සර්වනාමයද; දිසා, දිශාසර්වනාමයද; අවත්ථා, අවස්ථාසර්වනාමයද; සංඛ්‍ය, සංඛ්‍යා සර්වනාමයද; කාලනාම, කාලසර්වනාමයදැයි; දසධා, සර්වනාමය දස වැදෑරුම්වේ; *

මෙසේ විශෙෂවශයෙන් සර්වනාමයාගේ දශප්‍රභෙදය දක්වා ඊට උදාහරණදක්වන්නාවූ ආචාය්‍ය්‍යීතෙමේ "පයොගවචනානං යංතංහි" යනාදිය කීහ.

32 යංතං, යංතංයනාදිය; පයොගවචනානං, ප්‍රයොගවචනන සර්වනාමයනම; (හි යනු විස්තරාර්ථයෙහි නිපාතයෙක) තුමහාමහ, තුම්හ අම්හ යනාදිය; වචනං, වචන සර්වනාමයනම; තථා, එසින් අන්‍යවූ; නීලපීතං, නීලපීතංයනාදිය; ගුණා, ගුණසර්වනාමයනම; කතරකතමං, කතරකතමං යනාදිය; පුච්ඡා, පුච්ඡාසර්වනාමයනම.

33 අප්පං ථොකං, අප්පං ථොකංයනාදිය; පමාණං,ප්‍රමාණ සර්

---

* සර්වනාමය අනව්‍යය සර්වනාමය අව්‍යය සර්වනාමයයි ද්විවිධවේ; අනව්‍යය සර්වනාමනම්-සබ්බ. සා. සා. යනාදී ශබ්දසමූහයයි; අව්‍යය සර්වනාමනම් සියලු අව්‍යය තද්ධිතයයි-මෙමකීහ ශබ්දසාරාර්ථ ජාලිනියෙහි.

"සබ්බනාමං විධාවුත්තං අනව්‍යයඤ්ච භෙදතො,
අබ්‍යය තද්ධිතං සබ්බං අබ්‍යයන්ති පවුච්චති.
අනබ්‍යයං සබ්බනාමං සබ්බායාසා දසොමතා,
සබ්බනාමාන විත්ථාරො සද්දසාරෙ පකාසිතො"-යි.

34 එකං මෙහිචතුසංඛ්‍යා කාලන්තු අතීතාදයො,
දසධාසබ්බනාමානි සප්පයොගා විජානියා.

35 ලීනං අපාකටං අඞ්ගං ලීනඞ්ගමය තීහිවා,
ලිඞ්ගං නාමන්ති විඤ්ඤෙය්‍යං නාමං ලිඞ්ගන්ති සාදිසං.

36 යාසාච ඉත්ථියාලිඞ්ගං යොසො පුල්ලිඞ්ගමෙවච,
සං නං නපුංසකාඛ්‍යාති තිවිධං ලිඞ්ගලක්ඛණං.

---

නාමයනම; (තු යනු නිපාතයි)ඉතරං, ඉතරං යනාදිය; සබ්බ සබ්බං, සබ්බසබ්බ සර්වනාමයනම; පුබ්බාඅපරාච, පුබ්බා අපරා යනුද; † දිසා දිශා සර්වනාමයනම, දිසරසසාදි, දිසරසසයනාදිය; අවත්‍ථා, අවස්ථා සර්වනාමයනම.

34 එකං මෙහිචතු, එකං මෙහිචතු යනාදිය; සංඛ්‍යා, සංඛ්‍යා සර්වනාමයනම; අතීතාදයො, අතීතාදිය; කාලං, කාලසර්වනාමයනම; (තු යනු පදපූරණයෙහි වේ) සප්පයොගාසබ්බනාමානි, සප්‍රයොගවූ සර්වනාමයන්; දසධා, දසපරිච්ඡෙදකින්; විජානියා. දතයුත්තාහුය.

මෙසේ ෂට්පරිච්ඡෙදකින් නාමයදක්වා දූන් නාමලිඞ්ග ප්‍රාතිපදික ශබ්දයන්ගේ සදෘශභාවය දක්වන්නේ ආචාර්‍ය්‍යතෙමේ “**ලීනං අපාකටං අඞ්ගං**” යනාදිය කීහ. ¶

35 ලීනං අපාකටං අඞ්ගං, ලීනවූ අප්‍රකට අවයවය; (ලිඞ්ගනම) වා, නොහොත්; ලීනං ගමයතීති, ලීනභාවයට පමුනුවාතුයි (ලිඞ්ග නම;) ලිඞ්ගං, ලිඞ්ගය; නාමන්ති, නාමයයි; විඤ්ඤෙය්‍යං, දතයුත්තේය; ති, යම්හෙයකින්; ලිඞ්ගං නාමං සාදිසං, ලිඞ්ගය නාමය සමානවේද එහෙයිනි; (නාමය ලිඞ්ගයයි දතයුතුයයි සේයි.)

විග්‍රහ අර්ථවශයෙන් එකවිධවූ ලිඞ්ගයදක්වා විශෙෂ ලක්ෂණ වශයෙන් ලිගයාගේ ත්‍රිවිධාකාරය දක්වන්නේ ආචාර්‍ය්‍යතෙම“**යාසාච**” යනාදිය කීහ.

36 යාසාච, යාසායනුද; ඉත්ථියාලිඞ්ගං, ඉස්ත්‍රියගේ ලිඞ්ගය; හෙවත් ස්ත්‍රීවාචකය නම; යොසො, යොසොයනු; පුල්ලිඞ්ගං එවච,

---

† ‘චසද්දො සම්පිණ්ඩනත්‍ථො, චසද්දෙන දක්ඛිණ උත්තරාදයො සම්පිණ්ඩෙති’ යි ටීකා.

¶ ‘ආචරියා පන සමාස තද්ධිත කිතභෙදානි තබ්භෙදදීපනියං වක්ඛමානත්තා ඉධනාමදීපනියං නවුත්තානීති දට්ඨබ්බානී’ යි ටීකා

37 ආවත්තිකඤ්ච ලිඞ්ගිකං නෙමිත්තිකාධිච්චසමුප්පන්නං,
වච්ඡෝ දණ්ඩීච තෙවිජ්ජෝ සිරිවඩ්ඪනකෝ මතෝ.

38 ක්‍රියාජාති ගුණං යාදිච්ඡකන්තිවා චතුබ්බිධං,
පාචකොච අසෙසාරාජා තෙවිජ්ජාච තිස්සාදයො.

---

පුරුෂවාචකනමවේ; හෙවත් පුල්ලිඞ්ගම නමි; යං තං, යං තං යනු; නපුංසකංවෙති, නපුංසකවාචකයදූයි; ලිඞ්ගලක්ඛණං, ලිඞ්ගලක්ෂණ ය; තිවිධං, ත්‍රිවිධවේ; (මෙහි ‘සාසා’ යන ශබ්දදෙක ස්ත්‍රීලිඞ්ගයට උදාහරණය; ‘යොසො’ යනු පුල්ලිඞ්ගයට උදාහරණය; ‘යංතං’ යනු නපුංසකලිඞ්ගයට උදාහරණයි;)

මෙසේ ත්‍රිවිධලිඞ්ගලක්‍ෂණ දැක්වා දූන් ත්‍රිවිධලිඞ්ගයන්අතුරෙන් එකී එකී ලිඞ්ගයකට ලභ්‍යමාන ප්‍රභෙද දක්වන්නෝ ආචාය්‍ය්‍යතෙම **“ආවත්තිකඤ්ච”** යනාදිය කීහ.

37 ආවත්තිකඤ්ච, ආවත්තිකලිඞ්ගයද; ලිඞ්ගිකං, ලිඞ්ගිකලිඞ්ගය ද; නෙමිත්තිකං, නෛමිත්තික ලිඞ්ගයද; අධිච්චසමුප්පන්නං, අධිච්චස මුප්පන්නලිඞ්ගයදූයි ලිඞ්ගයචතුර්විධ වේ; වච්ඡෝ, වච්ඡෝකියාද; දණ්ඩීච, දණ්ඩීකියාද; තෙවිජ්ජෝ, තෙවිජ්ජෝකියාද; සිරිවඩ්ඪනකො, සිරිවඩ්ඪනකො කියාද; මතො, උදාහරණ පිණිස දන්නාලද්දේය; (මෙහි‘වච්ඡෝ’ යනු ආවත්තිකලිඞ්ගයට උදාහරණය; අවත්ථාසමත්ථං උ පාදායපවත්තං=ආවත්තිකං; ‘වච්ඡෝ දම්මෝ බලිවද්දෝ’ යනාදියයි; ‘දණ්ඩී’ යනු ලිඞ්ගික ලිඞ්ගයට උදාහරණය; ලිඞ්ගං උපාදාය පවත්තං= ලිඞ්ගිකං; ‘දණ්ඩී සිඛී වීණා විසාණී’ යනාදියයි; ‘තෙවිජ්ජෝ’ යනු නෛමිත්තික ලිඞ්ගයට උදාහරණය; නිමිත්තං කාරණං උපාදායපව ත්තං=නෙමිත්තිකං; ‘තෙවිජ්ජෝ ජලාභිසෙකො’ යනාදියයි; ‘සිරිව ඩ්ඪනකො’ යනු අධිච්චසමුප්පන්නලිඞ්ගයට උදාහරණය; අධිච්ච අ ධිකං කත්වා සමුප්පන්නං ලිඞ්ගං=අධිච්චසමුප්පන්නං; ‘සිරිවඩ්ඪනකො යනාදියයි;)

38 වා, නොහොත්; ක්‍රියා, ක්‍රියානිමිත්තක ක්‍රියාලිඞ්ගය; ජාති, ජාතිනිමිත්තක ජාතිලිඞ්ගය; ගුණං, ගුණනිමිත්තක ගුණලිඞ්ගය; යා දිච්ඡකං, යාදිච්ඡකලිඞ්ගයයි; ඉති, මේ භෙදයෙන්; චතුබ්බිධං, චතු ර්විධවේ; පාචකොච, පාචකොයනුද; අසෙසා, අසෙසායනුද; රාජා, රාජායනුද; තෙවිජ්ජාච, තෙවිජ්ජායනුද; තිස්සාදයො, තිස්සාය නාදිය උදාහරණවෙත්; (මොවුන් අතුරෙන් ‘පාචකො’ යනු ක්‍රියා නිමිත්තක ක්‍රියාලිඞ්ගයට උදාහරණය; ගමණපචනාදිකං ක්‍රියංපටිච්ච

39 සාමඤ්ඤගුණ කිත්තිම ඔපපාතික තොථවා,
මහාසම්මතො තෙවිජ්ජො තෙමියො චන්දිමාදිකො.

40 තිලිඞ්ගෙස්වෙකමෙකස්ස චතුප්පභෙදභාවතො,
මාදසපභෙදංලිඞ්ගං පණ්ඩිතෙහි විජානියං.

41 තත්ථා ඉථ් උදා ඔති ජබ්බිධා ඉත්ථිසඤ්ඤනතො,
අආ ඉථ් උදා ඔති පුල්ලිඞ්ගො සතනධාමතො.

---

පවත්තං ලිඞ්ගං=ක්‍රියා; 'අසෙසා' යනුද 'රාජා' යනුද ජාතිනිමිත්ත ක ජාතිලිඞ්ගයට උදාහරණය; ජාතිං පටිච්චපවත්තං ලිඞ්ගං=ජාති, තෙවිජ්ජො' යනු ගුණලිඞ්ගයට උදාහරණය; ගුණං පටිච්චපවත්තං, ලිඞ්ගං=ගුණං; 'තිසෙසා' යනු යාදිච්ඡකලිඞ්ගයට උදාහරණය; යායා ඉච්ඡා අස්ථි තාතං අත්තනො රුචිං පටිච්චපවත්තං ලිඞ්ගං=යාදිච්ඡකං;)

39 අථවා, නොහොත්; සාමඤ්ඤ, සාමාන්‍ය ලිඞ්ගවශයෙන්ද; ගුණ, ගුණලිඞ්ගවශයෙන්ද; කිත්තිම, කිත්තිමලිඞ්ගවශයෙන්ද; ඔපපා තිකතො, ඔපපාතිකලිඞ්ගවශයෙන්ද; චතුර්විධවේ; මහාසම්මතො තෙ විජ්ජො තෙමියො චන්දිමාදිකො, මහාසම්මතො තෙවිජ්ජො තෙමි යො චන්දිමා යනාදියයි.

('මහාසම්මතො' යනු සාමාන්‍යලිඞ්ගයවේ; 'තෙවිජ්ජො' යනු ගුණලිඞ්ගයවේ; 'තෙමියො' යනු කිත්තිමලිඞ්ගයවේ; 'චන්දිමා' යනු ඔපපාතික ලිඞ්ගයවේ;)

මෙසේ ආවත්ථිකාදිවශයෙන් ලිඞ්ගභෙදය දක්වා දූන් යථොක්ත ප්‍රභෙද ඇති ත්‍රිවිධලිඞ්ගයන්කෙරෙහි ලභ්‍යමානභාවය දක්වන්නේ ආචාර්‍ය්‍යතෙම "තිලිඞ්ගෙස්වෙක මෙකස්ස" යනාදිය කීහ.

40 තිලිඞ්ගෙසු, ස්ත්‍රීපුංනපුංසක යන ලිඟත්‍රයඅතුරෙන්; එකමෙ කස්ස, එකක් එකක් හුගේ; නොහොත් එකී එකී ලිඟයකට; චතු ප්පභෙදභාවතො; (ආවත්ථික ලිඟිකනෙමිත්තික අධිච්ච සමුප්පන්න වශයෙන් එමලිඟය) සිව්සිව් ප්‍රභෙදබැවින්; වාදසපභෙදං ලිඟං, වා දසප්‍රභෙදඇති ලිඟය; පණ්ඩිතෙහි, පණ්ඩිතයන් විසින්; විජානියං, දතයුත්තේය.

මෙසේ ආවත්ථිකාදි චතුෂ්කවශයෙන් ලිඟභෙදදක්වා දූන් අ න්තයන්ගේ වශයෙන් එමලිඟය දක්වන්නේ ආචාර්‍ය්‍යතෙම "තත්ථා ඉථ් උදා ඔති" යනාදිය කීහ.

41 තත්ථ, ඒ ත්‍රිවිධලිඟයන් අතුරෙන්; ඉත්ථියන්තතො, ස්ත්‍රී

42 නපුංසකොපිතථෙව තින්මනෙතාපි තිලිඞ්ගිකො,
ආවජ්ජිකාදිභෙදෙන අනන්තභෙදො විජානියො.

43 ආකාරො ඉ ඊ උ ඌ ති පඤ්චධා ඉත්ථි යන්තතො,
අ ආ ඉ ඊ උ ඌ චෙති ඡබ්බිධො පුල්ලිඞ්ගො මතො.

44 අ ඉ උ ඉති තිනෙව නපුංසකො විජානියො,
ආවජ්ජිකාදි භෙදෙන ඡපඤ්ඤාසාති වුච්චරෙ.

---

ලිඞ්ගාන්තවශයෙන්; ආ ඉ ඊ උ ඌ ඔහි, ආකාරාන්ත ඉකාරාන්ත ඊකාරාන්ත උකාරාන්ත ඌකාරාන්ත ඔකාරාන්තයයි; ඡබ්බිධා, ෂට්ප්‍රකාරයකින්වේ; අ ආ ඉ ඊ උ ඌ ඔහි අකාරාන්ත ආකාරාන්ත ඉකාරාන්ත ඊකාරාන්ත උකාරාන්ත, ඌකාරාන්ත ඔකාරාන්තයයි; පුල්ලිඞ්ගො, පුල්ලිඞ්ගය තෙම; සත්තධාමතො, සත්පරිද්දෙකින් දන්නා ලද්දේය.

42 නපුංසකොපි, නපුංශක ලිඞ්ගයද; තථෙව, එපරිද්දෙන්ම සත්පරිද්දකින් දන්නාලද්දේය; තින්මනෙතාපි, නිග්ගහීතාන්තයද; තිලිඞ්ගිකො; තුන්ලිඟුඇත්තේය; හෙවත් නිග්ගහිතාන්තය තුන්ලිඟුවට සදෘශවන්නේය; ආවජ්ජිකාදි භෙදෙන, ආවජ්ජිකලිඞ්ගිකාදි භෙදයෙන්; අනන්තභෙදො, අනන්තභෙදයතෙම; විජානියො, දතයුත්තේය.

(නිග්ගහිතාන්තය හා සමග ස්ත්‍රීවාචකය සත්ප්‍රකාරවේ. පුරුෂවාචකය අෂ්ටප්‍රකාරවේ. නංපුෂක වාචකයද අෂ්ටප්‍රකාරවේ. මෙසේ ලිඞ්ගත්‍රයම තෙවිසි ප්‍රභෙදවේ. ආවජ්ජිකාදි චතුෂ්කය හා සමග ගුණිත වූ කල්හි දෙයානූ ප්‍රභෙදයෙක්වේ. මේ අනියම වශයෙනි නියමවශයෙන් ත්‍රිවිධ චතුෂ්කයෙහි දෙසියසැත්තෑසයක් ලිඞ්ගභෙදයෝ වෙති සි දතයුතු.)

මෙසේ තමන්ගේ ඊප්සාවශයෙන් රූපසිඞ්ධිනය දක්වා ශබ්දනීතිනය දක්වන්නේ ආචාර්‍ය්‍යතෙම "ආකාරො ඉ ඊ උ ඌ ති" යනාදිය කීහ.

43 ආකාරො ඉ ඊ උ ඌ ඉති, ආකාරාන්ත ඉකාරාන්ත ඊකාරාන්ත උකාරාන්ත ඌකාරාන්තයයි; ඉත්ථියන්තතො, ස්ත්‍රීඅන්ත වශයෙන්; පඤ්චධා, පස්පරිද්දෙකින් වේ. අ ආ ඉ ඊ උ ඌ ඒ ඉති, අකාරාන්ත ආකාරාන්ත ඉකාරාන්ත ඊකාරාන්ත උකාරාන්ත ඌකාරාන්තයයිද; පුල්ලිඞ්ගො, පුල්ලිඞ්ගයතෙම; ඡබ්බිධො මතො, ෂට්ප්‍රකාරයයි දන්නාලද්දේය.

44 අ ඉ උ ඉති, අ ඉ උ යන; තීනි එව, තුනෙක්ම; නපුංසකො, නපුංශකවාචකය. හෙවත් නපුංශකාන්තයයි; විජානියො, දතයු

45 නපුංසකම්පි පුමංව කත්වා අට්ඨසට්ඨිතිච,
එකෙවදන්ති අනතානං ගහෙතබ්බං විජානතා.

46 ජපඤ්ඤාසඤ්ඤසඞ්ඛ්‍ය වාධිකා නවුතීරිතා,
න්‍යාසෙතප්පදීපකෙ රූපසිද්ධියඤ්ච යථාරහ.

---

ත්තේය, ආවජ්ජිකාදි හෙදෙන, ආවජ්ජිකාදි භෙදයෙන්; ජපඤ්ඤාසා ති වුච්චරෙ, සපනාසෙකැයි කියනුලැබෙත්

(මෙසේ ආවජ්ජිකාදි චතුෂ්කයෙන් ගුණිතකොට අනතයෝ ස පනසෙක් වෙති. මේ වනාහි යථොක්ත ත්‍රිවිධ චතුෂ්කයන් අතුරෙ න් එකෙක් එකෙක් අනියමවශයෙන් ගෙණ කියනලද්දේය. නියම ය වනාහි ත්‍රිවිධ චතුෂ්කයන්ගේ ගුණිත වශයෙන් එකසිය සැට අ ටෙක් අනතයෝ වෙති යනුභාවයි.)

මෙ ප්‍රකාරයෙන් රූපසිද්ධිනය හා න්‍යාස නයද දක්වා න්‍යාසටී කා නය දක්වන්නාවූ ආචාය්‍ය්‍යීතෙම "නපුංසකම්පි පුමංච" යනාදි ය කීහ.

45 නපුංසකම්පි, නපුංෂකවාචකයද; පුමංවකත්වා; පුල්ලිංගුවමෙ න්, අනතසයක්කොට (ගත්කල්හි) අට්ඨසට්ඨීතිච, සැටඅටෙක්යයිද; එකෙ, සමහර ආචාය්‍ය්‍යීකෙනෙක්; වදන්ති, කියති;(මෙසේ)අනතානං, අනතයන්; විජානතා, ශාස්ත්‍රඥයාවිසින්; ගහෙතබ්බං, ගතයුතුය; නොහොත් දැනගතයුතුය.

(මේද යථොක්ත ත්‍රිවිධචතුෂ්කයන් අතුරෙන් එකී එකී චතුෂ්ක යක් අනියමවශයෙන් ගෙණකියන ලද්දේය, නියමයවනාහි සැටඅට චතුෂ්ක වශයෙන් ගුණිතකොට අනතයෝ දෙසිය සතරක් වන් නාහුය.)

දැන් ත්‍රිවිධාකාරයන්ගේ මතය නිගමනගාථා දක්වන්නාවූ ආචා ය්‍ය්‍යීතෙම ජපඤ්ඤාසඤ්ඤ සට්ඨසට්ඨිච" යනාදිය කීහ.

46 යථාරහං, යථානුරූපව (නොහොත් සඞ්ඛ්‍යාවූ පරිදෙදන්); න්‍යාසෙ, න්‍යාසයෙහි (හෙවත් මුඛමත්තදීපනියෙහි); ජපඤ්ඤාස, අ නතයෝ සපනාසෙකැයි කියාද; තප්පදීපකෙ, මුඛමත්තදීපනීටීකාවෙහි; අට්ඨසට්ඨීතිච, සැටඅටෙකැයි කියාද; රූපසිද්ධියං, රූපසිද්ධියෙහි; වා ධිකා නවුතිච, දෙයානුවක්ද; ඊරිතා, අනතයෝ කියනලද්දාහු;

මෙසේ සප්‍රයොගනාමහෙදය දක්වා දැන් නාමප්‍රකරණයෙහි වෘ ත්තිය සම්බන්ධව කිමත්ථං යනපදයට අභිලක්ෂණ දක්වන්නාවූ ආචා ය්‍ය්‍යීතෙම "වුත්තනියනතු කිමත්ථනති" යනාදිය කීහ.

47 වුත්තියන්තු කිමත්ථන්ති පුච්ඡිතබ්බෙසු මීසුව,
පරං සතිපි කත්වාන පුබ්බන්තු සම්බන්ධං කරෙ.

48 පුබ්බං සතිපි කත්වාන පරම්පි සම්බන්ධං කරෙ.
තීසුපි මෙව සතිපි එකංව සම්බන්ධං කරෙ.

49 නාමවචන පුසෙඤ්ඤන නමනං නාමනං භවෙ,
සබ්බාචාරාන සඤ්ච විඤ්ඤූනං සංසරණෙනා භාවා භවෙ.

---

47 වුත්තියන්තු, සූත්‍රවෘත්තියෙහි වනාහි; කිමත්ථං ඉති, ආලප නෙති කිමත්ථං යනාදියෙහි මෙන් කුමක් පිණිසදැයි කියා; පුච්ඡිත බ්බෙසු, විචාරියයුතුවූ; මීසුව, දෙයඟයක් ඇති කල්හිද; පරංසතිපි කත්වාන, පරාඟය විද්‍යමානකොට ඇතිකල්හිද; පුබ්බන්තු සම්බන්ධං කරෙ, පූර්‍වාඟයසම්බන්ධ කරන්නේය.

48 පුබ්බං සතිපිකත්වාන, පූර්‍වාඟය විද්‍යමානකොට ඇතිකල්හිද; පරම්පි සම්බන්ධංකරෙ, පරාඟයත් සම්බන්ධකරන්නේය; තීසුපි, ත්‍රිවිධ අඟයන් හෙවත් ත්‍රිවිධවිචාරීම ඇති සූත්‍රවෘත්තියෙහිද; මෙසතිපිකත්වා න, අඟවයම විද්‍යමානකොට ඇතිකල්හිද; එකංව සම්බන්ධං කරෙ, එකක්ම සම්බන්ධ කරන්නේය; (මෙහි "ආලපනෙසිගසඤ්ඤො" යන සූත්‍රයෙන් ගසංඥකිරීමට 'ආලපනෙ' යනු පූර්‍වාඟයයි. හෙවත් ගසංඥ වට පලමුවෙනි හෙතුවයි.'සි'යනු පරාඟයයි, ගසංඥකිරීමට පරාඟසං ඛ්‍යාත සිවිභක්තියහා පූර්‍වාඟසංඛ්‍යාත ආලපනෙ යන්නහෙවත් ආලප නයබවද ඇතිකල්හි ගසංඥාවට අඟසම්පූර්‍ණය. පරාඟයවූසිවිභක්ති ය ඇතිනමුත් පූර්‍වාඟවූ ආලපනයාගේ අභාවයෙන් ගසංඥානොවෙයි කියා සම්බන්ධ කටයුතුය, ත්‍රිවිධාඟයන් ඇති සූත්‍රවෘත්තියෙහි දෙකක් විද්‍යමානව ඇතිනම් තවඑකක් පමණක් සම්බන්ධකරන්ට ඕනෑබවය.

හේ මෙසේයි, "සංසා සෙඛනවචනෙ සුච" යන සූත්‍රවෘත්තියෙහි සංසා ආදෙශ විභක්ත්‍යාදෙශයන් ඇත්තේ නමුත් එකවචනයාගේ අභාවයෙන් ඉකාරාදෙශ නොවෙයි කියා සම්බන්ධකටයුතුය. ප්‍රථම වි භක්‍යාඟවූ සංසායනා දෙශහා එකවචනයද ඇත්තේනමුත් විභක්ත්‍යා දෙශයාගේ අභාවයෙන් ඉකාරාදෙශ නොවේයයි කියා සම්බන්ධ කට යුතුය යනු භාවයි.)

කච්චායනභෙද ග්‍රන්ථකාරක ආයුෂ්මත් යසාචාර්‍ය්‍යතෙම ප්‍රහීන නොකරණලද තෘෂ්ණාප්‍රනිධිය ඇතිබැවින් තමාගේ නාමග්‍රන්ථ හෙද නුරූපව ප්‍රාර්‍ථනා කරන්නේ"**නාමවචන පුසෙඤ්ඤන**"යනාදියකීහ.

49 භවාභවෙ, කාමලොක රූපලොක දෙක්හි; සංසරණෙනා,

50 ලිඞ්ගවචන පුඤ්ඤෙන ලීනත්ථො පාකටො භවෙ,
ලීනපඤ්හකථනො ච සතිමා සීල තෙජසා.

**සප්පයොගං නාමභෙදං සමත්තං**

මම නැවත නැවත සැරිසරන්නෙමි; නාමවචන පුඤ්ඤෙන, නාම භෙදයප්‍රකාශකරණලද කුශලකර්මය හෙතුකොටගෙණ, සචාචාරානං, සහපත් ආචාර ඇති; (චයතු නිපාතය) විඤ්ඤූනං, නුවණැත්තන්ගේ; නමතං, නැමීමද; නාමතං, නැමමවීමද කරන්නෙක්; භවෙ, වෙම්වා.

50 ලිඞ්ගවචන පුඤ්ඤෙන, ලීනාර්ථයන් ඇති ලිඟභෙදය ප්‍රකාශකරණලද කුශලය හේතුකොටගෙණ; ලීනත්ථො පාකටො භවෙ, ගුළ්හාර්ථයන් ප්‍රකටවීම් ඇත්තෙක් වෙම්වා; ලීනපඤ්හ කථනො ච, අත්‍යන්තගෲඪ ප්‍රශ්න විසර්ජ්ජනය කරන්නෙක්ද වෙම්වා; සීලතෙජසා, ශීලානුභාවයෙන්; සතිමා, සමෘතිමත් වෙමවා.

(මම අන්‍යයන් නමනකල්හි දුරාචාරවූ යම්කිසි බාලජනයෙක් නමන්ට නොකැමැත්තෙමි, සචාචාරඇති කටයුතුනොකටයුතු දන්නා පණ්ඩිතයන්ම නමන්ට කැමැත්තෙමි. අන්‍යයන් විසින් මම නමනු ලබන්නෙම්ද දුරාචාරවූ යම්කිසි බාලජන කෙනෙක් විසින් නමනු ලබන්ට නොකැමැත්තෙමි. සචාචාරඇති පණ්ඩිතයන් විසින්ම නමනු ලබන්ට කැමැත්තෙමි. මාගේ ඒ කැමැත්ත නාමය ප්‍රකාශ කළාවූ කුශලය හෙතුකොටගෙණ සමෘද්ධවේවා. යම් අර්ථයෙක් අනුන්ට මහොත්සාහයෙන් අතිශය සජ්ඣායන ධාරණ චින්තනාදි වශයෙන් ප්‍රකටවේද විවෘතවේද ඤුණාසිමුඛවේද එබඳු ගම්භීර ගුළ්හාර්ථය මාගේ නුවණින් දක්නාලද මාත්‍රඇත්තේම මට ප්‍රකටවේවා. අනුන්විසින්ද ලීනාර්ථ ප්‍රශ්නයන් විචාරණ ලද්දෙම්ද විචාලක්‍ෂණයෙහි විසඳීමට සමර්ථවේවා. මෙසේ ප්‍රතිපුච්ඡාවන්ගේ ක්‍ෂෘත්‍යභාවයට කාරණවූ විපුලභාවයට පැමිණි සමෘතියෙන්ද සමන්විත වෙම්වා. ඒ සමෘතිසම්පන්න භාවයද අනික් කාරණයකින් නොව සීලානුභාවය හෙතුකොටගෙණම වේවා. මාගේ ඒ ඊප්සාවද මෙම කුශලය හෙතුකොටගෙණ සමෘද්ධවේවායිකියා ප්‍රාර්ථනා කරණලද්දේය යනුභාවයි)

**සප්‍රයොග නාමභෙදය සම්පූර්ණ කරණ ලදි.**

**51 නිප්ඵාදෙති පදත්ථො යො ගමනපචනාදිකං,**
**ඉති සො කාරකො නාමකාරකලක්ඛඤ්ඤූහි ජානියො.**

**52 කාරකත්තා ක්‍රියායෙව සත්තිමුඛ්‍යෙන කාරකං,**
**දබ්බං ඨානූපචාරෙන තදාධාරණ භාවතො.**

**53 සද්දොපි අත්ථචාරෙන කාරකොති පවුච්චති,**
**එවං නිප්ඵාදකත්තෙන කාරකෙක විධං භවෙ.**

---

මෙසේ සප්‍රයොග නාමභෙදය දක්වා දූන් සප්‍රයෝගවූ කාරක භෙදය දක්වන්නේ ආචාර්‍ය්‍යතෙම ප්‍රථමකොට කාරක ශබ්දයට විග්‍රහ දක්වන්ට **“නිප්ඵාදෙති පදත්ථො”** යනාදිය කීහ.

51 යොපදත්ථො, යම් පදාර්ථයෙක් තෙම; ගමන පචනාදිකං, ගමනපචනාදිය; හෙවත් ගමනපචනාදි ක්‍රියාව; නිප්ඵාදෙති, නිපදවාද; ඉති, එ හෙයින්; සො, ඒ තෙම; කාරකොනාම, කාරක නමැයි; කාරකලක්ඛඤ්ඤූහි, කාරකලක්ෂණ දන්නන් විසින්, නොහොත් කාරකාර්ථ දන්නන් විසින්; ජානියො, දතයුත්තේය.

කර්තෘතෙම වනාහි සියලු ක්‍රියාවව්‍යාවෘතව ප්‍රධානව නිපදවන්නේය. කර්ම කරණ සම්ප්‍රදාන අපාදාන ආධාර යන කාරක පස විශෙෂවත් ක්‍රියාව ව්‍යාවෘතනොව අප්‍රධාන වශයෙන් නිපදවන්නේය. ඒ බව කියනලදි.

“ කත්තා සබ්බ ක්‍රියාබ්‍යාපි සෙසං කම්මාදිපඤ්චකං,
විසෙස ක්‍රියා බ්‍යාපීති කාරකං දුව්ධං මතං.”යි.

මෙසේ කාරකශබ්දයට විග්‍රහදක්වා ශක්තියම කාරකයයි කැමතිවනු ලැබේනුයි දක්වන්නේ **“කාරකත්තා ක්‍රියායෙව”** යනාදිය කීහ.

52 ක්‍රියාය, ගමන පචනාදි ක්‍රියාවගේ; කාරකත්තා, නිෂ්පාදකභාවය හෙතුකොටගෙණ; සත්ති එව, ශක්තියම; මුඛ්‍යෙන, ප්‍රධානවශයෙන්; කාරකං, කාරකනම්, දබ්බං; ද්‍රව්‍යය; තදාධාරණ භාවතො, ඒ ශක්තියට ආධාර භාවයෙන්; ඨානූපචාරෙන, ස්ථානී උපචාරයෙන් කාරකනම.

මෙසේ ශක්ති ද්‍රව්‍යසංඛ්‍යාත අර්ථයාගේ කාරක භාවදක්වා ශබ්දයාගේද කාරකභාව දක්වන්ට ආචාර්‍ය්‍යතෙම **“සද්දොපි අත්ථචාරෙන”** යනාදිය කීහ.

53 සද්දොඅපි, ශබ්දයද; අත්ථචාරෙන, අර්ථචාරයෙන්; (අර්ථය

54 කත්තා සබ්බක්‍රියාබ්‍යාපි සෙසං කම්මාදි කාරකං,
විසෙස ක්‍රියා බ්‍යාපිනි කාරකං දුවිධං මතං.

55 කත්තු කම්මංච කරණං සම්පදානමථාපරං,
අපාදානඤ්ච ඔකාසං කාරකං ඡබ්බිධං මතං.

---

නිපදවීමට කාරණා හෙයින්යයි සේයි) කාරකොති පවුච්චති, කාරකයයි කියනුලැබේ; එවං, මෙසේ; නිප්ඵාදකනෙතන, ගමනපචනාද්‍යභි නිෂ්පාදක භාවයෙන්; කාරකං, කාරකය; එකවිධංනවෙ එකප්‍රකාර වන්නේය.

මෙසේ නිෂ්පාදක ලක්ෂණ වශයෙන් එකප්‍රකාරයදක්වා ප්‍රයොගවශයෙන් විප්‍රකාරය දක්වන්නේආචාර්‍ය්‍යතෙම **"කත්තා සබ්බක්‍රියාබ්‍යාපි"** යනාදිය කීහ.

54 කත්තා, කර්තෘකාරකය තෙම; සබ්බක්‍රියාබ්‍යාපි, සියළුකාරකයන්ගේ ක්‍රියාවන් ව්‍යාවෘතව කරන්නේය; හෙවත් සියළුකාරකයන්ගේ ක්‍රියාවන්ට ප්‍රධානවේ; සෙසං, සෙසු; කම්මාදි කාරකං, කර්මකාරකාදි පස්දෙන; විසෙස ක්‍රියාබ්‍යාපිනී, විශෙෂවූ ක්‍රියාවබ්‍යාපනයකෙරේනුයි නොහොත් ස්වකීය ස්වකීය ක්‍රියායෙහී ව්‍යාවෘතව එයට ප්‍රධානවන්නේනුයි; (මෙසේ) කාරකං දුවිධං මතං, කාරකය විප්‍රකාරයයි දන්නාලද්දේය;

මෙහි භාවයනම්. කර්තෘකාරකය වනාහි කර්තෘහුගේ ක්‍රියාවද කර්මයපිලිබඳ ක්‍රියාවද කරණ කාරකය පිලිබඳ ක්‍රියාවද සම්ප්‍රදානය පිලිබඳ ක්‍රියාවද අපාදානය පිලිබඳ ක්‍රියාවද ආධාරය පිලිබඳ ක්‍රියාවද්දයි යන මේ ෂට්ප්‍රකාර ක්‍රියාව කරන්නේය. කර්තෘකාරකයෙන් පිටත් අනික් කර්මකාරක කරණකාරක සම්ප්‍රදාන කාරක අපාදාන කාරක ආධාරකාරක යනමේ පස්දෙන ස්වකීය ස්වකීය ක්‍රියාවෙහි ව්‍යාවෘතය. අන්‍යක්‍රියාවෙක්හි ව්‍යාවෘතනොවෙයි; මෙසේ ක්‍රියාබ්‍යාපන අබ්‍යාපන වශයෙන් කාරකය විප්‍රකාරවෙයි. එහි කර්මාදි කාරකපස සකර්මකාදී ක්‍රියාවෙහි ව්‍යාවෘතවෙයි, අකර්මක ක්‍රියාවෙහි ව්‍යාවෘතනොවේ. කර්තෘතෙම සකර්මකාකර්මකාදි සියළු ක්‍රියාවෙහි ව්‍යාවෘතවෙයි; කර්තෘ විරහිත ක්‍රියාවෙක්නම් කිසිකලෙකත් නොම ඇතිවේයයි යනු භාවයි.

මෙසේ ක්‍රියාබ්‍යාපන අබ්‍යාපන වශයෙන් විප්‍රකාර කාරකය දක්වා නානාශක්තිවශයෙන් දක්වන්ට "කත්තුකම්මංච කරණං" යනාදිය කීහ.

55 කත්තු, කර්තෘකාරකයද, කම්මංච, කර්මකාරකයද; සම්පදා

**56 කත්තා ච දුවිධො හොති වුත්තා'වුත්ත වසෙන ච,**
**පඨමෙන යුත්තො වුත්තො අවුත්තො තතියෙන ච**
**පුරිසො ගච්ඡති මග්ගං ගරුළෙන හතො නාගො.**

**57 සයං හෙතු කම්මකත්තු වසෙන තිවිධො භවෙ,**
**දත්තො කරොති කාරෙති කුසූලො භිජ්ජතෙ සයං.**

---

නං, සම්ප්‍රදාන කාරකයද; අථාපරං, ඉක්බිති; අපාදානංච, අපාදාන කාරකයද; ඔකාසං, ආධාරකාරකයදැයි; කාරකං, කාරකය; ඡබ්බිධංමතං, ෂට්ප්‍රකාරයයි දත්තාලද්දේය.

මෙසේ නාමවශයෙන් සවැදෑරුම් කාරකයදක්වා ඒ ෂට්විධකාරකයෙන් පලමුකොට කර්තෘහුගේ විශෙෂභෙද දක්වන්ට **“කත්තාච දුවිධො හොති”** යනාදිය කීහ.

56 වුත්තාවුත්ත වසෙනච, උක්තකර්තෘ අනුක්ත කර්තෘහුගේ වශයෙන්ද; කත්තාච, කර්තෘතෙමේද; දුවිධොහොති, ද්විප්‍රකාරවේ; පඨමෙන යුත්තො, ප්‍රථමා විභක්තියෙන් යුක්තවූයේ; වුත්තො, උක්තකර්තෘ නම්වේ; තතියෙන, තෘතීයා විභක්තියෙන් යුක්තවූයේ; අවුත්තොච, අනුක්ත කර්තෘදවේ; උදාහරණ දක්වන්ට පුරිසො යනාදිය කීහ.

මෙහි “පුරිසො මග්ගං ගච්ඡති” යනු කර්තෘහු ප්‍රථමා විභක්තියෙන් යුක්තවූ කල්හි උක්තකර්තෘබවට උදාහරණය. ‘ගරුළෙන හතො නාගො’ යනු කර්තෘහු තෘතීයා විභක්තියෙන් යුක්තවූකල්හි අනුක්ත කර්තෘබවට උදාහරණය.

මෙසේ වාච්‍යවශයෙන් කර්තෘහුගේ භෙදදක්වා දැන් සවගාවභෙද වශයෙන් දක්වන්නේ ආචාර්‍ය්‍යතෙම **“සයංහෙතු කම්මකත්තු”** යනාදිය කීහ.

57 සයංහෙතු කම්මකත්තු වසෙන, සයංකර්තෘ හෙතුකර්තෘ කර්ම්මකර්තෘ යන මොවුන්ගේ වශයෙන්; තිවිධො භවෙ, කර්තෘ කාරකය තෙම ත්‍රිවිධවේ; උදාහරණනම්—දත්තො කරොති, දත්තතෙමේ කර්ම්යකෙරෙ; (දත්තොකරොති යනු සයං කර්තෘට උදාහරණය.) කාරෙති, † රජතෙම දත්තයාලවා කර්ම්යකරවා; (මෙහි කාරෙති යනු හේතුකර්තෘවට ක්‍රියාවයෙදූ නියායි.) කුසූලො සයංඑව භිජ්ජතෙ, කු

---

† “රාජාදත්තං කම්මං කාරෙති, දත්තස්ස දත්තෙන වා කම්මං කාරෙති” සී. ටීකා.

58 කම්මංහි දුවිධං හොති වුත්තා වුත්ත වසෙනව,
ඔදනො පච්චතෙ දත්තො කටං කරොති ත්‍යාදිකං.

59 නිබ්බත්ති * විකතිප්පත්ති භෙදා කම්මං තිධාමතං,
රථං කරොති ඣාපෙති කඨාදිච්චං නමස්සති.

---

සුලයුතෙම තෙමේම බිඳේ; (කුසුලො සයං භිජ්ජතෙයනු කර්මකර්තෘට උදාහරණය; මෙහි කර්මයතෙමේම කර්තෘවනහෙයින් කර්මකර්තෘනම් වී.) යමෙක් තෙම ප්‍රයොජකයක්හුගේ උත්සාහ රහිතව තමා ප්‍රධානව ක්‍රියාව නිපදවාද හෙතෙම සයංකර්තෘ නම; යමෙක් වනාහි ක්‍රියාභිනිෂ්පත්තියට කර්තෘවූවක්හට ප්‍රයොජ්‍යවේද හෙතෙම හෙතුකර්තෘනම; යමෙක්තෙම තෙමේම ක්‍රියාවත් කෙරේද තෙමෙම කර්මත් වේද හේ කර්මකර්තෘනම.

මෙසේ කර්තෘ භෙද දක්වා කර්මභෙදයන් අතුරෙන් උක්තානුක්තකර්මභෙදය දක්වන්ට "**කම්මංහි දුවිධං හොති**" යනාදියකීහ:

58 කම්මංහි, කර්මයවනාහි; වුත්තා වුත්තවසෙනව, උක්තකර්ම අනුක්තකර්ම වශයෙන්ද; දුවිධං හොති විප්‍රකාරවේ, උදාහරණනම්- ඔදනො පච්චතෙ දත්තො කටං කරොති ඉති ආදිකං, ඔදනො පච්චතෙ දත්තො කටං කරොති යනාදියයි. (මෙහි 'ඔදනො' යන කර්මය ප්‍රථමා විභක්ත්‍යන්ත හෙයින් උක්තකර්මනම, 'කටං' යනතැන කර්මය ද්විතියා විභක්ත්‍යන්ත හෙයින් (අනුක්ත කර්මනම.)

මෙසේ වුක්තානුක්ත වශයෙන් කර්මභෙද දක්වා දැන් ස්වභාව වශයෙන් යථොක්ත කර්මභෙදයාගේ ප්‍රභෙද දක්වන්නේ "**නිබ්බත්ති විකතිප්පත්ති**" යනාදිය කීහ.

59 නිබ්බත්ති විකතිප්පත්තිභෙදා, නිර්වර්ත්‍යකර්ම විකෘතිකර්ම ප්‍රාප්තිකර්මභෙදයෙන්; කම්මං, කර්මය; තිධාමතං, ත්‍රිවිධාකාරයකින් දන්නා ලද්දේය. උදාහරණනම්—රථං කරොති, රථංකරොතිකියාද; කඨං ඣාපෙති, කඨංඣාපෙතිකියාද; ආදිච්චංනමස්සති, ආදිච්චංනමස්සතිකියාදවේ; (මෙහි 'රථං කරොති'යනතන්හි 'රථං' යනුනිර්වර්ත්‍යකර්මය නම; 'කඨං ඣාපෙති, යන්නෙහි'කඨං'යනු විකෘතිකර්මය නම, 'ආදිච්චං නමස්සති'යන්නෙහි'ආදිච්චං' යනු ප්‍රාප්තිකර්මයනමැයි දතයුතු)

---

* "යං කම්මං කත්තුබ්‍යාපාරෙන නිප්පාදීයතෙතං කම්මං නිප්පත්ති කම්මංනාම " යන්නෙන් 'නිප්පත්ති' සී' ටීකාචාර්යයන්ට අභිමත බවපෙනේ,

**60 සන්තාසන්ත ජනනානං වසෙන නිබ්බත්ති ද්විධා,**
**මාතා පුත්තං විජායිති පුඤ්ඤං සුඛං ජනෙතිදං.**

**61 පරිච්චත්තා පරිච්චත්තකාරණා විකති ද්විධා,**
**කරොතිකට්ඨං අගාරං සුවණ්ණං කටකං කරෙ.**

---

මෙසේ 'රථං කරොති' යන්නෙන් එක් ප්‍රකාරයකින් නිර්වර්ත්‍ය කර්මය දක්වා විශෙෂවශයෙන් ඒ නිර්වර්ත්‍යකර්මයාගේ ද්විප්‍රකාරය දක්වන්නේ "**සන්තාසන්ත ජනනානං වසෙන**" යනාදිය කීහ.

60 නිබ්බත්ති, නිර්වර්ත්‍යකර්මය; සන්තාසන්ත ජනනානං වසෙන, සන්තජනන අසන්තජනනයන්ගේ වශයෙන්; ද්විධා, දෙපරිද්දෙකින් වේ; (සන්තජනනනම් විද්‍යමානය ඉපදවීමය,අසන්තජනනනම් අවිද්‍යමානය ඉපදවීමයි.) මාතා පුත්තං විජායිති, මාතා පුත්තං විජායි යනුද; පුඤ්ඤං සුඛං ජනෙති, පුඤ්ඤං සුඛං ජනෙති යනුද; ඉදං, මේ නිදර්ශනයි.
(මෙහි'පුත්තං'යනු විද්‍යමානය,'සුඛං'යනු අවිද්‍යමානය; එහෙයින් විද්‍යමානවූ පුත්‍රයාවැදී; අවිද්‍යමාන සුව උපදවන්නේයි, යනු භාවයි)

මෙසේ නිර්වර්ත්‍යකර්මයාගේ භෙද දක්වා පිළිවෙලින් විකෘතිකර්මයාගේ භෙද දක්වන්ට "**පරිච්චත්තා පරිච්චත්ත**" යනාදිය කීහ.

61. විකති, විකෘතිකර්මයද; පරිච්චත්තා පරිච්චත්තකාරණා, පරිච්චත්තකාරණ අපරිච්චත්තකාරණ වශයෙන්, ද්විධා, දෙපරිද්දෙකින් දන්නාලද්දේය; කට්ඨං අගාරං කරොති, කට්ඨං අගාරං කරොතියනුද; සුවණ්ණං කටකං කරෙ, සුවණ්ණං කටකං කරෙ යනුද නිදර්ශනයි. (මෙහි 'කට්ඨං අගාරං කරොති' යනෙනහි ක්‍රියානිෂ්පාදනයට පෙර කාෂ්ඨයාගේ තුබූ වර්ණසංස්ථාන සඞ්ඛ්‍යාත කාරණා ක්‍රියාව නිපන් කල එකාන්තයෙන්ම හරනේය, ඒ පරිච්චත්ත කාරණ විකෘති කර්ම නම්, හෙවත් හරණලද කාරණඇති විකෘතිකර්මයනම, "සුවණ්ණං කටකංකරෙ" යන මෙහි ක්‍රියානිෂ්පාදනයට පෙර ස්වර්ණයාගේ තුබූ යම් වර්ණසටහන් සඞ්ඛ්‍යාත කාරණයක් ඇද්ද ක්‍රියාව නිපන් කල්හි ඒකාන්තයෙන්ම ඒවර්ණාදිය නොහරනේය, ඒඅපරිච්චත්ත කාරණ විකෘතිකර්ම නම්, හෙවත් නොහරණලද කාරණඇති විකෘති කර්මය නම්)

මෙසේ නිර්වර්ත්‍ය විකෘතිකර්මයන්ගේ භෙද දක්වා ප්‍රාප්‍යකර්මයාගේ විශෙෂ භෙද දක්වන්ට "**පත්තිකම්මං ද්විධා**" යනාදිය කීහ.

62 පත්තිකම්මං ද්විධා කායචිත්ත සම්පත්ති භෙදතො,
බුද්ධං වන්දති පූජෙති ආදිච්චංච නමස්සති.

63 ඉච්ඡිතාදි වසා කම්මං තිධා භත්තඤ්ච භුඤ්ජති,
විසංගිලති ගාමඤ්ච ගච්ඡං සාලමුපාගමි.

64 කරණං දුවිධං හොති බාහිරජ්ඣත්ත භෙදතො,
විහිං ලුනාති දත්තෙන චක්ඛුනාවන්ද මික්ඛතෙ.

---

62 පත්තිකම්මං, ප්‍රාප්තිකර්මය; කාය චිත්ත සම්පත්ති භෙදතො, කායසම්පත්ති කර්මචිත්ත සම්පත්ති කර්ම භෙදයෙන්; ද්විධා, දෙපරිද්දෙකින් වන්නේය; බුද්ධං වන්දති පූජෙති, බුද්ධං වන්දති යනුද බුද්ධං පූජෙති යනුද; ආදිච්චංච නමස්සති, ආදිච්චංච නමස්සති යනුද උදාහරණයි.

(මෙහි යමක් කාය සංඛ්‍යාත ස්කන්ධ පඤ්චකයට ආසන්නතරව ඉපදීම ඵලවාද කර්තෲහුගේ ක්‍රියා සංඛ්‍යාත විඥාන සන්තතියෙන් පැමිණෙනු ලැබේද ඒ කායසම්පත්ති කර්මය නම, බුද්ධං වන්දති පූජෙති යනාදියයි. යමක් වනාහි සිතින් අරමුණුකිරීම් වශයෙන් පැමිණෙනුලැබේද ඒචිත්තසම්පත්ති කර්මයනම,ආදිච්චංනමස්සති යනාදියයි)

මෙසේ ස්වභාවවශයෙන් ප්‍රභෙද දක්වා ඊප්සිතාදි වශයෙන් ප්‍රභෙද දක්වන්නේ "**ඉච්ඡිතාදිවසා කම්මං**" යනාදිය කීහ.

63. කම්මං, කර්මකාරකය; ඉච්ඡිතාදිවසා, ඊප්සිත කර්ම අනීප්සිතකර්ම නෙවීප්සිත නානීප්සිත කර්මයන්ගේ වශයෙන්; තිධා, තුන්පරිද්දෙකින්වේ; භත්තංච භුඤ්ජති විසංගිලති ගාමං ගච්ඡං සාලං උපාගමි, භත්තංච භුඤ්ජති විසංගිලති ගාමං ගච්ඡං සාලංඋපාගමි යනුද ඊප්සිතාදි කර්මයන්ට උදාහරණයි.

(මෙහි 'භත්තං භුඤ්ජති' යනු ඊප්සිතකර්මයට උදාහරණය; විසංගිලති, යනු අනීප්සිතකර්මයට උදාහරණය, 'ගාමං ගච්ඡං සාලං උපාගමි' යනු නෙවීප්සිත නානීප්සිත කර්මයට උදාහරණයි.)

මෙසේ සප්‍රයොග කර්මකාරක ප්‍රභෙද දක්වා දැන් කරණ කාරක ප්‍රභෙද දක්වන්නේ ආචාර්‍ය්‍යතෙම "**කරණං දුවිධං හොති**" යනාදි යකීහ,

64. කරණං, කරණකාරකය; බාහිරජ්ඣත්තභෙදතො, බාහිර අජ්ඣත්තභෙද වශයෙන්; (බාහිර කරණය අජ්ඣත්තකරණය යන

**65 චක්ඛාදිනාච ඡබ්බිධං රූපං පස්සති චක්ඛුනා,**
**සද්දං සොතෙන සුනාති ගන්ධං ඝාණෙන ඝායති.**

**66 රසංසායති ජිව්හාය කායෙන ඵොට්ඨබ්බං ඵුසෙ,**
**ධම්මං මනෙන ජානාති ඉදං තෙසං නිදස්සනං.**

**67 සම්පදානං ද්විධා කාය චිත්තපුබ්බක භෙදතො,**
**භික්ඛුස්සචීවරංදෙති බලිං නාරායණස්සච.**

---

මොවුන්ගේ භෙද වශයෙන්යයි සේයි) දුවිධං හොති, ද්විප්‍රකාරවේ; වීහිං ලුනාති දාත්තෙන, වීහිං ලුනාති දාත්තෙන යනුද; චක්ඛුනා ච පෙක්ඛතෙ, චක්ඛුනා ච පෙක්ඛතෙ යනුද උදාහරණයි.

(මෙහි 'දාත්තෙන වීහිං ලුනාති' යනු බාහිරකාරණයට උදාහර ණය, 'චක්ඛුනා ච පෙක්ඛතෙ'. යනු අජ්ඣත්තකරණයට උදාහරණයි මෙසේ ආධ්‍යාත්මික කාරණයාගේ සාමාන්‍ය ලක්‍ෂණ වශයෙන් එක ප්‍රකාරය දක්වා ෂට්ප්‍රකාර විශෙෂ ලක්‍ෂණ දක්වන්නෙ"**චක්ඛාදිනා ච ඡබ්බිධං**" යනාදිය කීහ.

65. චක්ඛාදිනාංච, චක්ඛාදියෙන්ද, හෙවත් චක්‍ෂුරාදිය කරණ කොටගෙණද; ඡබ්බිධං, (කරණ කාරකය) ෂට්ප්‍රකාරවේ; චක්ඛුනා රූපංපස්සති, චක්ඛුනා රූපංපස්සති යනුද; සොතෙන සද්දං සුණාති, සොතෙන සද්දං සුණාති යනුද; ඝාණෙන ගන්ධං ඝායති, ඝාණෙ න ගන්ධං ඝායති යනුද;

66. ජිව්හාය රසං සායති, ජිව්හාය රසං සායති යනුද; කායෙ න ඵොට්ඨබ්බංඵුසෙ, කායෙන ඵොට්ඨබ්බංඵුසෙ යනුද; මනෙන ධම්මං ජානාති, මනෙන ධම්මං ජානාති යනුද; ඉදං, මේ; තෙසං, ඒෂට්විධ ආධ්‍යාත්මික කරණයන්ට; නිදස්සනං, නිදශිතයි, හෙවත් උදාහර ණයි.

මෙසේ කරණ කාරකයාගේ ප්‍රභෙද දක්වා . කාරක පිළිවෙලින් ආ සම්ප්‍රදාන කාරකයාගේ ප්‍රභෙද දක්වන්ට "**සම්පදානං ද්විධා**" යනාදිය කීහ.

67 සම්පදානං, සම්ප්‍රදාන කාරකය; කාය චිත්ත පුබ්බක භෙද තො, කාය පුබ්බක චිත්ත පුබ්බක භෙද වශයෙන්; ද්විධා; දෙපරිද්දෙ කින් වේ. භික්ඛුස්සචීවරං දෙති, භික්ඛුස්ස චීවරං දෙති යනුද; නා රායණස්ස බලිංදෙතිච, නාරායණස්ස බලිංදෙති යනුද; උදාහරණයි.

(මෙහි 'භික්ඛුස්ස චීවරං දෙති' යනු කායපූර්වක සම්ප්‍රදානයට උදාහරණය, යම් දානවස්තුවක් කයින් පිළිගන්නේද ඒ කායපූර්වක

**68 අනිරාකරණ මාරාධනබ්භනුඤ්ඤ වසෙනහි,**
**සම්පදානං තිධා වුත්තං රුක්ඛ යාචක භික්ඛවො.**

**69 අපාදානං ද්විධා කාය චිත්ත පුබ්බක භෙදතො,**
**අපෙන්ති මුනයො ගාමා පාපා චිත්තං නිවාරයෙ.**

---

නම්වේ; 'නාරායණස්ස බලිං දෙති' යනු චිත්තපූර්වක සම්ප්‍රදානයට උදාහරණය, යම් දන වස්තුවක් සිතින්ම පිළිගණිද ඒ චිත්තපූර්වක නම්.)

මෙසේ සම්ප්‍රදාන කාරකයාගේ ද්විප්‍රකාරය දක්වා නැවත ත්‍රිප්‍රකාරය දක්වන්නේ **"අනිරාකරණ මාරාධන**බ්භනුඤ්ඤ"යනාදිය කීහ.

68 සම්පදානං, සම්ප්‍රදානකාරකය; අනිරාකරණ මාරාධනබ්භනුඤ්ඤවසෙනහි, අනිරාකරණ මාරාධනබ්භනුඤ්ඤයනමොවුන්ගේ වශයෙන්ද; (අනිරාකරණ සම්ප්‍රදානය ආරාධනසම්ප්‍රදානය අබ්භනුඤ්ඤ සම්ප්‍රදානයයිසේයි.) තිධාවුත්තං, තුන්පරිද්දෙකින් කියන ලද්දේය; රුක්ඛ යාචක භික්ඛවො, රුක්ඛයාචක භික්ඛවො යනු උදාහරණයි; බොධිරුක්ඛස්ස ජලං දදති, යාචකානං භොජනං යුජ්ජති, භික්ඛුස්සචීවරං දදති'සී, යොදනු, (මෙහි 'බොධිරුක්ඛස්සජලං දදති'යනු අනිරාකරණ සම්ප්‍රදානයට උදාහරණය; "කාරකපටිග්ගහා භාවෙන අභිමුඛීකරණං තං යස්සනත්ථීති= අනිරාකරණං" යනු ටීකායි 'යාචකානං භොජනං යුජ්ජති' යනු ආරාධන සම්ප්‍රදානයට උදාහරණය; ආරාධතීති= ආරාධො, යං පන භොජනාදි වත්ථුං යාචති දෙය්‍යංච ගණ්හාති තං ආරාධනසම්පදානං නාම; 'භික්ඛුස්ස චීවරං දදති' යනු අබ්භනුඤ්ඤසම්ප්‍රදාන නම; අනුඤ්ඤාතබ්බන්ති= අනුඤ්ඤං, අනුඤ්ඤං අභි (මුඛං) කරොතීති= අබ්භනුඤ්ඤං, යං පන චීවරාදි දානවත්ථු නෙවයාචති අපිතුදින්නං සාදියති තං අබ්භනුඤ්ඤසම්පදානං නාම.)

මෙසේ කාරකසතරෙක් දක්වා පස්වැනි අපාදානකාරකය දක්වන්නේ **"අපාදානං ද්විධා"** යනාදිය කීහ.

69 අපාදානං, අපාදානකාරකය; කායචිත්තපුබ්බක භෙදතො, කායපුබ්බකචිත්ත පුබ්බකභෙදයෙන්; (කායපූර්වක අපක්‍රමඅපාදානය චිත්තපූර්වක අපක්‍රම අපාදානයයිසේයි.) ද්විධා, දෙපරිද්දෙකින්වේ; අපෙන්ති මුනයොගාමා, අපෙන්තිමුනයොගාමා යනුද; පාපාචිත්තං නිවාරයෙ, පාපාචිත්තං නිවාරයෙ යනුද උදාහරණයි; (අපෙන්ති මුනයොගාමා යනු කායපූර්වක අපක්‍රම අපාදානයට උදාහරණය; පාපාචිත්තං නිවාරයෙ යනු චිත්තපූර්වක අපක්‍රම අපාදානයට උදාහරණයි)

70 චලාචල වසේනාපි අපාදානං ද්විධා මතං,
හත්ථික්ඛන්ධතො ඔරූහ පණ්ණාපතන්ති රුක්ඛතො.

71 උද්දිට්ඨවිසයං කිඤ්චි උපාත්තවිසයං තථා,
අනුමෙය්‍ය විසයඤ්චාති අපාදානං තිධා මතං.

72 අපෙන්ති මුනයො ගාමා කුසූලා තණ්ඩුලං පචෙ,
පාටලිපුත්තකෙහිච අභිරූප තරා ඉමෙ.

---

මෙසේ අපාදානයාගේ ද්විප්‍රකාරය දක්වා නැවතත් ද්විප්‍රකාරය දක්වන්නේ “චලාචලවසේනාපි”යනාදිය කීහ.

70 අපාදානං,ආපාදානකාරකය; චලාචලවසෙන අපි, චලාචලවශයෙන්ද, හෙවත් චලාපාදාන අචලාපාදාන වශයෙන්ද; ද්විධා මතං, දෙයාකාරයකින් දන්නාලද්දේය; හත්ථික්ඛන්ධතො ඔරුයහ; හත්ථික්ඛන්ධතො ඔරුයහයනුද; පණ්ණාපතන්ති රුක්ඛතො, පණ්ණාපතන්තිරුක්ඛතො යනුද; උදාහරණවේ. (මෙහි ‘හත්ථික්ඛන්ධතො ඔරුයහ’ යනු චලාපාදානයට උදාහරණය, හස්තිස්කන්ධයාගේ චලනයනිසායි. ‘පණ්ණාපතන්තිරුක්ඛතො’ යනු අචලාපාදානයට උදාහරණය, වෘක්ෂයාගේ අචලනය නිසායි.)

මෙසේ අපාදානය කාය චිත්ත වශයෙන්ද සතරාකාරයකින් දක්වා එකී එකී ලක්ෂණයක්හුගේ ත්‍රිවිධභෙදය දක්වන්නේ “**උද්දිට්ඨවිසයං කිඤ්චි**” යනාදියකීහ.

71 තංහි, යථොක්තලක්ෂණවූ ඒ අපාදානය වනාහි; උද්දිට්ඨවිසයංච, උද්දිට්ඨවිසය අපාදානය; උපාත්තවිසයං, උපාත්ත විසය අපාදානයද; තථා,එපරිද්දෙන්;අනුමෙය්‍යවිසයඤ්චඉති;අනුමෙය්‍යවිසය අපාදානයදැයි මේ ප්‍රකාරයෙන්; තිධාමතං, තුන්පරිද්දෙකින් දන්නාලද්දේය; “යස්සපන අපාදිභූතා ක්‍රියා යථාරුතවසෙන දිස්සති තං උද්දිට්ඨ විසයාපාදානං නාම; යස්සපන ක්‍රියා නත්ථි අජ්ඣාහාර වසෙන ගහිතා තං උපාත්ත විසයාපාදානංනාම, යස්සපන ක්‍රියානත්ථි අජ්ඣාහරිත්වා වා අනජ්ඣාහරිත්වාවා උපනිධාය වසෙන සම්බන්ධො යුත්තො හොති තං අනුමෙය්‍ය විසයා පාදානං නාම” යනු ටීකාවචනයි.

මෙසේ අපාදානකාරකභෙද දක්වා ඔවුන්ට උදාහරණ දක්වන්නේ ආචාර්‍ය්‍යතෙම “**අපෙන්ති මුනයොගාමා**” යනාදිය කීහ.

72 අපෙන්තිමුනයොගාමා, අපෙන්ති මුනයොගාමා යනුද; කුසු

73 ආධාරො චතුධාබ්‍යාපි කොපසිලෙසිකො තථා,
වෙසයිකො සාමිපිකො තිලාදිකං නිදස්සනං.

74 බ්‍යාපිකොච දුධා සකලබ්‍යාපිකෙක දෙසතො,
තිට්ඨති තෙලං තිලෙසු ඛීරං ජලෙසු තිට්ඨති.

---

ලාතණ්ඩුලං පචෙ, කුසූලාතණ්ඩුලං පචෙයනුද; පාටලිපුත්තකෙහිච අභිරූප තරා ඉමෙ, පාටලිපුත්තකෙහිච අභිරූපතරා ඉමෙ යනුද උදාහරණයි; (මෙහි 'අපෙන්ති මූත්‍රයොගාමා' යනු උද්දිඨ විසයා පාදානනම; 'කුසූලාතණ්ඩුලං පචෙ' යනු උපපත්තිවිසයාපාදානනම්; 'පාටලිපුත්තකෙහි අභිරූපතරා ඉමෙ' යනු අනුමෙය්‍ය විසයා පාදානනම;)

මෙසේ අපාදානකාරකභෙද දක්වා අධාරකාරකභෙද දක්වන්නේ "**ආධාරොචතුධා**" යනාදිය කීහ.

73 ආධාරො, ආධාරකාරකය; බ්‍යාපිකො, බ්‍යාපිකාධාරයද; ඔපසිලෙසිකො,ඖපශ්ලෙෂිකාධාරයද;සාමිපිකො,සාමීපිකාධාරයද;වෙසයිකො, වෛෂයිකාධාරයදැයි;චතුධා, සතරපරිද්දෙකින්වේ;තිලාදිකං, තිලාදිය; නිදස්සනං, නිදර්ශනයි, හෙවත් උදාහරණයි. ('තිලෙසුතෙලං තිට්ඨති' යනු ව්‍යාපිකාධාරයට උදාහරණයි, උක්ඛලියං ආචාමො, යනු ඖපශ්ලෙෂිකාධාරයට උදාහරණය, 'පාසාදෙතිට්ඨති රාජා' යනු වෛෂයිකාධාරයට උදාහරණය, 'ගඟායංඝොසො' යනු සාමීපිකාධාරයට උදාහරණයයි. ශේෂයි.)

මෙසේ චතුර්විධා ධාරකාරකයදක්වා ඔවුන්අතුරෙන්ව්‍යාපිකාධාරයාගේ භෙද දක්වන්නේ "**බ්‍යාපිකොච දුධා**" යනාදිය කීහ.

74 බ්‍යාපිකොච, ව්‍යාපිකාධාරයද; සකල බ්‍යාපිකෙකදෙසතො, සකල බ්‍යාපිකාධාර ඒකදෙශ බ්‍යාපිකාධාරයන්ගේ වශයෙන්; දුධා, දෙපරිද්දෙකින්වේ; තිට්ඨති තෙලං තිලෙසු, තිට්ඨතිතෙලං තිලෙසු යනුද; ජලෙසු ඛීරං තිට්ඨති, ජලෙසු ඛීරං තිට්ඨති යනුද; උදාහරණයි. (මෙහි 'තිලෙසු තෙලං තිට්ඨති, යනු සකලව්‍යාපිකාධාරයට උදාහරණය, 'ජලෙසු ඛීරං තිට්ඨති' යනු ඒකදෙශව්‍යාපි කාධාරයට උදාහරණයි.)

මෙසේව්‍යාපිකාධාරයාගේභෙදදක්වා ඖපශ්ලෙෂිකාධාරයාගේ භෙද දක්වන්නේ " **දුවිධොපසිලෙසොච** " යනාදිය කීහ,

75 දුවිධොපසිලෙසොච අල්ලීයානල්ලි භෙදතො,
උක්ඛලියඤ්ච ආචාමො පරියඞ්කඛච තිට්ඨති.

76 වෙසයිකොච දුවිධො දෙසනතරඤ්ඤථා වසා,
පාදෙසු පතිට්ඨා රොදි පක්ඛිනි සකුණාතභෙ.

77 සාමීපි යච්භයං තීරෙ සමීපෙ උපචාරතො,
ලබ්ධංතීරෙන ගඞ්ගාති ගඞ්ගායං ශස්සමාදිසු.

---

75 ඔපසිලෙසොච, ඖපශ්ලෙෂිකා ධාරයද; අල්ලීයා නලලිහෙ දතො, අල්ලීයන ඖපශ්ලෙෂිකාධාර, අනල්ලීයන ඖපශ්ලෙෂිකා ධාරවශයෙන්; දුවිධො, දෙපරිද්දෙක්වේ. උක්ඛලියං ආචාමොච, උක්ඛලියං ආචාමොයනුද; පරියඞ්කෙ තිට්ඨතිච, පරියඞ්කෙ තිට්ඨති ය නුද උදාහරණසි, (මෙහි 'උක්ඛලියං ආචාමො' යනු අල්ලීයන ඖපශ්ලෙෂි කාධාරයට උදාහරණය, 'පරියඞ්කෙ තිට්ඨති' යනු අනල්ලී යන ඖපශ්ලෙෂිකාධාරයට උදාහරණසි.)

මෙසේ ඖපශ්ලෙෂිකාධාරයාගේ භෙද දක්වා වෛෂයිකා ධාරයාගේ භෙද දක්වන්නේ "වෙසයිකොච දුවිධො" යනාදිය කීහ.

76 වෙසයිකොච, වෛෂයිකාධාරයද; දෙසනතරඤ්ඤථාවසා, දෙශාන්තරාවච්ඡේද විෂයාධාර අන්‍යථාභාව විෂයාධාරවශයෙන්; දුවිධො, විප්‍රකාරවේ; පාදෙසුපතිට්ඨාරොදි, පාදෙසු පතිට්ඨාරොදිය නුද; පක්ඛිනිසකුණා නභෙ, පක්ඛිනිසකුණා නභෙයනුද උදාහරණ සි. (මෙහි 'පාදෙසුපතිට්ඨාරොදි, යනු දෙශාන්තරාවච්ඡේද විෂයාධාර යට උදාහරණය; 'පක්ඛිනිසකුණානභෙ' යනු අන්‍යථාභාව විෂයාධා රයට උදාහරණසි.)

මෙසේ වෛෂයිකාධාරය දක්වා සාමීපිකාධාරයාගේ ව්‍යවහා රයහා ඊට උදාහරණ දක්වන්නේ " සාමීපියච්භයං තීරෙ " යනා දිය කීහ.

77 සාමීපියච්භයං, සමීපසඤ්ඤකයහුගේ නාමය; සමීපෙ, සමී පයෙහිවූ; තීරෙ, ඉවුරෙහි; උපචාරතො, උපචාරවශයෙන්; ලබ්ධං, ලද්දේය; තීරෙන, තීරය (ඉවුර) කරණකොටගෙණ; ගඞ්ගාඉති, ගඞ්ගාවයයිද; ගඞ්ගායං, ගඞ්ගාවෙහි; සස්සංඉති, ශස්‍යයයිද; ආදිසු; මේ ආදිනතන්හි උදාහරණවේ.

(මෙහි'ගඞ්ගායං සස්සං'යනුසාමීපිකාධාරයට උදාහරණය,ගඞ්ගා වසමීපයෙහි සිටිහෙයින් උපචාරවශයෙන් ගඞ්ගාවෙහියයි කීහ. සා වත්ථියං විහරති' යනුද මෙසේම සැවැත්නුවර සමීපයෙහි හෙයින්

**78 මුඛ්‍යාපරම්පරා තබ්බිසයො තදුපනිස්සයො,**
**ඛගඞ්ගම්හිපරියඞ්කෙව රූපෙව සාසනෙවසි.**

**79 සාමි ආලපනඤ්චෙව නිද්ධාරණඤ්ච ලක්ඛණං,**
**හෙතුඅච්චන්තසංයොගං ඉමෙ අකාරකාමතා.**

---

උපචාරවශයෙන් සැවැත්නුවරයයිද කීහයි දතයුතු. මේද සාමිපිකාධාරයට උදූරණයි.)

මෙසේ සත්ප්‍රකාරයකින් ආධාරකාරකයදක්වා අතිසූදුආධාරප්‍රභෙදයක් දක්වන්නේ " **මුඛ්‍යාපරම්පරා** " යනාදිය කීහ.

78 මුඛ්‍යා, මුඛ්‍යාධාරය; (මුඛ්‍යන්ති පධානට්ඨානං, මුඛෙ ජාතො= මුඛ්‍යා.) පරංපරා, පරංපරාධාරය; තබ්බිසයො, තබ්බිසයාධාරය; (තබ්විසයො= තබ්බිසයො;) තදුපනිස්සයො, තදුපනිස්සයාධාරය (යනමෙම් වශයෙන් ආධාරය සතරාකාරවේ.) ඛගඞ්ගම්හි, ඛගඞ්ගම්හි (ඔහාසො තිට්ඨති) යනුද; පරියඞ්කෙව, පරියඞ්කෙ (රාජා සෙති) යනුද; රූපෙව, රූපෙ (සඤ්ඤා) යනුද, සාසනෙවසි, (භික්ඛු) සාසනෙවසි යනුද; පිළිවෙලින් උදාහරණයි.

(මෙහි යමෙක් ප්‍රධානවශයෙන්ම ක්‍රියාවට ආධාරවේද හේ මුඛ්‍යාධාරනම, යමෙක් ක්‍රියානිශ්‍රය භූත කර්තෘ කර්මයන්ට ආධාරද හේ පරම්පරාධාරනම, යමෙක්වනාහි ඒකාන්තයෙන්ම ආධෙයයට ආධාරනොවේද හුදෙක් ආරම්මණික ධර්මයන්ට අරමුණුපමණක් වේද හේ තබ්බිසයාධාරනම, යමෙක්වනාහි කියනලද නමින්ම ආධාරභාවය නොවේද, එතකුදුවුවත් තදාසන්නභාවයෙන් ආධාරවේද හේ තදුපනිස්සයාධාරනම, 'ඛගඞ්ගම්හි ඔහාසො තිට්ඨති' යනු මුඛ්‍යාධාරයට උදාහරණය. 'පරියඞ්කෙ රාජා සෙති' යනු පරම්පරාධාරයට උදාහරණය, 'රූපෙසඤ්ඤා, යනු තබ්බිසයාධාරයට උදාහරණය, 'භික්ඛුසාසනෙවසි' යනු තදුපනිස්සයාධාරයට උදාහරණයි.)

මෙසේ ෂට්කාරකභෙද දක්වා අකාරකභෙදය දක්වන්නේ "**සාමි ආලපනඤ්චෙව**" යනාදිය කීහ.

79. සාමිආලපනඤ්චෙව, සම්බන්ධය හා ආලපනයද; නිද්ධාරණඤ්ච, නිර්ධාරණයද; ලක්ඛණං, ලක්ෂණයද; හෙතු, හෙතුවද; අච්චන්තසංයොගං, අත්‍යන්ත සංයොගයද යන; ඉමෙ, මොහු; අකාරකාමතා, අකාරකයෝයයි දතනාලද්දූහ. "සංති ධනං, සංසද්දො ධනවාචකො; සංධනං එතස්ස අත්ථී 'ති= සාමි, නිග්ගහිතස්ස මකාරං කත්වා අකාරස්ස දීඝං කත්වා එවං දට්ඨබ්බං; වත්ථුජාති ගුණක්‍රියා

**80 සාමි ආලපනං තඤ්ච නිද්ධාරණ මකාරකං,**
**ක්‍රියා සෙව තෙ සංයොගා භාවතො තූප ලක්ඛයෙ.**

**81 සාමිභෙදෙ අනෙකධා ජනකාදිප්පභෙදතො,**
**රඤ්ඤො පුත්තො ධනං හත්ථො සචාචාරමාදි ඤායතෙ.**

**82 සජීවාජීව භෙදෙන දුවිධාලපනං මතං,**
**භොති ඉච්ච භොසෙල ජානිතබ්බං යථාක්කමං.**

---

නාමෙහි සමුදායතො එකස්ස නීහරිත්වා ධාරණං විභජනං පුථුකරණං= නිද්ධාරණං; ලක්ඛීයති ලක්ඛිතබ්බ මනෙනා'ති= ලක්ඛණං; හිනොති පවත්තති ඵලං එතස්මා'ති= හෙතු; දබ්බගුණ ක්‍රියාහි අච්චන්තං නි රන්තරං සංයොගො= අච්චන්තසංයොගො" යනු ටීකායි.

80 තඤ්ච, එහි; සාමි, සම්බන්ධයද; ආලපනං, ආලපනයද; නිද්ධා රණං, නිද්ධාරණයද; (යනමේතුන්දෙන) අකාරකං, අකාරකයවේ; තෙසං, ඒ තුන්දෙනාගේ; ක්‍රියායෙවයොගා භාවතො ඉති, ක්‍රියාව ගේම යොගාභාවයෙන්; උපලක්ඛයෙ, අකාරකයයි උපලක්ෂණ කෙරේ.

මෙසේ අකාරකභාවයට කාරණාදක්වා සාමිභෙදය දක්වන් නේ **"සාමිභෙදෙ අනෙකධා"** යනාදිය කීහ.

81 සාමිභෙදෙ, සාමිභෙදය; ජනකාදිප්පභෙදතො, ජනකාදි † ප්‍රභෙදහෙයින්, හෙවත් ජනකසම්බන්ධ සාමිසම්බන්ධ අවයව සම්බන්ධ ගුණීසම්බන්ධ යනාදි භෙදයෙන්; අනෙකධා, අනෙකප්‍රකාරවන්නා හුය; රඤ්ඤොපුත්තො ධනං හත්ථො සචාචාරමාදි, රඤ්ඤොපුත්තො ධනං හත්ථො සචාචාරං යනාදිය; ඤායතෙ, උදාහරණපිණිස දන්නා ලැබේ. (මෙහි 'රඤ්ඤො පුත්තො' යනු ජනකසම්බන්ධයට උදාහරණ ය, 'රඤ්ඤො ධනං' යනු සාමිසම්බන්ධයට උදාහරණය, 'රඤ්ඤො හ ත්ථො' යනු අවයවසම්බන්ධයට උදාහරණය, 'රඤ්ඤො සචාචාරො' යනු ගුණීසම්බන්ධයට උදාහරණයි.)

මෙසේ සම්බන්ධයාගේ භෙදදක්වා අකාරකයන්ගේ ක්‍රමානුරූ ප ආලපනභෙදය දක්වන්නේ **"සජීවාජීව භෙදෙන"** යනාදිය කීහ.

82 ආලපනං, ආලපනය; සජීවාජීව භෙදෙන, සජීවාලපන අ

---

† "ආදිසද්දෙන ජඤ්ඤසං අවයවි ගුණවච්ච චාවකසමීප සමීපි ඨාන ඨානීයා දිවසෙන අනෙකවිධ සම්බන්ධො ගහෙතබ්බො" යි. ටීකා

83 ජාතිගුණ ක්‍රියානාම වසෙන චතුධා මතං,
ඛත්තියොව මනුස්සෙසු සාමා නාරි සුදස්සනියා.

84 පටිකෙසුව ධාවනෙතා ආනන්දො සාවකෙස්විති,
සමූහාවයවං ජාත්‍යා දිනා නිධාරණං මතං.

ජීවාලපනභෙදයෙන්; දුවිධං මතං, විප්‍රකාරයයි දන්නාලද්දේය; † හොති ඉච්ඡිව, හොති ඉච්ඡියනුද; හොසෙල, හොසෙලයනුද; යථාක්කමං, පිළිවෙලින්; ජාතිතබ්බං, දතයුත්තේය; (මෙහි 'හොති ඉච්ඡි' යනු සජීවාලපනයට උදාහරණය, 'හොසෙල' යනු අජීවාලපනයට උදාහරණයි.)

මෙසේ ආලපනයාගේ සප්‍රයොගභෙද දක්වා නිධාරණයාගේ භෙදදක්වන්නේ **"ජාතිගුණක්‍රියා"** යනාදිය කීහ.

83 ජාතිගුණක්‍රියා නාමවසෙන, ජාතිගුණක්‍රියා නාමයන්ගේ වශයෙන්; චතුධාමතං, (නිධාරණය) සතරපරිද්දෙකින් දන්නාලද්දේය; ඛත්තියොව මනුස්සෙසු, ඛත්තියොවමනුස්සෙසු යනුද; සාමානාරීසුදස්සනියා, සාමානාරිසුදස්සනියායනුදඋදාහරණයි; (මනුස්සෙසු ඛත්තියොව සුරතමො, නාරීසුසාමාදස්සනීයතමායී යෙදියයුතුයි.)

84 පටිකෙසු ධාවනෙතා ආනන්දො සාවකෙසුච, පටිකෙසුධාවනෙතා සාවකෙසු ආනන්දොයි යනුද; (පටිකෙසු ධාවනෙතා සීඝතමො, සාවකෙසු ආනන්දො බහුස්සුත තමොයි යොදනු.) ඉති, මේනයින්; සමූහාව යවං, සමූහසමුදායවශයෙන් අවයවය; ජාත්‍යාදිනා, ජාතිගුණක්‍රියා නාමවශයෙන්; නිධාරණං, නිධාරණය; මතං, දන්නාලද්දේය; (මෙහි 'මනුස්සෙසු ඛත්තියො සුරතමො' යනු ජාතිනිධාරණයට උදාහරණය, 'නාරීසුසාමාදස්සනීයතමා' යනුගුණනිධාරණයට උදාහරණය 'පටිකෙසු ධාවනෙතා සීඝතමො' යනු ක්‍රියානිධාරණයට උදාහරණය, 'සාවකෙසු ආනන්දොබහුස්සුතතමො' යනුනාමනිධාරණයට උදාහරණයි.)

මෙසේ නිර්ධාරණභෙදය දක්වා ලක්ෂණහෙතු අත්‍යන්ත සංයො

† ආලපනය, පුද්ගලාලපන ධර්මාලපන නජ්ජීවාලපනවශයෙන් තුන්වැදෑරුම්යයිද ශාබ්දිකයන්ට අභිමතයි.

මෙමකීහ අග්ගවංස ආචාර්යයෝ

"පුග්ගලාලපනෙචෙව ධම්මස්සා ලපනෙපිච
නිජ්ජීවාලපනෙචාති හොසද්දෙතී සුදිස්සති"යි.

85 ලක්ඛණහෙතු අච්චන්තං ක්‍රියත්ථස්ස අභාවතො,
තංයොගෙ තං නිමිත්තෙපි කාරකන්ති න වුච්චති.

86 භාවොච භාව වචනංච ලක්ඛ්‍යවචනඤ්ච ලක්ඛියං,
කිරියං ලක්ඛණං පුබ්බං පරන්තු ලක්ඛියං මතං.

87 තෙසං කත්තාච කම්මංච තබ්බචනං නාම ජානියා.
ගොසුච දුය්හමානෙසු ගතො දුද්ධෙසු ආගතො.

---

ගයන්ගේ තබ්භවන කාරණා දක්වන්නේ "ලක්ඛණහෙතු අච්චන්තං" යනාදිය කීහ.

85 ලක්ඛණහෙතු අච්චන්තං, ලක්ෂණයද හෙතුවද අත්‍යන්තයද යන මොවුන්; තං යොගෙ, ඒ ක්‍රියාවගේ සම්බන්ධයෙහිද, තංනිමිත්තෙපි, ඒ ක්‍රියාවගේ නිමිත්තවී මෙහිද; ක්‍රියත්ථස්ස; ක්‍රියාර්ථයාගේ; අභාවතො, අභාවයෙන්; කාරකන්ති නවුච්චති, (ලක්ෂණාදිය) කාරකයයි නොකියනු ලැබේ.

මෙසේ ලක්ෂණාදි අකාරකයන්ගේතබ්භවනකාරණාදක්වා භාව ශබ්දය තමාලක්ෂණ පර්‍යාය බැවින් පර්‍යායාන්තරයෙන් ලක්ෂණයාගේ හෙදදක්වන්නේ " භාවොච භාවවචනංච" යනාදිය කීහ.

86 භාවොච, භාවයද; භාවවචනංච, භාවවචනයද; ලක්ඛ්‍යවචනංච, ලක්ඛ්‍යවචනයද; ලක්ඛියං, ලක්ඛ්‍යයද; පුබ්බං, පූර්වවූ;කිරියං, දුහාදි ක්‍රියාව; ලක්ඛණං, ලක්ෂණනම; පරන්තු, පරභූතක්‍රියාව වනාහි; ලක්ඛියං මතං, ලක්ඛියයයි දන්නාලද්; (මෙහි භාවනම්=ගවයන් දොනාකල්හි පුරුෂතෙම ගියේය. දෙවිය කල්හි ආයේය. යනාදියෙහි පූර්වවූ දුහ්‍යමාන ක්‍රියාතොමේ පරභූත ගමනාදි ක්‍රියාවඋපලක්ෂණකෙරේ, එහෙයින් පූර්වවූ දුහ්‍යමානාදි ක්‍රියාවලක්ෂණනම; පරවූ ගමනාදි ක්‍රියාවලක්ෂණීය නම.)

ඒ භාවාදින්ට උදාහරණ දක්වන්නේ "තෙසං කත්තාච" යනාදිය කීහ.

87 තෙසං, ඒ විවිධක්‍රියාවන්ගේ; කත්තාච, කර්තෘද; කම්මංච, කර්මයද; තබ්බචනංනාම, ලක්ඛණවචනය ලක්ඛ්‍යවචනයනමැයි; ජානියා,දතයුක්තාහ;ගොසුදුය්හමානෙසු ගතොච දුද්ධෙසුආගතොච; ගොසුදුය්හමානෙසු ගතො යනුද දුද්ධෙසු ආගතොයනුද උදාහරණයි; ('ගොසුදුය්හමානෙසු පුරිසොගතොදුද්ධෙසුආගතො'යනතන්හි 'ගොසු'යනු දුහ්‍යමානවූ පූර්වක්‍රියාවට කර්මය, 'පුරිසො' යනුගමන ක්‍රියාවට කර්තෘයයි දතයුතුයි,එහි 'දුය්හමානෙසු'යනු භාවනාම;'ගොසු' යනු භා

**88** **ජනකො සම්පාපකො හෙතු ඤාපකොති තිධා මතො,**
**බීජාය අඞ්කුරො ජාතො තීරං නාවාය පාපුණි.**
**89** **සභාවො බ්‍යතිරෙකො ච කාරියො ඤාපකො තිධා,**
**උණ්හත්තා සීතත්තා අග්ගිධූමාය අත්ථීති ඤායති.**

---

වචනත්ථනාම, 'ගතො' යනු ලක්ඛියනාම 'පුරිසො' යනු ලක්ඛ්‍යවචනත්ථනාම¶

මෙසේ ලක්‍ෂණභෙද දක්වා හෙතුභෙද දක්වන්නේ **"ජනකො සම්පාපකො"** යනාදිය කීහ.

88 ජනකො, ජනකසංඛ්‍යාත හේතුවද; සම්පාපකො, සම්පාපක සංඛ්‍යාත හේතුවද; ඤාපකො, ඤාපකසංඛ්‍යාත හේතුවද; ඉති, මෙප්‍රකාරයෙන්; හෙතු, හේතුව; තිධාමතො, තුන්පරිද්දෙකින් දන්නාලද්දේය; බීජාය අඞ්කුරො ජාතො, බීජාය අඞ්කුරොජාතො යනුද; තීරංනාවාය පාපුණි, තීරංනාවාය පාපුණි යනුද; උදාහරණයි. (මෙහි 'බීජාය අඞ්කුරො ජාතො' යනු ජනකහේතුවට උදාහරණය, 'නාවාය තීරං පාපුණි' යනු සම්පාපකහේතුවට උදාහරණයි.)

89 ඤාපකො, ඤාපකයතෙම; සභාවො, සභාවඤාපකයද; බ්‍යතිරෙකොච, බ්‍යතිරෙකඤාපකයද; කාරියො, කාරියඤාපකයදැයි; තිධා, තුන්පරිද්දෙකින්වේ; උණ්හත්තා සීතත්තා අග්ගිධූමාය අත්ථීති, උණ්හත්තා අග්ගිඅත්ථි සීතත්තා අග්ගිනත්ථි ධූමාය අග්ගිඤායති යනු උදාහරණයි; (එහි 'උණ්හත්තා අග්ගිඅත්ථි' යනු සභාව ඤාපකහෙතුවට උදාහරණය. 'සීතත්තා අග්ගිනත්ථි' යනු බ්‍යතිරෙකඤාපකහෙතුවට උදාහරණය. 'ධූමාය අග්ගිඤායති' යනු කාරිය ඤාපකහෙතුවට උදාහරණයි)

අන්‍යවූ ත්‍රිවිධ හේතුවක්ද දක්වනලදී.

**"නානා පරම්පරාහෙතු පච්චක වසතො තිධා**
**කුසලස්ස කතත්තාච පුණ්ණත්තා පච්ච යස්සච.**
**උප්පන්නං හොති විඤ්ඤාණං වෙදිතබ්බං විභාවිනා.**
**සීලවතො පමුදෙද හොති පමුද හොති සුඛිතො,**
**සුඛිතස්ස පස්සම්භති කායො යොගස්ස භික්ඛුනො**
**දන්තො භොගවා හොති සීලනො හොති සුඛිතො**
**තස්මාදන්තඤ්ච සීලඤ්ච කාතබ්බං විඤ්ඤුනා සදා"** යි.

---

¶ "ආචරියා පන ලක්ඛණ ලක්ඛණවන්තං ලක්ඛ්‍ය ලක්ඛ්‍යවන්තන්ති වදන්ති, තත්ථ දුය්හමානෙ සූතිලක්ඛණං, ගොසූතිලක්ඛණවන්තං, ගතොති ලක්ඛ්‍යං පුරිසොති ලක්ඛ්‍යවන්තං" සී, ටීකා.

**90 කාලද්ධාන වසා මෙති අච්චන්ත සංයොගං මතං,**
**මාසංච යොජනද්ධානං සජ්ඣායතීති ඤායති.**

---

නානා, නානාහෙතු වශයෙන්ද; පරම්පරාචෙව; පරම්පරා හෙතුවශයෙන්ද; පච්චෙකවසතො, ප්‍රත්‍යෙක හෙතුවශයෙන්දැයි; හෙතු, හෙතුව; තිධා, තුන්පරිද්දෙකින්වේ; කුසලස්ස කතත්තාච, කාමාවචර කුසල්කළහෙයින්ද; පච්චයස්ස, (රූපලොකවස්තු මන ස්කාරසංඛ්‍යාත) ප්‍රත්‍යය; පුණ්ණත්තා, සම්පූර්ණහෙයින්ද; විඤ්ඤාණං චක්ෂුර්විඥානය; උප්පන්නං හොති, උපන්නේවේයයි; විභාවිනා, පණ්ඩිතයාවිසින්; වෙදිතබ්බං, දතයුත්තේය; (මෙහි 'කුසලස්ස කතත්තා' යනුද, 'පච්චයස්ස පුණ්ණත්තා' යනුද, නානාහෙතුවට උදාහරණයි.)

සීලතො, කාමාවචර සීලය හෙතුකොටගෙණ; පමුදෙ හොති, ප්‍රමොදය වෙයි; පමුදා, ප්‍රමොද හෙතුවෙන්; සුඛිතො හොති, සුවප ත්වෙයි; සුඛිතත්තා, සුවපත් හෙයින්; යොගස්ස භික්ඛුනො, යොගාවචර භික්ෂූහුගේ; කායො, නාමකය; පස්සම්භති, සංසිඳෙයි; ( මෙහි 'සීලතො' යනුද 'පමුදා' යනුද 'සුඛිතත්තා' යනුද පරම්පරා හෙතුවට උදාහරණයි.)

දානතො, දානය හෙතුකොටගෙණ; භොගවාහොති, භොගඇත්තේවෙයි; සීලතො, ශීලය හෙතුකොටගෙණ; සුඛිතොහොති, සුවපත්වෙයි; තස්මා, එහෙයින්, දානඤ්ච, දානයද; සීලඤ්ච, ශීලයද; විඤ්ඤුනා, නුවණැත්තහු විසින්; සදා, සියලු කල්හි; කත්තබ්බං. කට යුතුයි. (මෙහි 'දානතො' යනුද 'සීලතො' යනුද ප්‍රත්‍යෙක හෙතුවට උදාහරණයි )

මෙසේ හෙතුවගේ අකාරකභාවය දක්වා අත්‍යන්තසංයොගයා ගේ අකාරකභාවය දක්වන්නේ "**කාලද්ධාන වසා**" යනාදි කීහ.

90 අච්චන්තසංයොගං, අත්‍යන්තසංයොගය; කාලද්ධානවසා, කාල අත්‍යන්තසංයොග අද්ධාන අත්‍යන්තසංයොගවශයෙන්; මෙති, දෙදෙ නෙකැයි; මතං, දන්නාලද්දේය; මාසංච යොජනද්ධානං සජ්ඣායතීති මාසංච සජ්ඣායති යොජනද්ධානංච සජ්ඣායතියි; ඤායති, හැඟෙනු ලැබේ; (මෙහි 'මාසංච සජ්ඣායති' යනු කාල අත්‍යන්ත සංයොගයට උදාහරණය, 'යොජනද්ධානංච සජ්ඣායති' 'යනු අද්ධාන අත්‍යන්ත සං යොගයට උදාහරණයි.*)

---

* "තෙසුච විසු අච්චන්තසංයොගෙසු එකෙකො දබ්බගුණ ක්‍රියා වසෙන තිවිධො" යනු ටීකා වචනයි.

91 විසෙසනං ද්විධා තෙසං තුල්‍යාභින්නප්පභෙදතො,
තිලොක මහිතො නාථො ගොත්තෙන ගොතමොභවෙ

92 යස්සෙකත්ථ විභත්තිත්තං එක සංඛ්‍යා ක්‍රියා පිච,
සමාන ලිංගතා චෙව තුල්‍යාධිකරණං මතං.

93 ආසයාසයි භාවොච තබ්භාවො තබ්බිසෙසතා
ධම්මාධාර ඵලානඤ්ච එකතාති ඡධා මතං

---

මෙසේ ෂට්විධ අකාරකභෙද දක්වා විශෙෂණභෙදය දක්වන්නේ "විසෙසනං ද්විධා තෙසං" යනාදිය කීහ.

91 විසෙසනං, විශෙෂණය; තුල්‍යභින්නප්පභෙදතො, තුල්‍යාධිකරණවිශෙෂණය භින්නාධිකරණවිශෙෂණය යන මොවුන්ගේ ප්‍රභෙද වශයෙන්; ද්විධා, දෙපරිච්ඡෙදකින්වේ; තිලොකමහිතොනාථො, තිලොකමහිතො නාථො යනුද; ගොත්තෙන ගොතමො භවෙ, ගොත්තෙන ගොතමොභවෙ යනුද; තෙසං, ඔවුන්ට උදාහරණයි,(මෙහි 'තිලොකමහිතො නාථො' යනු තුල්‍යාධිකරණ විශෙෂණයට උදාහරණය. 'ගොත්තෙනගොතමොභවෙ' යනු භින්නාධිකරණවිශෙෂණයට උදාහරණයි.)

මෙසේ විශෙෂණයාගේ සාමාන්‍ය භෙද දක්වා තුල්‍යාධිකරණ කාරණා දක්වන්නේ "යස්සෙකත්ථ විභත්තිත්තං" යනාදිය කීහ.

92 යස්ස, යම්විශෙෂණාර්ථයක්හුගේ; එකත්ථවිභත්තිත්තං, සමානාර්ථසමාන විභක්තිභාවයක්වේද; එකසංඛ්‍යා ක්‍රියාපිච, සමානසංඛ්‍යා සමාන ක්‍රියාවක්වේද; සමානලිඞ්ගතාචෙව, සදෘශලිඞ්ගභාවයෙක්වේද; තුල්‍යාධිකරණංමතං, ඒ තුල්‍යාධිකරණයයි දන්නාලදී.

එබව දක්වනලදී.

"විසෙසෙස්ස දිස්සමානායා ලිඞ්ගසංඛ්‍යා විභත්තයො,
තුල්‍යාධිකරණෙ ඥෙය්‍යා කත්තබ්බා තා විසෙසනෙ"යි,

මෙසේ තුල්‍යාධිකරණයට තබ්භවනකාරණා දක්වා තුල්‍යාධිකරණයාගේ ෂට්විධ භෙදය දක්වන්නේ "ආසයාසයිභාවොච" යනාදිය කීහ.

93 ආසයාසයිභාවොච, ආසයාසයිභාව තුල්‍යාධිකරණ විශෙෂණයද; තබ්භාවො, තද්භාවතුල්‍යාධිකරණ විශෙෂණයද; තබ්බිසෙසතා, තත්තුල්‍යාධිකරණ විශෙෂණයද; ධම්මාධාරඵලානං, ධර්මාධාර ඵලයන්ගේ; එකතාතිච, එකත්වබවදූයි; ඡධා, ෂට්ප්‍රකාරයකින්; මතං, දන්නාලදී. (ධර්මෛකතා තුල්‍යාධිකරණ විශෙෂණයද, අධාරෛකතා

94 රත්තො පටො සුචො සෙතො කරිහත්ථි බුද්ධො ජිනො,
නීලොවණ්ණො අම්බොපානො සීහොඅනිලසෙසොනරො.

95 අම්බිලො ගරුකො හොති ලහුකො කටුකො රසො,
ගදුහතං සුසංයුත්තං ඔසධං දුයුත්තං විසං.

---

තුල්‍යාධිකරණ විශෙෂණයද; ඵලෛකත්‍යාතුල්‍යාධිකරණ විශෙෂණය දැයි කියායි;) “ආසයති එත්ථා’ති= ආසයො, දබ්බං; ආසයස්ස භාවො= ආසයී, ගුණං; තෙසංභාවො= තබ්භාවො, පදත්ථො; තෙසං දබ්බවාචීනංවා භාවො= තබ්භාවො, තබ්භාවාදීනං විසෙසනස්සභාවො තබ්බිසෙසතා, දබ්බං ධාරෙති පකාසෙතී’ති= ධම්මො, ගුණො; ආභුසො ගුණං ධාරෙතී’ති= ආධාරො, අධිකරණං; ඵලති පච්චතී’ති= ඵලං, විපාකො; ධම්මො ගුණංච ආධාරො අධිකරණංච ඵලං විපාකො චාති= ධම්මාධාරඵලා, තෙසං= එකස්ස සමානස්ස භාවො= එකතා, එකතා ආදියස්සසො= එකතාදි” යනු ටීකායී.

මෙසේ විශෙෂණයාගේ ෂට්ප්‍රකාර දක්වා ඊට උදහරණ දක්වන්නේ **“රත්තො පටො සුචො සෙතො,”** යනාදිය කීහ.

94 රත්තො පටො, රත්තො පටොයනුද; සෙතො සුචො, සෙතො සුචො යනුද;+ (ආසයාසයිභාවතුල්‍යාධිකරණවිශෙෂණය නම) කරී හත්ථි. කරී හත්ථි යනුද; බුද්ධො ජිනො, බුද්ධො ජිනො යනුද; (තද්භාවතුල්‍යාධිකරණ විශෙෂණය නම) නීලොවණ්ණො නීලො වණ්ණො යනුද; අම්බොපානො, අම්බොපානො යනුද; (තබ්බිසෙසතා තුල්‍යාධිකරණ නම.) අනිලො අසෙසා, අනිලො අසෙසා යනුද; සීහො නරො සීහො නරො යනුද, ධම්මෙකතා තුල්‍යාධිකරණ විශෙෂණ නම්.)

95 අම්බිලො ගරුකො හොති; අම්බිලො ගරුකොහොති යනුද; ලහුකො කටුකො රසො, ලහුකො කටුකො රසො යනුද; (ආධාරෙකතා තුල්‍යාධිකරණ විශෙෂණය නම) ගදුහතං සුසංයුත්තං ඔසධං, ගදුහතං සුසංයුත්තං ඔසධං යනුද; දුයුත්තංවිසං, දුයුත්තංවිසංයනුද (ඵලෛකතා තුල්‍යාධිකරණ විශෙෂණය නමැයි.) උදහරණ පිණිස දතයුතු

මෙසේ තුල්‍යාධිකරණයාගේ උදාහරණ සහිත ෂට්ප්‍රභෙද දක්වා

---

+ “සුචොසෙතොති ගාථාබන්ධන වසෙනවුත්තො, සෙතො සුචො ති වුත්තං හොති” යනු ටීකායි.

96 තතියා චෙව ඡට්ඨීච සත්තමී චෙති භෙදතො,
භින්නාධිකරණං තඤ්ච තිවිධන්ති විජානියං.

97 ගොත්තෙන ගොතමො නාථො එකූනතිංසා වයසා,
රඤ්ඤොච පුරිසො හොති න සෙට්ඨි බ්‍රාහ්මණාදිනං,
ගෙහෙව නිසින්නො හොති න සාලාදීසු බ්‍රාහ්මණො.

98 අට්ඨා රසහි සිප්පෙහි සම්පන්නො ඉමිනා අහං,
කාරණෙහි සමානෙහි වඤ්ඤුපගතො භවෙ.

සප්පයොගං කාරකභෙදං සමත්තං.

---

භින්නාධිකරණයාගේ භෙදත්‍රය දක්වන්ට " **තතියා චෙව ඡට්ඨීච**" යනාදිය කීහ.

96 තඤ්ච, ඒ විශෙෂණලක්ෂණයෙහි; තතියාචෙව, තෘතීයා විභක්ති භින්නාධිකරණයද, ඡට්ඨීච, ෂෂ්ඨීවිභක්ති භින්නාධිකරණයද; සත්තමීච ඉති, සප්තමී විභක්ති භින්නාධිකරණයදැයි; භෙදතො, ප්‍රභෙද වශයෙන්; භින්නාධිකරණං, භින්නාධිකරණය, තිවිධං ඉති, ත්‍රිවිධාකාරයයි; විජානියං, දතයුත්තේය.

මෙසේ භින්නාධිකරණයාගේ ත්‍රිවිධ භෙද දක්වා දන් ඊට උදාහරණ දක්වන්නේ "**ගොත්තෙන ගොතමො නාථො**" යනාදිය කීහ.

97 ගොත්තෙන ගොතමො නාථො, ගොත්තෙන ගොතමො නාථො යනුද; එකූනතිංසා වයසා, එකූනතිංසා වයසා යනුද; තෘතීයා භින්නාධිකරණයට උදාහරණය. රඤ්ඤොච පුරිසො හොති න සෙට්ඨි බ්‍රාහ්මණාදිනං, රඤ්ඤොච පුරිසො හොති න සෙට්ඨි බ්‍රාහ්මණාදිනං යනු ෂෂ්ඨී විභක්ති භින්නාධිකරණයට උදාහරණයි. ගෙහෙව නිසින්නොහොති න සාලාදිසු බ්‍රාහ්මණො, ගෙහෙව නිසින්නොහොති න සාලාදිසු බ්‍රාහ්මණො යනු සප්තමී විභක්ති භින්නාධිකරණයට උදාහරණයි.

මෙහි "ගොත්තෙන වයසා" යන දෙතැන තෘතීයාවිභක්තියෙන් භින්නාධිකරණ විශෙෂණයයි. "ගොතමො නාථො" යනු විශෙෂ්‍යයි "රඤ්ඤො න සෙට්ඨි බ්‍රාහ්මණාදීනං" යනු ෂෂ්ඨී විභක්ති භින්නාධිකරණවූ විශෙෂණයි. "පුරිසො" යනු විශෙෂ්‍යයි "ගෙහෙව න සාලාදීසු යනු සප්තමී විභක්තියෙන් භින්නාධිකරණවිශෙෂණයයි "නිසින්නො බ්‍රාහ්මණො" යනු විශෙෂ්‍යයි.

බහිද්ධා අබහිද්ධාවශයෙන් ක්‍රියාවිශෙෂණයද ද්විවිධවේ. සියලු ආල

**99 සමාසියන්ති නාමානි නාමානං සමසනං තථා,**
**සමාසොනාම විඤ්ඤෙය්‍යො සමසන වසෙකධා.**

---

පනය බහිධා ක්‍රියා විශෙෂණ නම්. (ක්‍රියාවෙන් බාහිරහෙයින් හා ක්‍රියාවහා සම්බන්ධ නොවන හෙයිනි.) මුදුං පචති යනාදිය අබ්භිධා ක්‍රියාවිශෙෂණය නම්. එහෙයින් කියනලදී.

"ක්‍රියා විසෙසනං නාම දුවිධං සමුදීරිතං
බහිධා ලපනං සබ්බ මබ්භිධා මුදුදිකං,, යි

විශෙෂණ විශෙෂ්‍යාඛ්‍ය පූර්‍වාපර ක්‍රියාවන්සම්බන්ධවද ඇත්තේය' එයින්කීහ.

"පුබ්බා පර සමානෙව කාලෙ හෙතුමහි ත්වාදයො
කම්මං තාතුන ගච්ඡති ච්‍ාරංපිදහිත්වාන නික්ඛමි
තක්කාත්ව දණ්ඩා පතිතො පීත්වාහොති සප්පිං බලං' යි

මේ ක්‍රියාවිශෙෂණයාගේ ප්‍රභෙද දක්වූ නියායි.

මෙසේ කාරක අකාරකභෙදදක්වා තමන්කාමරාගානුසය සහිත බැවින් තදනුරූප ප්‍රාර්ථනාව දක්වන්ට **"අට්ඨාරසහි සිප්පෙහි"** යනාදිය කීහ—

98 අහං, මම; ඉමිනා, මේ සප්‍රයොගවූ කාරක භෙද ප්‍රකාශක පුණ්‍යය හේතුකොටගෙණ; අට්ඨාරසහි සිප්පෙහි, අටලොස් වැදෑරුම් ශිල්පයෙන්; සම්පන්නො, සමන්විතවෙම්වා; කාරණෙහි, (එසේම අනාගතයෙහි මාර්‍ගඵලොත්පත්තියට හේතුවූ දානසීලාදී) කාරණයෙන්ද; සමානෙහි, මාහා සමානවූ සිත්ඇති ජනයන්හාද; වඤ්ජිහි, දූගැමින් ලද ඊප්සා අනුරූපව පවත්නාවූ පරිෂ්කාරවලින්ද; උපගතො භවෙ, සමන්විතවෙම්වා හෙවත් යුක්තවෙමවා.

**සප්‍රයෝගවූ කාරක භෙදය සමාප්තවූයේයි.**

———— ○෴○ ————

මෙසේ යසාචායර්‍යයන්වහන්සේ සප්‍රයොග කාරකභෙදය දක්වා දැන් ප්‍රයොග සහිත සමාසභෙදය දක්වන්ට**"සමාසියන්ති නාමානි"** යනාදිය කීහ.

99 නාමානි, යම් යුක්තාර්‍ථවූ පදකෙනෙක්; සමාසියන්ති, සංක්ෂෙප කරණුලැබෙද්ද; තථා, එසේ; නාමානං සමසනං, යුක්තාර්‍ථවූ නාමයන්ගේ සංක්‍ෂෙපකිරීම; සමසනවසා, සංක්‍ෂෙප වශයෙන්; සමාසොනාම, සමාසයනම්; එකධා. එක්ප්‍රකාරයකින්; විඤ්ඤෙය්‍යො; දතයුත්තේය.

100 සමාසොච විධාහොති නිච්චානිච්ච සමාසතො,
අරිඤ්ඤමො දීපඞ්කරො මුනිඤ්ඤදි නිදස්සනං.

101 සමාසොච විධාහොති ලුත්තා ලුත්තවසාථවා,
මුනින්ෙදා ගොධනොවෙති ගවම්පති නිදස්සනං.

102 සමාසොච විධාහොති යුත්තා යුත්ත වසාථවා,
නිදස්සනං මුනිඤ්ඤදි අසඩභොජනාදිතං.

---

මෙසේ සංක්ෂෙප ලක්ෂණ වශයෙන් එක ප්‍රකාර සමාසය දක්වා **විශෙෂ ලක්ෂණවශයෙන් විප්‍රකාරය දක්වන්නේ** අචාර්යයීතෙමේ **'සමාසොච වධාහොති"** යනාදිය කීහ

100 නිච්චානිච්චසමාසතො, නිත්‍යසමාස අනිත්‍යසමාස වශයෙන්; **සමාසොච.** සමාසයද; විධාහොති විප්‍රකාරවේ; අරිඤ්ඤමො දිපඞ්කරෝ, අරිඤ්ඤමො යන හා දිපඞ්කරෝ යනු: නිත්‍යසමාසයට උදාහරණය; කුම්භකාරෝ රථ ං ාරා ක ම්මජො විත්තජො යනාදියද ගෘහීතය. ("යො නිච්ච ං මව සමා‍ස ං හොති නකදාචි ංසා නිච්චසමාසො යො පන කදාචි යෙව හොති තනිච්චා සෙ අනිච්චසමාසො නාම" යනු ටීකායි.)

මුනිඤ්ඤ , මුනින්ෙදා යනාදිය; නිදස්සනං. නිදර්ශනයි; හෙවත් උදාහරණයි. 'මුනින්ෙදා' යනු අනිත්‍යසමාසයට උදාහරණයි. ආදි ශබ්දයෙන් ගොවින්ෙදා ගොධනො රාජපුරිංසා ජීවිතිඤ්ඤියං උපනගරං යනාදිය ගෘහිතයි.

මෙසේ නිත්‍යානිත්‍යවශයෙන් සමාසය දක්වා ලුත්ත අලුත්තවශයෙන් දක්වන්නේ "සමාසොච විධාහොති" යනාදිය කීහ.

101. අථවා, නොහොත්; ලුත්තාලුත්තවසා, ලුත්තසමාස අලුත්ත සමාසයන්ගේවශයෙන්; සමාසො, සමාසයනම; (චයනු පදපූරණයහිය) විධාහොති විප්‍රකාරවේ; මුනින්ෙදා ගොධනොච ඉති, මුනින්ෙදා ගොධනො යනුද; ගවම්පති, ගවම්පති යනුද:නිදස්සනං, නිදර්ශනයි.

(මෙහි "මුනින්ෙදා ගොධනො" යනු ලුත්තසමාසයට උදාහරණය. "ගවම්පති" යනු අලුත්තසමාසයට උදාහරණයි.)

මෙසේ සමාසයාගේ ලුත්තාලුත්ත වශයෙන් විප්‍රකාරය දක්වා යුත්තා යුත්ත වශයෙන්ද විප්‍රකාරය දක්වන්නේ **"සමාසොච විධාහොති"** යනාදිය කීහ.

102. අථවා, නොහොත්; යුත්තායුත්තවසා, යුත්තාර්ථසමාස අයුත්තාර්ථසමාසවශයෙන්; සමාසොච, සමාසයද; විධාහොති, දෙපරිදෙ

103 සමාසොච තිධාහොති සද්දත්ථ භෙදතො පුන,
අසඩ්ඪභොජී උරසිලොමො නීලුප්පලාදිකං.

104 ආදිමජ්ඣුත්තරානංවා ලොපතො තිවිධොභවෙ,
දන්තතො අස්සරථො රූපං ඉදං තෙසං නිදස්සනං

ක්වේ; මුනිත්‍යාදි, මුනිනෙයනාදියද; අසඩ්ඪභොජනාදිකං, අසඩ්ඪභොජනො යනාදියද; නිදස්සනං. නිදශීනයි, (මෙහි "මුනිනෙ" යනු යුක්තාර්‍ථසමාසයට උදහරණය;"අසඩ්ඪභොජනො"යනු අයුක්තාර්‍ථ සමාසයට උදහරණයි. ) "එත්ථ සඩ්ඪං වුච්චති මතකභත්තං සඩ්ඪං මතකභත්තං භුඤ්ජතී'ති=සඩ්ඪභොජී'නසඩ්ඪභොජී=අසඩ්ඪභොජී, යනුටීකායි.

මෙසේ ද්විප්‍රකාර සමාසය දක්වා ත්‍රිවිධාකාර සමාසය දක්වන්නේ "සමාසොච තිධාහොති" යනාදිය කීහ.

103 සද්දත්ථභෙදතො, ශබ්දසමාස අර්‍ථසමාස ශබ්දාර්‍ථසමාස භෙදයෙන්; ("එත්ථහි සද්දසමාසො නාම සද්දසෙසව සමාසොහොති නඅත්ථො යථා අසඩ්ඪභොජීත්‍යාදී. යස්මිං පන අත්ථොව සංසට්ඨො විභත්තියා අලුත්තත්තා පන නසද්දො සො අත්ථසමාසො නාම යථා උරසිලොමොත්‍යාදී, යස්මිං පන දුවිධොපි සංසට්ඨො සො සද්දත්ථ සමාසො නාම යථා නීලුප්පලංත්‍යාදි' යනු ටීකායි,) සමාසොච, සමාසයද; පුන, නැවත; තිධාහොති, ත්‍රිවිධාකාරවේ; අසඩ්ඪභොජී උරසිලොමො නීලුප්පලාදිකං, අසඩ්ඪභොජී උරසිලොමො නීලුප්පලං යනාදිය උදහරණයි.

(මෙහි 'අසඩ්ඪභොජී' යනු ශබ්දසමාසයට උදහරණය. 'උරසිලොමො' යනු අර්‍ථසමාසයට උදහරණය. 'නීලුප්පලං' යනු ශබ්දාර්‍ථ සමාසයට උදහරණයි. )

මෙසේ ශබ්දාර්‍ථවශයෙන් ත්‍රිවිධාකාරයදක්වා ලොපවශයෙන් ත්‍රිවිධාකාරය දක්වන්නේ "ආදිමජ්ඣුත්තරානංවා"යනාදිය කීහ.

104. වා, නොහොත්; ආදිමජ්ඣුත්තරානං, ආදිපද මධ්‍යපද උත්තරපදයන්ගේ; ලොපතො, ලොපවශයෙන්සමාසය; තිවිධො භවෙ, ත්‍රිවිධාකාරවේ; දන්තතො අස්සරථො රූපං, දන්තතො අස්සරථො රූපං යනු; ඉදං, මේ; තෙසං, ඔවුන්ට; නිදස්සනං, උදහරණයි.

(මෙහි 'දන්තතො' යනු ආදිපදලොප සමාසයට උදහරණය. දෙවෙන දන්තතො යන්නෙහි දෙවෙන යන පදය ලොපව දන්තතො කියාවේ; ආදී ශබ්දයෙන් අසෙසදනදන්තතො=දන්තතො; බ්‍රහ්මුනා දන්තතො= දන්තතො යනාදිය සංගෘහිතයි.

105 පුබ්බුත්තරූභයඤ්ඤත්ථං පධානත්ථ පධානතො,
චතුධා තිලොකං රාජපුත්තො ජෙළකංගොධනො.

---

'අසඤ්ඤරථො'යනු මධ්‍යපදලොපසමාසයට උදාහරණය. අසෙසන යුත්තො රථො යනතත්හිමධ්‍යපද ලොපව අසසරථො යනුවී; ආදිශබ්දයෙන් ඔඨෙන යුත්තො රථො=ඔඨරථො'සි කියාද ජම්බුයාලක්ඛිතො දීපො= ජම්බුදීපො කියාද ගෘහීතය, 'රූපං' යනු උත්තර පදලොප සමාසයට උදාහරණය. 'රූපෙසඤ්ඤා, යනතත්හි සඤ්ඤා යන උත්තරපදයහට ලොපව රූපං කියාවී; ආදි ශබ්දයෙන් රූපභවො= රූපං කියාද; අරූප භවො= අරූපං කියාද; කාම භවො= කාමං කියාදී ගෘහීතය.)

මෙසේ සර්ව සාධාරණවශයෙන් ෂඩ්විධ ත්‍රිවිධ සමාසයන් දක්වා සාමාන්‍ය නාමවශයෙන් චතුර්විධාකාරය දක්වන්නේ "පුබ්බුත්තරූභයඤ්ඤත්ථං" යනාදිය කීහ.

105. පුබ්බුත්තරූභයඤ්ඤාත්ථං, පූර්වඋත්තරඋභය අන්‍යවූ; පදත්ථං, සමාසපදයන්ගේ; අත්ථපධානතො, අර්ථප්‍රධාන වශයෙන්; හෙවත් පූර්වපදාර්ථප්‍රධානය උත්තරපදාර්ථප්‍රධානය උභයපදාර්ථප්‍රධානය අන්‍ය පදාර්ථප්‍රධානය යන මොවුන්ගේ වශයෙන්; චතුධා, (සමාසය) සතර පරිච්ඡෙදක්වේ; තිලොකං රාජපුත්තො අජෙළකං ගොධනො, තිලොකං රාජපුත්තො අජෙළකංගොධනො යනු උදාහරණවේ; (මෙහි'තිලොකං' යනු දිගුසමාසය නම, හේ පූර්වපදාර්ථප්‍රධානය නොහොත් අව්‍යයීභාව සමාසයහා දිගුසමාසය පූර්වපදාර්ථප්‍රධානය; උපනගරං පඤ්චින්ද්‍රියානි යනු උදාහරණයි; 'රාජපුත්තො' යනු තත්පුරුෂ සමාසය නම, හේ උත්තරපදාර්ථප්‍රධානය, රාජපුත්තො කඨිනදුස්සංයනු ඊටඋදාහරණවේ;'අජෙළකං'යනු චන්වසමාසයනම,චන්වසමාසකර්මධාරයසමාසය යනමොහු උභයපදාර්ථප්‍රධාන නම, සමණබ්‍රාහ්මණො කණ්හසප්පො යනාදිය උදාහරණවේ; 'ගොධනො' යනු බහුව්‍රීහි සමාසනම හේ අන්‍යපදාර්ථ ප්‍රධානය. ආගතසමණො ආරාමො, ජිතින්ද්‍රියො භගවා යනාදියඋදාහරණවේ.

මෙසේ සර්වසාධාරණ භෙදයද සාමාන්‍ය භෙදයද දක්වා දැන් සංඥාමුඛයෙන් විශෙෂභෙද දක්වන්නේ "අබ්‍යයීභාවොදිගුමඤ්ඤො" යනාදිය කීහ.

**106** **අබ්‍යයීභාවො දිගුචණ්ඩෙ කම්මධාරය මෙවච,**
**තප්පුරිසො බහුබ්බීහි සමාසො හොති ඡබ්බිධො.**

**107** **යථාරුචි තිලොකඤ්ච සමණබ්‍රාහමණාදයො,**
**නීලුප්පලං රාජපුත්තො ලම්බකණ්ණො යථාක්කමං.**

**108** **සත්තා බ්‍යයීයථා රුචාධිමාතරාධි රූපකං,**
**යථාක්කමං නිබ්බානු පනගරං අධිනච්චිදං.**

---

106 අබ්‍යයීභාවොච, අව්‍යයීභාව සමාසයද; දිගුච, දිගුසමාස යද; චන්‍දුච, චන්‍වසමායද; කම්මධාරය මෙවච; කර්මධාරය සමාසයද; තප්පුරිසොච, තත්පුරුෂ සමාසයද; බහුබ්බිහිච, බහුව්‍රීහි සමාසයදැයි (නාමවශයෙන්) සමාසො. සමාසයතෙම; ඡබ්බිධොහොති, ෂට්ප්‍රකාරවේ;

නාමවශයෙන් ෂට්ප්‍රකාරවූ ඒ සමාසයන්ට උදාහරණ දක්වන්නාවූ ආචාර්‍ය්‍යතෙම **"යථාරුචි තිලොකඤ්ච"** යනාදිය කීහ.

107 යථාරුචි, යථාරුචි යනු අබ්‍යයීභාව සමාසය; තිලොකං, තිලොකං යනු දිගුසමාසය; (ච යනු පදපූරණයයි;) සමණබ්‍රාහමණාදයො, සමණ බ්‍රාහමණා යනු හා ආදිශබ්දයෙන් ගෘහිත අසස්සකපිස්සනං යනු චන්‍දසමාසය; නීලුප්පලං නීලුප්පලං යනු කර්මධාරය සමාසය; රාජපුත්තො, රාජපුත්තො යනු තත්පුරුෂ සමාසය; ලම්බකණ්ණො, ලම්බ කණ්ණො යනු බහුව්‍රීහි සමාසයයි; යථාක්කමං, පිළිවෙලින් උදාහරණ දතයුත්තේය.

මෙසේ ෂට්විධ සමාසයට උදාහරණ දක්වා අබ්‍යයීභාව සමාසයාගේ ප්‍රභෙද හා උදාහරණ දක්වන්නේ **'සත්තාබ්‍යයී යථාරුචාධී'** යනාදිය කීහ.

108 අබ්‍යයී, අබ්‍යයීභාව සමාසය; සත්ත,ප්‍රථමාදීන්ගේ වශයෙන් සත්වැදෑරුම්වේ; (එනම් ප්‍රථමාවිභක්තිලොප අබ්‍යයීභාව සමාසය ද්විතීයාවිභක්ති ලොප අබ්‍යයීභාව සමාසය. තෘතියාවිභක්තිලොප අබ්‍යයීභාව සමාසය. චතුර්ථි විභක්තිලොප අව්‍යයීභාව සමාසය. පඤ්චමි විභක්තිලොප අබ්‍යයීභාව සමාසය ෂෂ්ඨි විභක්ති ලොප අබ්‍යයීභාව සමාසය.සප්තමී විභක්ති ලොප අබ්‍යයීභාව සමාසයයි කියායි) යථා රුචි, යථාරුචි යනු ප්‍රථමා විභක්ති ලොපය නම; (යා යාරුචි යථාරුචි) අධිමාතරං, අධිමාතරං යනුද්විතීයා විභක්ති ලොපය නම;(මාතරං අධිකිච්චපවත්තං අධිමාතරං) අධිරූපකං, අධිරූපකං යනු තෘතීයාවිභක්ති ලොපය නම (රූපෙන අධිකො අධිරූපකං)

109 දිගුවිධා සමාහාරා සමාහාර වසෙනච,
තිලොකනතු සමාහාරං පඤ්චින්ද්‍රියානිවාසමා.

110 චන්ද෧ විධා සමාහාර ඉතරීතර යොගතො,
අජෙළකං සමාහාරෙ සමණ බ්‍රාහමණාගරෙ.

යථාක්කමං, යථාක්කමං යනු චතුර්ථි විභක්ති ලොපය නම්; (කමස්ස අනු රූපං යථාක්කමං) නිබ්බානං, නිබ්බානං යනු පඤ්චමි විභක්ති ලොපය නම්; (වානතොනික්ඛන්තං නිබ්බානං) උපනගරං, උපන ගරං යනු ෂෂ්ඨි විභක්තිලොපය නම්; (නගරස්ස සමීපෙපවත්තතී ක ථා ඉති උපනගරං) අධිනවවං, අධිනවවං යනු සප්තමි විභක්ති ලොප ය නම්; (නවෙවස්සු අධිකා අධිනවවං) ඉදං, මේ නිදර්ශනයි, හෙවත් උදාහරණයි.

මෙසේ අව්‍යයීභාව සමාසභෙදයදක්වා උද්දෙස ගාථානුරූපව දිගුසමාසභෙද දක්වන්නේ "දිගු විධා සමාහාරා" යනාදිකීහ.

109 දිගු, දිගුසමාසයතෙම; සමාහාරාසමාහාරවසෙනච, සමාහාර අසමාහාර වසයෙන්ද; විධා, විප්‍රකාරවන්නේය; (තත්‍ථ සමාහරිත බ්බා චිතෙතන එකතො ආචරිතබ්බො සමූහං අපෙක්ඛිත්වා එකව චන විභත්‍යනෙතා සමාහාරොනාම යථාතිලොකං ත්‍යාදි; තප්ප ටිපක්ඛවසෙන නසමාහාරො අසමාහාරොති, යොපන එකදෙසං අ පෙක්ඛිත්වා බහුවචන විභත්‍යනෙතා අසමාහාරො නාම යථා පඤ්චින්ද්‍රි යානී ත්‍යාදි යනු ටීකායි.) තිලොකනතු තිලොකං යනු වනාහි; ස මාහාරං, සමාහාර දිගුසමාසයයි; පඤ්චින්ද්‍රියානිච, පඤ්චින්ද්‍රියානි ය නුද; අසමා, අසමාහාර දිගුසමාසයවේ.

මෙසේ දිගුසමාසයාගේ භෙද දක්වා චන්‍දසමාසයාගේ භෙද දක් වන්නේ "චන්දෙ විධා" යනාදිය කීහ.

110 සමාහර ඉතරීතර යොගතො, සමාහාර ඉතරීතර යොග වශයෙන්; (සමාහාර චන්‍දසමාසය ඉතරීතරයොග චන්‍දසමාසයයි යේයි) චන්දෙ, චන්ච සමාසය; විධා, දෙපරිද්දෙක්වේ; § අජෙළකං, අජෙළකං යනු; සමාහාරං, සමාහාර චන්චසමාසයනම්; සමණ බ්‍රා හමණා, සමණබ්‍රාහමණා යනු ඉතරො; අන්‍යවූ ඉතරීතර යොග චන් චසමාසයනමැයි දතයුතු.

§ "සමාහාරො සමුච්චයො තථා අන්‍වාචයො පිච
ඉතරීතරයොගොච චන්දෙනාම චතුබ්බිධො" යි
ශබ්දසාරාර්ථ ජාලිනියෙහිචන්‍දසමාසය සතර ආකාරයයි කියනලදි.

111 විසෙසන පුබ්බපරූභයපදං සම්භාවනා,
උපමාවධාරණඤ්ච කුනපාදි පුබ්බංනව.

112 නීලුප්පලං යථා තංහි යථා කාකාමං ගණුත්තමො,
සණ්හ සුඛුම ධම්මොච තථාව හෙතුපච්චයො.

113 සංඛසෙතං ගුණොයෙව ධනං ගුණධනං තථා,
කුසුමෙත්තාතු අභාවොච පාවචනනාති ඤායති.

---

මෙසේ ද්වන්දසමාසය දක්වා කර්මධාරය සමාසය දක්වන්නේ **"විසෙසන පුබ්බපරූභය පදං"** යනාදිය කීහ.

111 විසෙසන පුබ්බපරූභය පදං, විශෙෂණ පූර්වපද කර්මධාරය සමාසය විශෙෂණ උත්තරපද කර්මධාරය සමාසය විශෙෂණඋභයපද කර්මධාරය සමාසය; සම්භාවනා, සම්භවනාපූර්වපදකර්මධාරය සමාසය ද; උපමාව ධාරණඤ්ච,උපමාපූර්වපදකර්මධාරයසමාසයද අවධාරණ පූර්වපද කර්මධාරය සමාසයද; කුනපාදිපුබ්බං, කුයනනිපාත නයනනිපාතාදිය හා පයන උපසර්ගාදි පූර්වපදයද්දූයි; නව, කර්මධාරය සමාස යනව වැදෑරුම්වේ.

112. තංහි, ඒසියල්ල වනාහී; යථාකකාමං, පිළිවෙලින් දතයුත්තේය; යථා, නවවිධ කර්මධාරයට උදාහරණ මෙසේයි; නීලුප්පලං, නීලුප්පලං යනු විශෙෂණ පූර්වපද කර්මධාරයට උදාහරණය; ගණුත්තමො, ගණුත්තමො යනු විශෙෂණ උත්තරපද කර්මධාරයට උදාහරණය; සණ්හසුඛුමධම්මොච, සණ්හසුඛුමධම්මො යනුද විශෙෂණ උභය පද කර්මධාරයසමාසයවේ;තථා, තථායි අපරවාචකනිපාතයයි අනික් කාරණයෙක්ද ඇතැයි යන අර්ථයි; නොහොත්, තථා, එසේ; හෙතුපච්චයො, හෙතුපච්චයො යනුද; (චයනු සම්පිණ්ඩණාර්ථයි) සම්භාවනාපූර්වපද කර්මධාරය සමාසයවේ; (හෙතුහුත්වා පච්චයො හෙතුපච්චයො.) සමහර ආචාර්යවරු හෙතුපච්චයො යන පදය සම්භාවනාපූර්වපදය බවට සැකකෙරෙති. "යස්සපන සම්භාවනා සංඛාතං ඉති පදං හුත්වා සංඛාතපදංවා ලොපෙ, සො සම්භාවනා කම්මධාරයො නාම" යනු ටීකායි. †

113. සංඛසෙතං, සංඛසෙතං යනු උපමාපූර්ව පද කර්මධාරය සමා

---

† "යස්ස පන සම්භාවනා සංඛාතං ඉති හුත්වා සංඛාතපදං වා අවධාරනත්ථං එව පදංවා උපමායවාචකං ඉධවාදිපදංවා කුපදං නපදං වා පාදිපදංවා පුබ්බං හොති සො සම්භාවන පුබ්බපදාදි කම්මධාරයො නාම"යි සාරත්ථවිකාසිනී ටීකාපාඨයි.

114 තප්පුරිසො විධාහොති පඨමා මාදි භෙදතො,
පඨමා බ්‍රාහමණො හොති අමාදි භූමියං ගතො.

115 පඨමාච විධාහොති දිගුතුල්‍යත්ථ භෙදතො,
අපඤ්චමූලිදිගුච තුල්‍යත්ථොච අබ්‍රාහමණො.

---

සයවේ; සංඛෝ වියසෙතං සංඛසෙතං, සකක් මෙන් සුදුවූයේ සංඛ සෙත නම් ගුණො එව ධනංගුණධනං,ගුණයම ධනයවූයේ ගුණධන නම්;ගුණධනං,ගුණධනං යනුඅවධාරණපූර්වපද කර්මධාරයසමාසයන ම;තථා,අනිකුදු කාරණයක්ඇත;නොහොත්,තථා,එසේ;කුපුතෙතා, කුපුතෙතා යනු කු යනනිපාත පූර්වපද කර්මධාරය සමාසයවේ;(කුයනු පදපූරණයෙහිය) "කුච්ඡිතො පුතෙතා කුපුතෙතා." අභාවො, අභා වො යනු නයන නිපාත පූර්වපද කර්මධාරය සමාසයවේ; (ච යනු සමු ච්චයාර්ථයි.) නභාවො අභාවො; පාවචනං, පාවචනං යනු; පාදි පූර්ව පද කර්මධාරය සමාසයවේ; (පධානං වචනං පාවචනං යනු විග්‍රහයි.) ඉති, මේප්‍රකාරයෙන්; ඤෙයති, හැඟෙනු ලැබේ.

මෙසේ නව වැදෑරුම් කර්මධාරය සමාසයදක්වා තත්පුරුෂ සමා සය දක්වන්නේ "තප්පුරිසො විධාහොති" යනාදියකීග.

114 පඨමා මාදි භෙදතො, ප්‍රථමා තත්පුරුෂ අමාදි තත්පුරුෂ භෙදයෙන්; තප්පුරිසො තත්පුරුෂ සමාසය; විධාහොති, විප්‍රකාරවේ; මෙසේයි.අබ්‍රාහමණො,අබ්‍රාහමණොයනු;පඨමාහොති,ප්‍රථමාතත්පුරුෂ සමාසයවේ; ( යස්සපන සමාසස්සපුබ්බ පදෙ පඨමා විභත්ති ලොපො හොතිසොපඨමාතප්පුරිසොනාම)භූමියංගතො,*භූමියංගතොයනාදිය අමාදී, අමාදි තත්පුරුෂ සමාසයනම්වේ; (යස්සපන පුබ්බපදෙ දුතියා විභත්‍යාදිලොපො හොතිසොඅමාදිතප්පුරිසොනාම.) ආදිශබ්දයෙන් තෘතීයා චතුර්ථි 'පංචමිෂෂ්ඨීසප්තමී විභක්තීහු ගෘහීතයි.

මෙසේ තත්පුරුෂ සමාසයාගේ සාමාන්‍ය වශයෙන් විප්‍රකාරයද ක්වා ඔවුන් අතුරෙන් ප්‍රථමාතත්පුරුෂ සමාසයාගේ විශෙෂවශයෙ න් විප්‍රකාරයදක්වන්නේ „පඨමාච විධාහොති"යනාදියකීහ.

115 දිගුතුල්‍යත්ථ භෙදතො, දිගුසමාසකර්මධාරයසමාසභෙදයෙන්; පඨමාච, ප්‍රථමාතත්පුරුෂ සමාසයද; විධාහොති, විප්‍රකාරවේ;

---

* "එත්ථ භූමිගතොති වත්තබ්බෙ භූමියං ගතොති වාක්‍යවසෙන වුත්තං" යී—ටීකා.

116 අමාදි ඡබ්බිධො හොති දුතියා තතියා දිතො,
නිදස්සනං යථා තස්ස එවං ඤෙය්‍යං විජානතා.

117 භූමි ගතො දෙවදත්තො කඨිනදුස්ස මාදිකො,
අත්තජොරාජපුත්තො ගාමවාසි යථාක්කමං.

118 බහුබ්බිහි විධාහොති තග්ගුණා තග්ගුණ භෙදකො
ලම්බකණ්ණාදි තග්ගුණො පබ්බතාදි අතග්ගුණො.

---

මෙසේයි.අපඤ්චමූලී, අපඤ්චමූලීයනු; දිගුච, ප්‍රථමාවිභක්ත්‍යන්ත දිගු තත්පුරුෂසමාසයදවේ; අබ්‍රාහමණො, අබ්‍රාහමණොයනු; තුල්‍යහෙථා ච, ප්‍රථමා විභක්ත්‍යන්තකර්මධාරයතත්පුරුෂ සමාසයදවේ;

මෙසේ ප්‍රථමා තත්පුරුෂ සමාසයාගේ විප්‍රකාරය දක්වා අමාදි තත්පුරුෂ සමාසයාගේ ෂට්ප්‍රකාරය දක්වන්නේ "අමාදිඡබ්බිධො හොති,, යනාදියකීහ.

116 දුතියා තතියාදිතො, විතීයා තෘතීයා චතුර්ථිආදීන්ගේභෙ දයෙන්; අමාදි, අමාදිතත්පුරුෂ සමාසය; ඡබ්බිධොහොති, ෂට්ප්‍රකා රවේ; තස්ස. ඒ අමාදිතත්පුරුෂ සමාසයාගේ; නිදස්සනං උදාහරණ; යථා, යම්සේවේද; විජානතා, නුවනැත්තහුවිසින්; එවංඤෙය්‍යං, මෙ සේ දතයුතතේයි.

117. භූමිගතො, භූමිගතොයනු;විතීයා විභක්ත්‍යන්තතත්පුරුෂ සමාසයවේ; භූමිංගතො කියා විතීයා විභක්ත්‍යන්තවිය;දෙවදත්තො, දෙවදත්තොයනු තෘතීයාවිභක්ත්‍යන්ත තත්පුරුෂසමාසයවේ;"දෙවෙ නදත්තො" කියා තෘතීයාවිභක්ත්‍යන්තවී; කඨිනදුස්සමාදිකො, කඨි නදුස්සං යනාදිය; චතුර්ථිවිභක්ති තත්පුරුෂසමාසයවේ; "කඨිනස්ස ආභතං දුස්සං"සී චතුර්ථි විභක්ත්‍යන්තවී; අත්තජො, අත්තජොයනු පඤ්චමීවිභක්ති තත්පුරුෂ සමාසයවේ; "අත්ත තො ජාතො,, කියා පඤ්චමී විභක්ත්‍යන්තවී; රාජපුත්තොච, රාජපුත්තො යනුද ෂෂ්ඨි විභක්ති තත්පුරුෂ සමාසයවේ; "රඤ්ඤා පුත්තො" කියා ෂෂ්ඨිවිභ භක්ත්‍යන්තවී;ගාමවාසී, ගමවාසීයනු සප්තමිවිභක්තිතත්පුරුෂසමා සයවේ; "ගාමෙවාසී"සි සප්තමීවිභක්ත්‍යන්තවී; යථාක්කමං, මේඋදා හරණයන් පිළිවෙලින් දතයුත්තාහුය.

මෙසේ තත්පුරුෂසමාසය දක්වා ඊටඅනතුරුව බහුව්‍රීහි සමා සයදක්වන්නේ "බහුබ්බීහිවිධාහොති" යනාදිය කීහ.

118 තග්ගුණා තග්ගුණභෙදතො, තග්ගුණසංවිඥානබහුව්‍රීහිය

**119** **අඤ්ඤපද පභෙදෙන ආදිමජ්ඣන්තතො තිධා,**
**පත්තහත්ථො අනන්තනෙතාව ජිතනහත්ථො යථාක්කමං.**

---

මාස තද්ගුණසංවිඥාන බහුව්‍රීහි සමාසභෙදයෙන්; බහුබ්බීහි, බහුව්‍රීහි සමාසය; ද්විධ හොති, දෙපරිච්ඡෙදක්වේ; ලම්බකණ්ණාදි, ලම්බකණ්ණායනාදිය; තග්ගුණා; තද්ගුණවි සංඥාන බහුව්‍රීහි සමාසය නම්වේ; (තත්ථතස්සගුණීභූතස්ස අඤ්ඤපදත්ථස්ස ගුණො ගුණභූතො සමාසපදත්ථෙතාතග්ගුණො තග්ගුණා සංවිඤ්ඤාතබ්බො තග්ගුණසංවිඤ්ඤාණො + යනු ටීකායි.) පබ්බතාදි අතග්ගුණා. පබ්බතොයනාදිය අතද්ගුණ සංවිඥානබහුව්‍රීහි සමාසයවේ.

මෙසේ තද්ගුණාදි සාමාන්‍යවශයෙන් ද්විප්‍රකාරයදක්වා අන්‍යපද ලක්ෂණවශයෙන් ත්‍රිවිධාකාරය දක්වන්නේ “**අඤ්ඤපද පභෙදෙන**” යනාදියකීන.

119. ආදිමජ්ඣන්තතො, ආදි මධ්‍ය අන්ත වශයෙන්; අඤ්ඤ පද පභෙදෙන, අන්‍ය පද ප්‍රභෙදයෙන්; ( ආදියෙහි අන්‍යපදය මධ්‍යයෙහි අන්‍ය පදය අන්තයෙහි අන්‍ය පදය යන මේ ප්‍රභෙදයෙනැයි සේයි. ) තිධා, බහුව්‍රීහි සමාසය තුන් පරිච්ඡෙදක් වේ; පත්තහත්ථො, පත්තහත්ථො යනු ආදි අන්‍ය පද බහුව්‍රීහි සමාසයට උදහරණය. “යස්ස පත්තා හත්ථෙසු කියා අන්‍යපදආදියෙහි ඇතිව සමාසවාක්‍යවේ;(යස්ස සමාසස්ස අඤ්ඤපදං ආදිම්හි හොති සො ආදි අඤ්ඤ පද බහුබ්බීහි නාම ) අනන්තනෙතාව, අනන්තනෙතා යනුද මධ්‍යඅන්‍යපදයඇති බහුව්‍රීහි සමාසයට උදහරණයි. “ නාසස්ස අන්තො ” කියා සමාස වාක්‍ය වේ; (යස්ස පන අඤ්ඤපදං මජ්ඣෙහොති සො මජ්ඣෙ අඤ්ඤපද බහුබ්බීහි නාම.) ජිතනහත්ථො, ජිතනහත්ථො යනුද අන්තයෙහි අන්‍ය පද බහුව්‍රීහි සමාසයට උදහරණය:“ජිතෙනනාහත්ථො යස්සසො”කියා සමාසවාක්‍යවේ;(යස්සපන අඤ්ඤපදං අන්තෙහොති සොඅන්ත අඤ්ඤ පද බහුබ්බීහි නාම;) අන්‍යපදය නම්ය ශබ්දාර්ථයයි. යථාක්කමං, මේ උදහරණ පිළිවෙලින් දතයුතුතාහ.

මෙසේ බහුව්‍රීහි සමාසයාගේ අන්‍ය පද වශයෙන් හෙද දක්වා විභක්ත්‍යන්තයන්ගේ වශයෙන් හෙද දක්වන්නේ “ සත්තවිධො බහුබ්බීහි ” යනාදිය කිහ.

---

+ තෙසු අඤ්ඤපදත්ථෙසු ගුණවිසෙසතාති තෙසං සංවිඤ්ඤාණං ගහණං තග්ගුණසංවිඤ්ඤාණං, තග්ගුණසංවිඤ්ඤාණතො අඤ්ඤං අතග්ගුණසංවිඤ්ඤාණං” සි— ෂඩ්භාෂා පරමෙශ්වරවචනයි.

120 සත්තවිධො බහුබ්බීහි පඨමාදි වසා පන,
නිග්‍රොධ පරිමණ්ඩලො ආගත සමණො තථා.

121 ජිතින්ද්‍රියො දින්න සුංකො නිග්ගත ජනකො තථා,
ලම්බකණ්ණා සුසස්සාති යථාක්කමං විජානියා.

122 ද්වන්දෙන දිගුනා කම්මධාරයෙන සමුච්චය,
තුල්‍යත්ථ වාචකා සෙසා නාමානුරූප වාචකා.

---

120. පඨමාදිවසාපන, ප්‍රථමාදීන්ගේ වශයෙන් වනාහි;බහුබ්බීහි, බහුව්‍රීහි සමාසය;සත්තවිධො, සප්තප්‍රකාරවේ; මෙසේයි; නිග්‍රොධ පරිමණ්ඩලො, නිග්‍රොධපරිමණ්ඩලොයනුද; (ප්‍රථමාවිභක්ත්‍යන්ත අන්‍ය පද බහුව්‍රීහි සමාසය "නිග්‍රොධො ඉව පරිමණ්ඩලො යො රාජ කුමාරො සොයං= නිග්‍රොධපරිමණ්ඩලො" කියා සමාසවාක්‍යවේ; මෙහි යො යනු ප්‍රථමාන්තයි.) තථා, එසේ; ආගතසමණො,ආගතසමණො යනුද; (ද්විතීයාවිභක්ති අන්‍යපද බහුව්‍රීහි සමාසයවේ. "ආගතාසමණායංසො= ආගතසමණො" කියා වාක්‍යවේ; මෙහි යායනු ද්විතීයාන්තයයි.)

121 ජිතින්ද්‍රියොච, ජිතින්ද්‍රියො යනුද; (තෘතීයාවිභක්ති අන්‍යපද බහුව්‍රීහි සමාසයයි; "ජිතානි ඉන්ද්‍රියානි යෙන සො= ජිතින්ද්‍රියො" කියා විග්‍රහවිමෙහි යෙන යනු තෘතීයා විභක්ත්‍යන්තයවී.) දින්නසුංකොච, දින්නසුංකො යනුද; (චතුර්ථිවිභක්ති අන්‍යපදබහුව්‍රීහිසමාසයවී, "දින්නො සුංකො යස්සසො= දින්නසුංකො" කියා වාක්‍යයි. මෙහි යස්ස යනු චතුර්ථී විභක්ත්‍යන්තයි) නිග්ගත ජනකොච, නිග්ගත ජනකො යනුද; (පඤ්චමී විභක්ති අන්‍යපද බහුව්‍රීහි සමාසයයි. නිග්ගතා ජනා යස්මා ගාමා සො යං= නිග්ගතජනො කියා වාක්‍යයි. මෙහි යස්මා යනු පඤ්චමී විභක්ත්‍යන්තයි) තථා, එසේ; ලම්බකණ්ණාච, ලම්බකණ්ණායනුද; (ෂෂ්ඨීවිභක්ති අන්‍යපදබහුව්‍රීහිසමාසයයි, "ලම්බා කණ්ණා යස්ස සො යං= ලම්බකණ්ණා"කියා වාක්‍යයි. මෙහි යස්ස යනු ෂෂ්ඨීවිභක්ත්‍යන්තයි.) සුසස්සා, සුසස්සා යනුද; (සප්තමී විභක්ති අන්‍යපද බහුව්‍රීහි සමාසයයි. "සුන්දරානි සස්සානි යස්මිං ජනපදෙ සො යං= සුසස්සා" කියා වාක්‍යයි. මෙහි යස්මිං යනු සප්තමී විභක්ත්‍යන්තයි) ඉති, මේප්‍රකාරයෙන්; යථාක්කමං, පිළිවෙලින්; විජානියා, උදාහරණ දතයුත්තාහුය.

මෙසේ සියලු නාමයන්ට ඒ ඒ ලක්ෂණයෙන් භෙද දක්වා දැන් ඔවුන්ගේම වාචකභෙද දක්වන්නේ "**ද්වන්දෙන දිගුනා**" යනාදියකීහ.

122 ද්වන්දෙන, ද්වන්ද්වසමාසයද; දිගුනා, දිගුසමාසයද; කම්මධා

128 කම්මධාරයො චෙච තප්පුරිසොච ලාභිනො,
තයො පරපදෙ ලිඞ්ගං බහුබ්බීහි පදන්තරෙ.

124 දිගුචා බ්‍යයීභාවොච නපුංසකෙච නියතො,
වාචකාපන විඤ්ඤෙය්‍යා භත්තිපදවි රූපතො.

125 පුඤ්ඤෙනානෙන සංසාර සංඛිප කාරකො භවෙ,
අභෙජ්ජපරිසො අඤ්ඤ සතිමාච භවා භවෙ

සප්පභෙදාගං සමාසභෙදං සමත්තං

——— ඃoඃ ———

---

රයෙන, කර්‍මධාරයසමාසයද; සමුච්චය තුල්‍යත්‍ථ වාචකා,සමුච්චයාර්‍ථ තුල්‍යාර්‍ථවාචකයහ;† සෙසා,සෙසුඅව්‍යයීභාව තත්පුරුෂබහුව්‍රීහිසමාසයෝ;නාමානුරූප වාචකා, සංඥනුරූප වාචකයෝ වෙන.

මෙසේ ෂට්විධ සමාසයන්ට වාචක දක්වා දැන් ඒසමාසයන්ගේ ලිඞ්ග නියමය දක්වන්නේ "කම්මධාරයො චෙච" යනාදිය කීහ.

123 කම්මධාරයොච, කර්‍මධාරයසමාසයද; චෙචච, චන්‍ද සමාසයද; තප්පුරිසොච, තත්පුරුෂ සමාසයද යන; තයො, තුන්දෙන; පරපදෙලිඞ්ගං ලාභිනො, පරපදයෙහි ලිඟු ලබන්නාහුය; බහුබ්බීහි, බහුව්‍රීහිසමාසය; පදන්තරෙ, අන්‍යපදයෙක්හි ලිඟු ලබන්නෙය.

124 දිගුච, දිගුසමාසයද; අබ්‍යයීභාවොච, අව්‍යයීභාව සමාසද; නපුංසකෙ එව, නපුංසක ලිඟුයෙහිම; නි..තෙ., නි..තවූයේය; වාචකා පන, වාචකයෝ වනාහි; විභත්‍ති පදරූපතො, විභක්ති පද රූපවශයෙන්; විඤ්ඤෙය්‍යා, දතයුත්තාහුය.

මෙසේ ෂට්විධ සමාසභෙදය දක්වා තදනුරූපවූ ප්‍රාර්‍ථනාව දක්වන්නේ යසාචාර්‍ය්‍යතෙම "පුඤ්ඤෙනානෙන" යනාදිය කීහ.

125 අනෙන පුඤ්ඤෙන,මේ සමාසභෙදය ප්‍රකාශකලාවූ පුණ්‍යය හේතුකොටගෙණ; භවා භවෙ, භවයක් භවයක් පා..ා; අභෙජ්ජපරිසො, අභෙද්‍ය පිරිස් ඇත්තෙක් ..වම්වා; පඤ්ඤා සතිමාච, ප්‍රඥව හා සමෘතිය ඇත්තෙක් වෙම්වා; සංසාර සංඛෙපප කාරකො භවෙ;

---

† "තෙසු පන චන්‍ද්‍ර සමුච්චයත්‍ථවාචකො..ා දිගු ක..ධාරයා තුල්‍යත්‍ථවාචකා ති අත්‍ථො" සීද " වාච ..ාහි එත්‍ථ ණ්වුපපච්චයස්ස වුත්තත්තා කත්වත්‍ථෙ කරණ වචනන්ති අත්‍ථො" යි. චන්‍දෙන යනාදිය කාත්‍ර අර්‍ථයෙහි කරණයසිද ටීකාවෙහි කියනලදී.

126 තෙසං සද්ද සමූහානං හිතානුකූලකං ඵවා,
තෙසං සිස්සස සමූහානං තද්ධිතන්ති පවුච්චති.

127 සාමඤ්ඤබ්‍යය භාවෙන තද්ධිතං තිවිධං භවෙ,
සාමඤ්ඤං විවිධං තත්‍ථ ලිඞ්ගහි වචනෙහිච.

128 අබ්‍යයන්තු තථා නෙව භාවො භාවෙන යුත්තකො,
වාසිඪාදි තථත්තාදි ධම්මමාදි නාදස්සනං.

---

(අනතයෙහි) සංසාරය සංක්‍ෂෙප කරනනෙක් වෙම්වා, ඉෙවත් සිව් පිළිසිඹියාපත් රහත්ව නිවන් දකිම්වා යි කියා ප්‍රාර්ථනා කළහයි දතයුතු .

සද්ප්‍රයොග සමාස භෙදය සමාප්තවූයේය.

---

මෙසේ උදාහරණ සහිත සමාසභෙදය දක්වා යසාචාර්‍ය්‍යතෙම තද්ධිතභෙදය දක්වන්නේ ' තෙසං සද්ද සමූහානං" යනාදියකීහ.

126 තෙසං සද්ද සමූහානං, ගොත්‍රාදිවාචකවූ වාසිඪාදි ඒශබ්ද සමූහයන්ට; හිතානුකූලකං, හිතානුකූලවූසේ; අථවා, නොහොත්; තෙසං සිස්ස සමූහ නං,(නිරුක්ති ශාස්ත්‍රයශ්‍රවණොද්ග්‍රහණ ධාරණාදියෙහි අභියුක්තවු) ඒ ශිෂ්‍ය සමූහයන්ට;හිතානුකූලකං, හිතානුකූලවූයේ හෙවත් ප්‍රයෝජනවූයේ; තද්ධිතන්ති පවුච්චති, තද්ධිතයයි කිය නුලැබේ; "තෙයං අපච්චාදි අත්‍ථානං වා හිතං තද්ධිතං, තෙසං ගොත්තාදි අත්‍ථානංවා හිතං තද්ධිතං, තෙසං සවණෙ අභියුත්තානං වා හිතං තද්ධිතං,, යනු ටීකායි.

මෙසේ තද්ධිතශබ්දයට විග්‍රහදක්වා දැන් තද්ධිත භෙද දක්වන්නේ "සාමඤ්ඤ බ්‍යය භාවෙන" යනාදිය කීහ.

127 සාමඤ්ඤබ්‍යයභාවෙන, සාමඤ්ඤ තද්ධිත අව්‍යය තද්ධිත භාව තද්ධිත වශයෙන්; තද්ධිතං, තද්ධිතය; තිවිධංභවෙ, ත්‍රිවිධාකාරවේ; තත්‍ථ, ඒ ත්‍රිධවි තද්ධිතයන් අතුරෙන්; සාමඤ්ඤං, සාමඤ්ඤ තද්ධිතය; ලිඞ්ගහිවචනෙහිච, ලිඞ්ගවචනයන් හා සාධාරණවීම කරණකොට ගෙණ; විවිධං, අනෙකප්‍රකාරවේ; (ස්ත්‍රී පුං නපුංශක යන ලිඞ්ගත්‍රය හා එකවචන බහුවචන යන විවිධ වචනයන්හා ද සාධාරණව තැනෙන බැවින් සාමඤ්ඤ තද්ධිතය අනෙකප්‍රකාරයයි සේයි.)

128 අබ්‍යයන්තු, අව්‍යය තද්ධිතය වනාහි: තථානෙව, එසේනො

129 ගොත්තතර රාග ජාත්‍යාදි සමූහට්ඨාන නිස්සිතං,
උපමා බහුලං සෙට්ඨං අස්සත්ථි පකති පූරණං,
සඞ්ඛ්‍යා විභාගං සාමඤ්ඤං පණ්ණරසවිධං භවෙ.

130 වාක්‍යත්තු විජ්ජමානස්ස පදස්සාගමම්ම ලොපනං,
තානි නාමානි ඤෙය්‍යානි බුද්ධිමන්තෙනහි තං යථා

---

මවේ; (ලිඟු හා වචනයත් කරණකොටගෙණ අනෙකප්‍රකාර වනාව නිපාත සමූහයැකැයි යනුහාවයි) “ලිඞ්ගහි වචනෙහිච අබ්‍යයංභූතා පකති භූතානෙව හොන්ති තං අබ්‍යය තද්ධිතං නාම” යනු ටී කා යි. භවො, භාවයතෙම; භාවෙන යුත්තකො, භාවයෙන් යුක්තවූයේය; (භවන්ති සද්දබුද්ධියො එතස්මා‘ති භාවො.) වාසිට්ඨාදි, වාසිට්ඨො යනාත හා ආදිශබ්දයෙන්ගත් නාවිකො යනාදියද; තථත්තාදි, අව්‍යය තද්ධිතයට තථත්තා යන්න හාආදිශබ්දයෙන්ගත්යථත්තායනාදියදඋදාහරණවේ, (“තිහිලිඞ්ගහි අබ්‍යයං පන සො පකාරො තථා සාපකාරා තථා තං පකාරං තථා එවං ලිඞ්ගහි අබ්‍යයං නාම, සො පකාරො තථා තෙ පකාරා තථා තං පකාරං තථා තෙ පකාරෙ තථා තෙන පකාරෙන තථා තෙහි පකාරෙහි තථා තස්ස පකාරස්ස තථා තෙසං පකාරානං තථා තස්මා පකාරා තථා තෙහි පකාරෙහි තථා තස්මිං පකාරස්මිං තථා තෙසු පකාරෙසු තථා එවං වචනෙහි අබ්‍යයං නාම” යනු ටිකායි.) ඔපම්මාදි නිදස්සනං, භාවතද්ධිතයට ඔපම්මං යන්නහා ආදිශබ්දයෙන්ගත් ආරොග්‍යං ආරිස්සංයනාදියනිදර්ශනයි.

මෙස් ත්‍රිවිධාකාර තද්ධිතය දක්වා ඔවුන් අතුරෙන් ප්‍රථමකොට සාමඤ්ඤ තද්ධිත භෙද දක්වන්නේ “ගොත්ත තර රාග ජාත්‍යාදි” යනාදිය කීහ.

129 ගොත්ත තර රාග ජාත්‍යාදි, ගොත්ත තද්ධිතයද තරත්‍යාදි තද්ධිතයද රාගාදි තද්ධිතයද ජාත්‍යාදි තද්ධිතයද; සමූහට්ඨානනිස්සිතං, සමූහ තද්ධිතයද ඨාන තද්ධිතයද නිස්සිත තද්ධිතයද; උපමා බහුලං, උපමා තද්ධිතයද බහුල තද්ධිතයද; සෙට්ඨං, සෙට්ඨ තද්ධිතයද; නොහොත් විශෙෂ තද්ධිතයද; අස්සත්ථි පකති පූරණං, අස්සත්ථි තද්ධිතයද පකති තද්ධිතයද; පූරණ තද්ධිතයද; සංඛ්‍යා විභාගං, සංඛ්‍යා තද්ධිතයද විභාග තද්ධිතයදැයි කියා; සාමඤ්ඤං, සාමඤ්ඤ තද්ධිතය; පණ්ණරසවිධංභවෙ, පසළොස් වැදෑරුම්වේ.

මෙසේ තද්ධිතයාගේ භෙද දක්වා දැන් නාමයන්ගේ ලභ්‍යමාන කාරණා දක්වන්නේ “වාක්‍යත්තු විජ්ජමානස්ස” යනාදිය කීහ.

130 වාක්‍ය, තද්ධිත වාක්‍යාවස්ථාවෙහි; (තු ශබ්ද පක්ෂාන්තරා

131 වාසිඪං නාවිකං නිලං පුරිමො ජනතා තථා,
රජනීයං දුටඨුල්ලංච ධූමායිතත්ත මෙවච.

132 අභිජ්ඣාලුච සෙඨොච සඩො මණිමයං තථා,
පඤ්චමොච චිකං මිධා ඉදං තෙසං නිදස්සනං.

---

වීයි) විජ්ජමානස්ස, විද්‍යමානවූ; පදස්ස, ප්‍රත්‍යය නිපදයාගේ; ලොප නං ආගමම, ලොපයනිසා; තානි නාමානි, ඒ අපච්චාදි නාමයෝයයි හෙවත් ගොත්‍රාදි නාමයෝයයි; බුඩිමන්තෙහි, බුඩිමතුන්විසින්; ඤෙය්‍යානි, දතයුත්තාහුය, තං යථා, හේ මෙසේයි.

131 වාසිඪංච, වාසිඪං යනුද; නාවිකංච, නාවිකං යනුද; නීලංච, නීලංයනුද; පුරිමොච, පුරිමො යනුද, ජනතාච, ජනතායනුද; තථා, අනිකුදු කාරණයෙක් ඇත; නොහොත් එසේ; රජනීයංච, රජනීයං යනුද, දුටඨුල්ලංච, දුටඨුල්ලං යනුද; ධූමායිතත්තං එවච, ධූමායිතත්තං යනුද;

132 අභිජ්ඣාලුච, අභිජ්ඣාලු යනුද; සෙඨොච, සෙඨො යනුද සඩොච, සඩො යනුද; මණිමයංච, මණිමයං යනුද; තථා, එසේ; පඤ්චමොච, පඤ්චමො යනුද; චිකංච, චිකංයනුද; මිධාච, මිධා යනුද; ඉදං, මේ; තෙසං, ඒ පසළොස්වැදෑරුම් සාමඤ්ඤ තඬිතයන්ට; නිදස්සනං, නිදර්‍ශනයි හෙවත් උදාහරණයි.

මෙහි 'වාසිට්ඨං' යනු ගොත්ත තඬිතයට උදාහරණය, (වසිඪස්ස අපච්චං වාසිඨො වසිඪස්ස අපච්චං වාසිට්ඨී වසිඪස්ස අපච්චං වාසිඪං යනාදියවේ) 'නාවිකං' යනු තරත්‍යාදි තඬිතයට උදාහරණය,(නාවාය තරතීති නාවිකො නාවිකී නාවිකං යනාදියවේ) 'නීලං' යනු රාගාදි තඬිතයට උදාහරණය. (නීලෙන රත්තො පටො නීලො නීලෙන රත්තා උණ්ණා නීලා නීලෙන රත්තං වත්ථං නීලං යනාදියවේ.) පුරිමො යනු ජාත්‍යදි තඬිතයට උදාහරණය,(පුරෙ ජාතො පුරිමො, ජනො; පුරෙ ජාතා පුරිමා ඉත්ථී, පුරෙ ජාතං පුරිමං, පණ්ඩකං; යනාදිය වේ.) ජනතා' යනු සමූහ තද්ධිතයට උදාහරණය, (ජනානං සමූහො ජනතා ඉත්ථීනං සමූහො ඉත්ථිතා පණ්ඩකානං සමූහො පණ්ඩකතා යනාදියවේ.) 'රජනීයං' යනු ඨාන තඬිතයට උදාහරණය, (රජනස්ස ඨානං රජනීයං රජනස්ස ඨානභූතො ඔකාසොරජනීයො රජනස්ස ඨානභූතා දිසා රජනීයා යනාදියවේ)'දුටඨුල්ලං'යනු නිස්සිතතද්ධිතයට උදාහරණය, දුට්ඨුනිස්සිතො සොසො දුටඨුල්ලො දුටඨු

133 ණොණායනොචණානොචණෙය්‍යොණිචණිකොතථා,
ණවෙ ණෙරොච ණ්‍යොචෙති නව ගොත්තෙ පතිඨිතා.

---

නිස්සිතාවාචා දුට්ඨුල්ලා දුට්ඨුනිස්සිතංවචනං දුට්ඨුල්ලංයනාදියවේ.)ධූමායිතත්තංයනු උපමාතද්ධිතයට උදාහරණය, ධූමො විය දිස්සතීති ධූමායිතත්තං ධූමායිතතෙතා හිමො ධූමායිතත්තා ආභා යනාදියවේ.) ‘අභිජ්ඣාලු’ යනු බහුලතද්ධිතයට උදාහරණය,) අභිජ්ඣාබහුලො පුරිසො බහුලා ඉත්ථී බහුලං පණ්ඩකං යනාදියවේ,) ‘සෙට්ඨො’යනු සෙට්ඨතද්ධිතයට නොහොත් විශෙෂ තද්ධිතයට උදාහරණය. (විසෙසෙන පසත්ථොති සෙට්ඨො පුරිසො සෙට්ඨා ඉත්ථී සෙට්ඨං පණ්ඩකං යනාදියවේ.) ‘සද්ධො’ යනු අස්සත්ථි තද්ධිතයට උදාහරණය, (සද්ධා එතස්ස අත්ථීති සද්ධො පුරිසො එතිස්සා අත්ථීති සද්ධා ඉත්ථි එතස්ස අත්ථීති සද්ධං පණ්ඩකං යනාදිය වේ.) මණිමයං’ යනු පකති තද්ධිතයට උදාහරණය, (මණිනා පකතො පාසාදෙ මණිමයො පකතා පභා මණිමයා පකතං ව්‍යමහං මණිමයං යනාදියවේ) ‘පඤ්චමො’යනු පූරණ තද්ධිතයටඋදාහරණය,(පඤ්චන්නං පූරණො පඤ්චමො පූරණී පඤ්චමී පූරණං පඤ්චමං යනාදියවේ.) ‘එකං’යනු සඞ්ඛ්‍යාතද්ධිතයට උදාහරණය, (එසඞ්ඛ්‍යා එකො එකා එකං යනාදියවේ. විධා යනු විභාගතද්ධිතයට උදාහරණය, විවිභාගො විධො විවිභාගා විධා විවිභාගං විධං යනාදියවේ.) මෙසේ ලිඞ්ගත්‍රය වශයෙන් සාමඤ්ඤතද්ධිතයට උදාහරණ යෙදියයුතුතාහුය.

මෙසේ සප්‍රයොග සාමඤ්ඤතද්ධිතයාගේ භෙදදක්වා ඔවුන්අතුරෙහි ලභ්‍යමාන ප්‍රත්‍යයන්දක්වන්නේ “ණොණායනොචණානොච” යනාදි යකීහ.

133 ණොව’ “වාණප්පච්චෙ” යන සූත්‍රයෙන් වන්නාවූ ණප්‍රත්‍යයද; (වසිට්ඨස්සඅපච්චං පුත්තොවාසිට්ඨො වාසිට්ඨී වාසිට්ඨං, භාරද්වාජස්ස අපච්චං පුත්තො භාරද්වාජො භාරද්වාජී භාරද්වාජං, ගොතමස්ස අපච්චං පුත්තො ගොතමො ගොතමී ගොතමං යනාදිය උදාහරණයි) ණායණොච, “ණායනණානා වච්ඡාදිතො” යනසූත්‍රයෙන් වන ණායන ප්‍රත්‍යයද; ණානොච, මෙයින්මවන ණානප්‍රත්‍යයද; (වච්ඡස්ස අපච්චං පුත්තො වච්ඡායනො වච්ඡානො සාකටායනො සාකටානො අග්ගිවෙස්සායනො අග්ගිවෙස්සානො යනාදිය උදාහරණයි.) ණෙය්‍යොච, “ණෙය්‍යොකත්තිකාදීහි”යන්නෙන්වන ණෙය්‍යප්‍රත්‍යයද;(කත්තිකාය අපච්චං පුත්තො කත්තිකෙය්‍යො වෙණතෙය්‍යො රොහිණෙය්‍යො ගඞ්ගෙය්‍යො කද්දුවෙය්‍යො නාදෙය්‍යො යනාදිය උදාහරණයි.)

**134 ණිකොණියොතිමෙයෙව තරත්‍යාදිමහි ජාතිතො,**
**ණොවරාගෙ ඉමිකියො ජාතිමහි චතුරොකියො.**

---

ණිව, "අතොණිවා" යන්නෙන්වන ණිප්‍රත්‍යයද; ණිකොච, මෙම සූත්‍රයෙහි වාග්‍රහණයෙන් වන ණිකප්‍රත්‍යයද; (දක්ඛිදෙණි වාසවි සක්‍යපුත්ති නාථපුත්ති සක්‍යපුත්තිකො නාථපුත්තිකො ජෙනදත්තිකො යනාදිය උදාහරණයි.) ණවොච, "ණවොපග්වාදිහි" යන්නෙන් වන ණව ප්‍රත්‍යයද; (ඔපගවො මානවො ගග්ගවො පණ්ඩවො යනාදිය උදාහරණයි.) ණෙරොච, "ණෙරවිධවාදිතො" යන්නෙන්වන ණෙරප්‍රත්‍යයද; (වෙධ වෙරො සාමණෙරො නාළිකෙරො යනාදිය උදාහරණයි.) ණෙය්‍යාච, ණ්‍යප්‍රත්‍යයද; † ඉති, මේප්‍රකාරයෙන්; නව ගොත්තෙ පතිට්ඨිතා,ගොත්ත තද්ධිතයෙහි ප්‍රත්‍යයෝ නවදෙනෙක් පිහිටියාහුය.

මෙසේ ගොත්ත තද්ධිතයාගේ ප්‍රත්‍යයභෙදදක්වා දූන් තරත්‍යාදි රාගාදි ජාත්‍යාදි තද්ධිතත්‍රයගේ ප්‍රත්‍යයභෙද දක්වන්නේ"ණිකො ණියො" යනාදිය කීහ.

134 තරත්‍යාදිමහි, තරත්‍යාදි තද්ධිතයෙහි; ජාතිතො. ජාතිවශයෙන්; ණිකොණියොඉති, "යෙනවා සංසට්ඨං තරති චරති වහති ණිකො"යන්නෙන්වන ණිකප්‍රත්‍යයද(උදාහරණ-තිලෙන සංසට්ඨං භොජනං තෙලිකං ගොළිකං ඝාතිකං යනාදියයි.)ණියප්‍රත්‍යයදැයි;යන× වෙයෙව, දෙදෙනෙක්මවෙති; රාගෙ, රාගාදිතද්ධිතයෙහි, ණොව "ණරාගානෙතරත්තං තස්සෙද මඤ්ඤදත්ථෙසුච"යන්නෙන් එකම ණ ප්‍රත්‍යයෙක්වේ. (උදාහරණ-කසාවෙනරත්තං කාසාවං කොසුම්භං හාලිද්දං පත්තඞ්ගං මඤ්ජෙට්ඨං යනාදියයි.) ජාතිම්හි. ජාත්‍යාදිතද්ධිතයෙහි; ඉම්කියො, "ජාතාදීනම් මියාච" යන්නෙන්වන ඉම ප්‍රත්‍යය හා ඉය ප්‍රත්‍යයද මෙම සූත්‍රයෙහි ආදිග්‍රහණයෙන්වන ඉක ප්‍රත්‍යයද;

---

† ණ්‍යප්‍රත්‍යය සම්බන්ධව උදාහරණ මෙහි නොදක්වන ලද්දේ ටීකාවෙහි ණ්‍යප්‍රත්‍යය විධාන සූත්‍රයක් කාත්‍යායනයෙහි නැතැයි දක්වනලදහෙයිනි

× ණියප්‍රත්‍යය සම්බන්ධ විස්තරයක් ටීකාදෙක්හිම දක්වා "තපන කච්චායනපකරණෙ ණියප්පච්චය විධානසුත්තං අත්ථිතස්මා වීමංසිත්වා ගහෙතබ්බං" යී කියනලදහෙයින් උදාහරණ නොදක්වන ලදි.

135 කණ්ණෙණා තා සමූහෙ තීනි ඨානීයො ලො ච නිස්සිතෙ,
ආයිතත්තො උපමායං ආලු ච බහුලෙ තථා.

136 තරතමිස්සිකියිට්ඨා පඤ්චෙතෙ විසිට්ඨෙ ච,
විසෙසෙ ඉක ඊ රොණෙණා වන්තු මන්තු අස්සත්ථියං.

---

කියොච, චග්‍රහණයෙන් වන කිය ප්‍රත්‍යයදූයි (උදහරණ- පච්ඡා ජාතො පච්ඡිමො, අන්තිමො නත්තියො අන්තිකොජාතිප්පභුතියානි යුත්තො ජාති කියො යනාදියයි) චතුරො, ප්‍රත්‍යය සතරෙක්වෙති.

මෙසේ තරත්‍යාදි තද්ධිතත්‍රයගේ ප්‍රත්‍යය දක්වා සමූහ තද්ධිතාදීන්ගේ ප්‍රත්‍යය දක්වන්නේ **"කණ්ණෙණා තා සමූහෙ"** යනාදිය කීග.

135 සමූහෙ, සමූහතද්ධිතයෙහි; කණ්ණෙණා, "සමූහත්ථෙ කණ්ණාච" යන්නෙන් වන කණ ප්‍රත්‍යයහා ණ ප්‍රත්‍යයද; තා, "ගාමජන බන්ධු සහායා දිහිතා" යන්නෙන් වන තා ප්‍රත්‍යයද යන; තීනි, ප්‍රත්‍යයෝ තුන්දෙනෙක්වෙත්; උදහරණ- රාජපුත්තානං සමූහො රාජපුත්තකො රාජපුත්තො මනුස්සානං සමූහො මානුස්සකො මානුස්සො මයූරානං සමූහො මායූරකො මායූරො මහිසානං සමූහො මාහිසකො ගාමානං සමූහොගාමතා ජනානං සමූහොජනතා සහායානං සමූහො සහායතා නාගරානං සමූහො නාගරතා යනාදියයි.) ඨානෙ ඨානතද්ධිතයෙහි; ඊයොච, "තදස්සට්ඨාන මීයොච" යන්නෙන්වන ඊය ප්‍රත්‍යයමවේ;(උදහරණ-මදනස්සඨානං මදනීයං, බන්ධනස්සඨානං බන්ධනීයං, මුච්චනස්සඨානං මුච්චනීයං, රජනස්සඨානං රජනීයං,කමනස්සඨානං කමනියං යනාදියයි.) නිස්සිතෙ, නිස්සිත තද්ධිතයෙහි; ලොච, "තංනිස්සිතත්ථෙලො" යන්නෙන් වන ලප්‍රත්‍යයමවේ; (උදහරණ දුට්ඨුනිස්සිතං, දුට්ඨුල්ලංවෙදනිස්සිතං වෙදල්ලං යනාදියයි.)උපමායං,උපමාතද්ධිතයෙහි;ආයිතත්තොච"උපමත්ථායිතත්තං"යන්නෙන්වන ආයිතත්ත ප්‍රත්‍යයමවේ. (ධූමො වියදිස්සතීති ධූමායිතත්තං යනාදිය උදහරණයි) තථා, එසේ; බහුලෙ, බහුලතද්ධිතයෙහි; ආලුඑච, "ආලුතබ්බහුලෙ" යන්නෙන් වන ආලුප්‍රත්‍යයමවේ (අභිජ්ඣා අස්ස බහුලො අභිජ්ඣාලු, සීතං අස්සබහුලො සීතාලු, ධජා අස්සබහුලො ධජාලු, දයා අස්ස බහුලො දයාලු, යනාදිය උදහරණයි.)

136 විසිට්ඨෙ, විසිට්ඨතද්ධිතයෙහි; තරතමිස්සිකියිට්ඨා, "විසෙසෙ තර තමිස්සිකියිට්ඨා" යන්නෙන් වන තරතම ඉස්සික ඉය ඉට්ඨයන; එතෙපඤ්ච, මේප්‍රත්‍යයෝ පස්දෙනවෙත්; (උදහරණ- අයම් මෙසං

137 **මයොව පකතියමහි පූරණෙ මිථඨා තියො,**
**සංඛ්‍යාණෙ කොව ධාසො ඛෙවිභාගෙ පච්චයාඊනා,**
**සාමඤ්ඤ පච්චයාඑවං ජතාළිස භවනතිමෙ.**

---

විසෙසෙන පාපොති පාපතරො පාපතමො පාපිස්සිකො පාපියො පාපිඨො යනාදියයි.) අස්සත්‍ථියං, අස්සත්‍ථිතඩිතයෙහි; වීසො සි ඉක ඊරො ණොවනතු මනතු, "තදස්සත්‍ථිති විච" යන්නෙන් වන වීප්‍රත්‍ය යද; මෙම සූත්‍රයෙහි චග්‍රහණයෙන් වන සො ප්‍රත්‍යයද; "තපා දිතො සී" යන්නෙන්වන සීප්‍රත්‍යයද; "දණ්ඩාදිතො ඉක ඊ" යන්නෙන් වන ඉක ඊප්‍රත්‍ය යන්ද; 'මධවාදිතො රො" යන්නෙන් වන රප්‍රත්‍යයද; "සඩාදිතොණ" යන්නෙන් වන ණ ප්‍රත්‍යයද; "ගුණාදිතො වනතු" යන්නෙන් වන වනතු ප්‍රත්‍යයද; "සත්‍යාදිහි මනතු" යන්නෙන් වන මනතු ප්‍රත්‍යයද යන; නව, නවදෙනෙක් වෙත්; මෙහි ප්‍රථමකොට දක්වූ වීප්‍රත්‍යයට උදාහරණ- මෙධා අස්ස අත්‍ථී'ති= මෙධාවී, මායා අස්සඅත්‍ථී'ති= මායාවීයනාදියයි. සොප්‍රත්‍යයට- සුමෙධා අස්සඅත්‍ථි තස්මිං වාවිජ්ජතී'ති= සුමෙධසො යනාදියයි. සි ප්‍රත්‍යයට- තපො අස්සඅත්‍ථී'ති= තපස්සී, තෙජො අස්ස අත්‍ථී'ති= තෙජස්සී, යසො අස්ස අත්‍ථී'ති= යසස්සී, මනො අස්ස අත්‍ථී'ති= මනස්සී යනාදියයි; ඉකප්‍රත්‍යයටහා ඊප්‍රත්‍යයට- දණ්ඩා අස්ස අත්‍ථි තස්මිං වාවිජ්ජතී'ති= දණ්ඩිකො දණ්ඩී මාලිකො මාලී යනාදියයි. රප්‍රත්‍යයට- මධු අස්ස අත්‍ථි තස්මිං වාවිජ්ජතී'ති= මධුරො යනාදියයි. ණප්‍රත්‍යයට- සඩා අස්ස අත්‍ථි තස්මිං වා විජ්ජතී'ති=සඩො, පඤ්ඤා අස්ස අත්‍ථි තස්මිං වා විජ්ජතී'ති= පඤ්ඤා යනාදියයි. වනතුප්‍රත්‍යයට- ගුණවා පඤ්ඤවා සීලවා යනාදියයි. මනතු ප්‍රත්‍යයට- ජුතිමා සුතිමා සුචිමා ථිතිමා මතිමා කිත්තිමා භානුමා යනාදියයි)

137 පකති යම්හි, පකති තඩිතයෙහි; මයොව, "තප්පකති වචනෙ මයො" යන්නෙන් වන මය ප්‍රත්‍යයමවේ; (උදාහරණ- ඉට්ඨකෙන පකතං ඉට්ඨකමයං, අයසා පකතං අයොමයං රූපියා පකතං රූපියාමයං රජතෙන පකතං රජතමයං යනාදියයි. ) පූරණෙ, පූරණ තඩිතයෙහි; මිථඨාතියො, ම. ථ. ථ. ඨ. තිය යන මේ ප්‍රත්‍යයෝවෙත්; (මෙහි "සංඛ්‍යාපූරණෙමො" යන්නෙන් මප්‍රත්‍යයද, 'එකාදිතො දසස්සී' යන්නෙන් ඊප්‍රත්‍යයද, "චතුතෙඨහි ථඨා"යන්නෙන් ථඨ ප්‍රත්‍යයෝද 'ඡිතීහි තියො' යන්නෙන් තිය ප්‍රත්‍යයද යන මොහු වෙත්. මොවුන් අතුරෙන් මප්‍රත්‍යයට උදාහරණ-පඤ්චමො ඡට්ඨමො සත්තමො අට්ඨමො නවමො දසමො යනාදියයි. ඊප්‍රත්‍යයට එකාදසී

138 සිකකාය ධාරිතො භාරො යථා කාජෙන ධාරිතො,
එතෙනවං වචනත්ථාය වාක්‍යමජෙඣ භව න්තිතෙ,

පඤ්චදසි චාතුද්දසි යනාදියයි. ඨ. ය. ප්‍රත්‍යයන්ට- චතුත්ථො ඡඨො යනු උදාහරණයි. තිය ප්‍රත්‍යයට-දුතියො තතියො යනු උදාහරණයි. සංඛ්‍යාණෙ, සංඛ්‍යා තද්ධිතයෙහි; කො එව, ක ප්‍රත්‍යයමවේ; (මෙද "වාදිතොකොනෙකත්‍රෙච" යන්නෙන්වේ, ම්කං තිකං යනු උදාහ ණයි.) විභාගෙ, විභාගතද්ධිතයෙහි; ධාසො, ධාසො යන; වෙ පච්චයා සිතා, ප්‍රත්‍යයෝ දෙදෙනෙක් පිහිටියාහ; (ධාප්‍රත්‍යය "විභාගෙ ධාච" යන්නෙන්වේ. එකධා ව්ධායනු උදාහරණයි. එහිම චග්‍රහණයෙන් සො ප්‍රත්‍යයවේ. සුත්තසො බ්‍යඤ්ජනසො පදසො යනු උදාහරණයි.) සාමඤ්ඤ, සාමඤ්ඤතද්ධිතයෙහි; එවං, යථොක්ත මේසංඛ්‍යාවෙන්; එතෙ ජ තාළීස පච්චයා භවන්ති, මේ සතළිස් සදෙනෙක් ප්‍රත්‍යයෝ වන්නාහුයයි දතයුතු.

මෙසේ සාමඤ්ඤතද්ධිතයට සතළිස්සයක් ප්‍රත්‍යය දක්වා දැන් ඒ ප්‍රත්‍යයන් සම්භවනස්ථාන නියම වශයෙන් වාචකාර්ථය දක්ව න්නේ "සිකකාය ධාරිතො භාරො" යනාදිය කීහ.

138 සිකකාය ධාරිතො භාරො, සාල්ලෙන් ඉසිලිය යුතුවූ භා රයතෙම; යථාකාජෙන ධාරිතො, යම්සේ කදෙන් උසුලන ලද්දේවේ ද; එවං, මෙපරිද්දෙන්; මිනනං වචනත්ථාය, පූර්වොත්තරපද දෙදෙ නාගේ අර්ථය ප්‍රකාශකරණුපිණිස; තෙ, ණ්ණප්‍රත්‍යයආදී ප්‍රත්‍යයෝ; වාක්‍යමජෙඣ භවන්ති, වාක්‍යපදයන්ගේ මධ්‍යයෙහි වන්නාහුය.

(මෙහි භාවනම් බරඋසුලන යම්කිසි ජනයෙකුවිසින් සාල්ලෙන් උසුලායන කල වලන් ආදි බරක් යම් කිසි හස්තයකින් හෝ හිස කින් හෝ අංසයකින් හෝ උසුලන්ට නොහැක්කේවේද, එසේ ඉ සුලුයේවිනමුදු කැමතිතැනකට ගෙණයන්ට නොහැක්කේවෙයි. එහෙයින් දෙකෙළවරකදින් ගෙණයනුලබන්නේනම් කැමති තැ නකට පමුණුවන්ට හැකිවෙයි. මෙපරිද්දෙන්ම විවිධ අර්ථයන් ප්‍රකා ශකරන්නාවූ ප්‍රත්‍යයෝ ආදියෙහිවූවාහු වීනම් මූලපදාර්ථය පමණ ක්ම කියන්නාහුය. අන්තපදාර්ථය නොකියන්නාහුය අන්තයෙහි ප්‍ර ත්‍යයෝවූවාහුවීනම් අන්තපදාර්ථය කියන්නාහුය මූලපදාර්ථය නො ම කියන්නාහුය. එසේහෙයින් ආද්‍යන්ත උභයපදාර්ථයන් ප්‍රකාශ ක රණුපිණිස ප්‍රත්‍යයෝ වාක්‍යයටහා පදයන්ටත් මධ්‍යයෙහි වන්නාහු ය. එසේ වාක්‍යයට හා පදයන්ටත් මධ්‍යයෙහි සම්භූතවූ ණාදි ප්‍රත්‍ය යෝ මූලපදයාගේ හෝ අන්තපදයාගේ හෝ අර්ථය ප්‍රකාශකෙරෙති සි යනු භාවයි.)

139 වාක්‍යෙත්‍ථු විජ්ජමානානං ලොපා පද විභත්තිනං
දුවෙඅත්‍ථෙ වදන්තීති පණ්ඩිතෙහි විජානියා.

140 මණිඣනාතපෙ අග්ගි තම්හි නට්ඨෙ න නස්සති,
නට්ඨෙපද විභත්තිම්හි පච්චයත්‍ථං පවුච්චරෙ,

141 ථාවථත්තා විධංතොත්‍ර ථොථංවොහිංච හා ධිච,
හිංචනං හංචනං හිංච හොධොද දානි දාචනං.

---

“ සමාසො පදසංඛෙපො සප්පච්චය පදං පන
තද්ධිතන්තිව නාතබ්බං මුඛිතනාමුප ලක්ඛයෙ ” යි, කීහ.

මෙසේ ප්‍රත්‍යයන්ගේ සම්භාවනාස්ථාන නියමයෙන් වාචකාර්‍ථය දක්වා දූන් එම අර්ථය විවෘතකරන්නේ **“වාක්‍යෙත්‍ථු විජ්ජමානානං”** යනාදිය කීහ.

139 වාක්‍යෙත්‍ථු, වාක්‍යාවස්ථාවෙහිවනාහි; විජ්ජමානානං, විද්‍යමානවූ, පදවිභත්තීනං, අපත්‍යාපද හා ෂෂ්ඨී ආදි විභක්තීන්ටද; ලොපා, ලොප්කිරීමෙන් නොහොත් ලොපය ඇතිකල්හි; දුවෙඅත්‍ථෙ, වසිෂ්ඨාදිවූද අපච්චාදිවූද අර්ථවය; වදන්ති, ණාදිප්‍රත්‍යයෝ ප්‍රකාශ කෙරෙති; ඉති, මේ ප්‍රකාරයෙන්; පණ්ඩිතෙහි, පණ්ඩිතයන් විසින්; විජානියා, දතයුත්තාහුය.

මෙසේ වාචකවච්චකාරණාදක්වා සූර්‍ය්‍යකාන්තනායින් ලීනාන්තර චොදනාව පරිහරණය කරන්නේ **“ මණිඣනාතපෙ අග්ගි ”** යනාදිය කීහ.

140. මණිඣනා තපෙඅග්ගි, සූර්‍ය්‍යකාන්තමාණික්‍යය හා ඉන්ධනසංඛ්‍යාතගොමවැරටිආදිද්‍රව්‍ය අව්වද යනමේ ත්‍රිවිධකාරණයන් නිසා උපදවාගත් වහ්නියතෙම; තම්හිනට්ඨෙ, ඒ සූර්‍ය්‍යකාන්තමාණික්‍ය ආදිය නැසුනුකල්හි; නනස්සති නොනැසේද; (එමෙන්) පදවිභත්තිම්හි නට්ඨෙ, අපච්චාදිපද හා ෂෂ්ඨී ආදිවිභක්තිද නටකල්හි හෙවත් ලොප්කළකල්හිත් (ණාදි ප්‍රත්‍යයෝ.) පච්චයත්‍ථං, ප්‍රත්‍යයාර්ථය; පවුච්චරෙ, ප්‍රකාශකෙරෙත්.

මෙසේ උදාහරණ සහිත සාමඤ්ඤතද්ධිතභෙදදක්වා දූන් අව්‍යය තද්ධිතයාගේ ප්‍රත්‍යය භෙද මාත්‍රයක්ම දක්වන්නේ **“ථාච ථත්තාවිධං”** යනාදියකීහ.

141 ථාච,ථාප්‍රත්‍යයද; ථත්තාච,ථත්තාප්‍රත්‍යයද; විධංච, විධංප්‍රත්‍යයද; තොච, තොප්‍රත්‍යයද; ත්‍රච, ත්‍රප්‍රත්‍යයද; ථොච, ථප්‍රත්‍යයද; ථං

142 වචීච වචනං චාපි රහාචි ච රහාවනං
රහිධුනා ජජ ජ්ජු ජෝනාඤ්ඤ විසපච්චයාබ්‍යයෙ.

ච, ථංප්‍රත්‍යයද; වොච, වප්‍රත්‍යයද; හිංච. හිං ප්‍රත්‍යයද; හංච, හං ප්‍රත්‍යයද; ධිච, ධිප්‍රත්‍යයද; හිං චනංච; හිංචනං ප්‍රත්‍යයද; හංචනංච, හංචනං ප්‍රත්‍යයද, හිංච, හිං ප්‍රත්‍යයද; හොච, හප්‍රත්‍යයද, ධොච, ධප්‍රත්‍යයද; දච, ද ප්‍රත්‍යයද; දනිච, දනි ප්‍රත්‍යයද; දචනංච, දචනං ප්‍රත්‍යයද;

142 වචීච, වචීප්‍රත්‍යයද; අපි, නැවත; වචනංච, වචනංප්‍රත්‍යයද; රහාචිච, රහාචිප්‍රත්‍යයද; රහාචනංච, රහාචනං ප්‍රත්‍යයද; රහිච, රහි ප්‍රත්‍යයද; ධුනාච, ධුනාප්‍රත්‍යයද; ජජච, ජජප්‍රත්‍යයද; ජ්ජුච, ජ්ජුප්‍රත්‍යයද; ජෙජාච ඉති, ජෙජා ප්‍රත්‍යයදයි; අබ්‍යයෙ, අව්‍යයතද්ධිතයෙහි; අඨවීසපච්චයා. අටවිසිප්‍රත්‍යයකෙනෙක් වෙති.

(මොවුන්අතුරෙන් ථා,ථත්තා,ථං,තො, ත්‍ර, ථ, ව,හිං,හං, හිංචනං හිං, හ, ධ, ද, දනි, දචනං, රහි, ධුනා යන මේ අටළොස්ප්‍රත්‍යයෝ මේ කාත්‍යායනපොත්හි ඇත්නාහ. මෙහි "සබ්බනාමෙහි පකාර වච නෙහි තුථා" යන සූත්‍රයෙන් ථා ප්‍රත්‍යයවේ. තං පකාරං තථා යනු උදාහරණයි. එහිම තු ග්‍රහණයෙන් ථත්තා ප්‍රත්‍යයවේ. සො පකාරො තථත්තා යනාදිය උදාහරණයි; "කිම්මෙහිථං" යන්නෙන් ථං ප්‍රත්‍යය වේ. කං පකාරං කථං යනාදිය උදාහරණයි. ක්වචි තො පඤ්චම්‍යත්ථේ යන්නෙන් තො ප්‍රත්‍යයවේ, සබ්බතො යතො යනාදිය උදාහරණයි; "ත්‍රථ සත්තම්යා සබ්බනාමෙහි" යන්නෙන් ත්‍රථ ප්‍රත්‍යයෝවෙත්. සබ්බත්‍ර සබ්බත්ථ යනාදිය උදාහරණයි. "කිස්මාවොච" යන්නෙන් ව ප්‍රත්‍යයවේ. ක්වගතො සිත්වං දෙවානං පියතිස්ස යනාදිය උදාහරණයි. "හිං හං හිංචනං යන්නෙන් හිං, හං, හිංචනං, ප්‍රත්‍යයෝවෙත්, කුහිං, කුහං කුහිංචනං යනාදිය උදාහරණයි; "යතො හිං" යන්නෙන් හිං ප්‍රත්‍යයවේ, යහිං යනු උදාහරණයි. "ඉමස්මා හධාච" යන්නෙන් හධ ප්‍රත්‍යයෝවෙති, ඉහ ඉධ යනු උදාහරණයි;"කිං සබ්බඤ්ඤෙ කයකුහි දාදාචනං" යන්නෙන් ද දාචනං ප්‍රත්‍යයෝ වෙත්, කද කුදාචනං යනු උදාහරණයි; "ඉමස්මා රහි ධුනා දානිච" යන්නෙන් රහි, ධුනා, දානි, ප්‍රත්‍යයෝවෙත්; එතරහි අධුනා ඉදානි යනාදිය උදාහරණයි. මෙකී දසවිධ සූත්‍රවලින් මේ අටළොස් ප්‍රත්‍යයෝ කාත්‍යායන ප්‍රකරණයෙහි කියනලද්දාහ, අනික් විධං, හංචනං, වචි, වචනං, රහාචි, රහාචනං, ජජ, ජ්ජු, ජෙජා, යන මේ දශවිධ ප්‍රත්‍යයෝ † චූලනිරුක්ති ප්‍රක

† දසයක් නොපැනේ.

143 ණ්‍යත්තතාත්තනත්ථංත්වං ණිලං ණිකං ණියංකණ්ණා,
භාවෙකාදස තිඪනති පඤ්චාසිති සමූහතො.

රණාදියෙහි ආවාහුය, එහි විධං ප්‍රත්‍යය චූලනිරුක්තියෙහි "සංඛ්‍යා තො විධංකච්" යන සූත්‍රයෙන් කියනලදි, එකවිධං ද්‍ුවිධං තිවිධං යනාදිය උදාහරණයි; භංචනං, චචි, චචනං, යන මේ ප්‍රත්‍යයෝ තුන් දෙන මුඛමත්තසාරයෙහි ඇත්තාහ, කුභංචනං ඛචි ඛචනං යනාදිය උදාහරණයි; රහාචි රහාචනං යන මේ ප්‍රත්‍යයෝ දෙදෙන චූලනිරුක්ති ප්‍රකරණයෙහි "තමහාදූනිච" යන සූත්‍රයෙහි චග්‍රහණයෙන් කියනලද්දාහ, කරහාචි කරහාචනං යනු උදාහරණයි; ජෙජා යන ප්‍රත්‍යය ශබ්දසාරාර්ථජාලිනී ටීකාවෙහි පෙනේ, අජෙජා යනාදිය උදාහරණයි. මෙහි තවත් විස්තර ඇත, එය ටීකා නයින් දතයුතු.)

මෙසේ අව්‍යයතද්ධිතය දක්වා භාවතද්ධිතයාගේ ප්‍රත්‍යය දක්වන්නේ "ණ්‍යත්තතාත්තනත්ථං" යනාදිය කීහ.

143. භාවෙ, භාවතද්ධිතයෙහි; ණ්‍යච, ණ්‍ය ප්‍රත්‍යයද; ත්තච, ත්ත ප්‍රත්‍යයද; තාච, තා ප්‍රත්‍යයද; ත්තනංච, ත්තන ප්‍රත්‍යයද; ත්ථංච, ත්ථ ප්‍රත්‍යයද; ත්වංච, ත්ව ප්‍රත්‍යයද; ණිලංච, ණිල ප්‍රත්‍යයද; ණිකංච, ණික ප්‍රත්‍යයද; ණියංච, ණිය ප්‍රත්‍යයද; කණ්ණාච, කණ් ප්‍රත්‍යය හා ණ ප්‍රත්‍යයද; එකාදස නිඪනති, මේ ප්‍රත්‍යයෝ එකොළොස සිටිනාහුය; ¶ සමූහතො, සමූහවශයෙන්; පඤ්චාසිති, ප්‍රත්‍යයෝ අසූපසෙක්වෙති.

(මෙහි ණ්‍ය, ත්ත, තා, යන ප්‍රත්‍යයෝ "ණ්‍යත්තතාභාවෙතු" යන සූත්‍රයෙන් වූහ; සෙසු ත්තන, ත්ථං, ත්වං, ණිලං, ණිකං, යන මේ ප්‍රත්‍යයෝ සදෙන එම සූත්‍රයෙහි තුග්‍රහණයෙන් වෙති; කණ් ප්‍රත්‍යය "රමනීයාදිතො කණ්" යන්නෙන්විය; ණ ප්‍රත්‍යය "ණ විසමාදීහි" යන්නෙන්විය; ආලස්‍යං, පංසුකූලිකත්තං, සංගණිකාරාමතා, පුථුජ්ජනත්තනං, පුථුජ්ජනත්ථං, පුථුජ්ජනත්වං, පුථුජ්ජනිලං, පුථුජ්ජනිකං, පුථුජ්ජනියං, රමණීයකං, වෙසමං, යනාදිය උදාහරණයි.)

---

¶ ජපපච්චයාච භාවෙතු ණ්‍යත්ත තාණ කණපිච,
තු සද්දෙනත්තනච්චාපි ඵෙරෙන ඉධ භාසිතා.

ආනත්තං ත්වං ණිකා ණිය ණි ණාපි භාව තද්ධිතෙ,
ජපපච්චයා තු සද්දෙන සද්ද සත්ථෙ පකාසිතා.

යන්නෙන් ශබ්දසාරාර්ථජාලිනියෙහි මීට වෙනස්ව කියනලදී.

**144** **භාවෙතු භාවතෙථා නාම ජාති ගුණ ක්‍රියා තථා,**
**නාමං දබ්බන්ති පඤ්චෙතෙ සද්දමන්නා විජානියා**

**145** **ලභෙය්‍යං තෙන පුඤ්ඤෙන අනුකූල මිත්තාදිකං,**
**කරෙය්‍යං පසත්ථං කම්මං සද්ධාදි ඉන්ද්‍රියොභවෙ.**

**සප්පයොගං තද්ධිතභෙදං සමත්තං.**

)ඃ0ඃ(

---

මෙසේ භාවතද්ධිතයාගේ ප්‍රත්‍යය දක්වා යම් යම් නිමිත්තකින් බුද්ධිශබ්දයෝ වන්නාහුද ඒ ඒ නිමිත්තෙන් භාවාර්ථය දක්වන්නේ **'භාවෙතු භාවතෙථා''** යනාදිය කීහ.

I44. භාවෙතු, භාවයෙහි වනාහි; ජාති, ජාතියද; ගුණ, ගුණයද ක්‍රියා, ක්‍රියාවද; තථා, එසේ;නාමං, නාමයද; දබ්බං, ද්‍රව්‍යයදැයි යන; එතෙපංච,මේ පස්දෙන; භාවතෙථානාම, භාවාර්ථය නම; සද්දමන්නා, ශබ්දදන්නෝ; ඉති, මේ ප්‍රකාරයෙන්; විජානියා, දැනගන්නාහුය.

(භවන්ති එතස්මා බුද්ධිසද්දා'ති භාවො, ගොස්සභාවො= ගොත්තං, යනු ජාතිය නිමිත්තකොටගෙණ භාවාර්ථය බවට උදාහරණය. නීලස්සභාවො=නීලත්තං, යනු ගුණය නිමිත්තකොටගෙණ භාවාර්ථය බවට උදාහරණය.පාචකස්ස භාවො=පාචකත්තං,යනු ක්‍රියාව නිමිත්ත කොටගෙණ භාවාර්ථය බවට උදාහරණය. තිස්සස්සභාවො= තිස්සත්තං, යනු නාමය නිමිත්තකොටගෙණ භාවාර්ථයබවට උදාහරණය. දණ්ඩිනො භාවො= දණ්ඩිත්තං, යනු ද්‍රව්‍යය නිමිත්තකොටගෙණ භාවාර්ථය බවට උදාහරණයි.)

මෙසේ සප්‍රයෝගවූ තද්ධිත භෙදය දක්වා ප්‍රාර්ථනාව දක්වන්නේ **"ලභෙය්‍යං තෙන පුඤ්ඤෙන"** යනාදියකීහ.

145. අනෙනපුඤ්ඤෙන, මේ තද්ධිතභෙදය ප්‍රකාශකලාවූ පුණ්‍යය හේතුකොටගෙණ;අනුකූලමිත්තාදිකං ලභෙය්‍යං, අනුරූප මිත්‍රාදීය ලබම්වා; පසත්ථං කම්මං කරෙය්‍යං, බුද්ධාදීන් විසින් ප්‍රශස්ත කර්‍මාන්ත කරම්වා; සද්ධාදි ඉන්ද්‍රියො භවෙ, ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් ඇතිවෙම්වා යී කියා ප්‍රාර්ථනාකළහ.

**සප්‍රයොග තද්ධිත භෙදය සම්පූර්ණවූයේයි.**

—※—

146 ජොතන්ති පච්චයා'මෙත්ථ ආඛ්‍යායන්ති විභත්තියො,
භාවකම්මංච කත්තාරං ආඛ්‍යාතන්ති පවුච්චති.

147 අත්ථානංවාචකාතත්ථ අට්ඨෙහොන්ති විභත්තියො,
පඤ්චමී වත්තමානාච සත්තමීච හීයත්තනී,
අජ්ජතනී පරොක්ඛාච කාලාති භවිස්සන්තිම.

---

මෙසේ සප්‍රයොගවූ තද්ධිතභෙදය දක්වා දැන් සප්‍රයොග අඛ්‍යාතභෙද දක්වන්නේ යසාචාර්‍ය්‍යෙන්ද්‍රයානෝ "**ජොතන්ති පච්චයාමෙත්ථ**" යනාදියකීහ.

146. එත්ථ, මේ ප්‍රකරණයෙහි, හෙවත් මේ ආඛ්‍යාත ප්‍රකරණයෙහි; පච්චයාච, විකරණාදි ප්‍රත්‍යයෝද; ජොතන්ති, බබලන්නාහුය; හෙවත් ප්‍රකාශ වන්නාහුය; විභත්තියො, විභක්තීහු; භාවකම්මංච, භාව කර්‍ම දෙකද; කත්තාරං, කර්‍තෘද; හෙවත් කර්‍තෘඅර්ථයද; ආඛ්‍යායන්ති, කියති; නොහොත්, එත්ථ, මේ ප්‍රකරණයෙහි; පච්චයා, ප්‍රත්‍යයෝ; භාවකම්මංච, භාව කර්‍ම දෙකද; කත්තාරං, කර්‍තෘද; ජොතන්ති ප්‍රකාශකෙරෙත්; විභත්තියොච, විභක්තීහුද; ආඛ්‍යායන්ති, (භාවකර්‍ම දෙක හා කර්‍තෘද) කියති; (එහෙයින්) ආඛ්‍යාතන්ති, අඛ්‍යාතයයි; පවුච්චති, කියනුලැබේ. මේ ප්‍රකරණයෙහි තද්ධිත කිතක ප්‍රකරණවයෙහි මෙන් ප්‍රත්‍යයෝ ප්‍රකාශවෙති. නාම ප්‍රකරණයෙහි මෙන් විභක්තීහුද ප්‍රකාශවෙති. මේභාවය මේකර්‍මය මේකර්‍තෘයයි කියා ඒ ඒ ප්‍රකාරයෙන් ප්‍රදීපමෙන්බබලති. එහෙයින් ආඛ්‍යාතයයි කියනුලැබෙයියනුභාවයි)

මෙසේ ආඛ්‍යාත පදයට විග්‍රහ දක්වා දැන් ඒ භෙද දක්වන්නේ "**අත්ථානංවාචකාතත්ථ**" යනාදිය කීහ.

147. තත්ථ, ඒ ජොතකවාචකවූ ප්‍රත්‍යයන් හා විභක්තීන් අතුරෙන්, අත්ථානං, භාවකර්මකර්තෘසඞ්ඛ්‍යාත ප්‍රත්‍යයන්; වාචකා, වාචකවූ; විභත්තියො, විභක්තීහු; අට්ඨෙහොන්ති, අටෙක්වෙති; ඔහු කවරහුද? පඤ්චමීච, පඤ්චමී විභක්තියද; වත්තමානාච, වර්‍තමාන විභක්තියද; සත්තමීච, සප්තමී විභක්තියද; හීයත්තනීච, හීයත්තනී විභක්තියද; අජ්ජතනීච, අජ්ජතනීවිභක්තියද; පරොක්ඛාච,පරොක්ෂාවිභක්තියද; කාලාති භවිස්සන්තිච, † කාලාතිපත්ති විභක්තිය හා භවිස්සන්ති විභක්තියද යන මේ අෂ්ට විභක්තීහුයි.

---

† කාලාතිපත්තීති වත්තබ්බෙ ගාථා බන්ධ වසෙන වුත්ත සඞ්ඛා කාලාතීති වුත්තං, යථා සෙය්‍යජ්ජිකො පදමතො ත්‍යාදි-ටීකා.

148 තාසෙවෙකෙකා දුධා හොන්ති පරස්ස පද මත්තනො,
පුබ්බෙ ඡ ඡ පරස්සාති පරෙ ඡ ඡ ච මත්තනො.

149 තෙසෙවෙකෙකා තිධා හොන්ති නාමතුම්හාම්හ යොගතො,
පුබ්බ මජ්ඣ පරෙ වෙවෙ නාමතුම්හාම්හ යොගිකා.

150 තෙසෙවෙකෙකා තිධා හොන්ති පුරිසභෙදතොපිච,
පුබ්බ මජ්ඣ පරෙ වෙවෙ පඨම මජ්ඣි මුත්තමා.

---

මෙසේ විභක්තියගේ අටවැදෑරුම් හෙද දක්වා ඔවුන් අතුරෙන් එකිඑකී විභක්තියක්හුගේවිවිධම්විධ හෙදදක්වන්නේ“**තාසෙවෙකෙකාදුධාහොන්ති**” යනාදිය කීහ.

148. තාසු, ඒ විභක්තීන් අතුරෙන්; එකෙකා, එකි එකී විභක්තීහු; පරස්සපද මත්තනො, පරස්මෛපද ආත්මනෙපදයන්ගේ වශයෙන්;දුධාහොන්ති,විප්‍රකාරවිප්‍රකාරවෙති;පුබ්බෙ ඡ, විභක්තීන්ගේපූර්වයෙහිවූසපදසපදයො; පරස්සාති, පරස්මෛපදයොනම්වෙත්;පරෙ ඡඡච,පරවූ සපද සපදයෝද; ආත්මනො ආ,ආත්මනෙ පදයෝනම් වෙත්.

මෙසේ එකි එකී විභක්තියකගේ පරස්මෛපද ආත්මනෙ පද යන්ගේ (වශයෙන්) හෙද දක්වා ඔවුන් අතුරෙහිද ප්‍රයොග වශයෙන් ත්‍රිවිධ හෙද දක්වන්නේ “**තෙසෙවෙකෙකා තිධාහොන්ති**” යනාදිය කීහ.

149; තෙසු, ඒ පරස්මෛපද ආත්මනෙපදයන් අතුරෙන්; එකෙකා, එකිඑක් පදකෙනෙක්; නාමතුම්හාම්හයොගතො, නාමය හා තුම්හඅම්හ ශබ්දයන්ගේයොගයෙන්; තිධාහොන්ති, ත්‍රිවිධාකාරවෙති; පුබ්බමජ්ඣපරෙ, පූර්ව මධ්‍ය අන්තයෙහිවූ; වෙවෙ, දෙපද දෙපද කෙනෙක්; නාමතුම්හාම්හයොගිකා, නාමය හා තුම්හ අම්හ ශබ්දයන් යොගකොට ඇත්තාහ. ( කෙසේද? වත්තමාන විභක්ති පරස්මෛපදයෙහි න්ති අන්ති යන දෙදෙන නාමයොගිකනම. සි ථ යන දෙදෙන තුම්හශබ්දයොගිකනම. මි ම යනදෙදෙන අම්හ ශබ්දයොගිකනම පුරිසො තිට්ඨති පුරිසා තිට්ඨන්ති' යනු නාම යොගයට උදාහරණය. 'ත්වං පචසි තුම්හෙ පචථ' යනු තුම්හ ශබ්ද යොගයට උදාහරණය. අහං පචාමි මයං පචාම'යනු අම්හශබ්දයොගයට උදාහරණයි)

මෙසේ යොගහෙද දක්වා නැවත පුරුෂභෙද දක්වනුයේ “**තෙසෙවෙකෙකා තිධාහොන්ති**” යනාදිය කීහ.

150. තෙසු, ඒ පරස්මෛපද ආත්මනෙපදයන් අතුරෙන්; එකෙ

151 තෙසෙවෙකෙකාපි දුවිධා වචන භෙදතොපන,
තෙසු පුබ්බා පුබ්බාඑකා පරාතු බහු වාචකා.

152 විභත්ති ජාතිතො අට්ඨ සොළසපද තො සියුං,
අට්ඨතාළිස යොගෙන තථෙව පුරිසෙ නව.

---

කා, එකී එකී පදකෙනෙක්; පුරිසභෙදතොපිච, පුරිසභෙද වසයෙන්ද; තිධාහොනති, ත්‍රිවිධාකාරවෙත්; පුබ්බමජ්ඣිමපරෙ, පූර්වයෙහිද මධ්‍යයෙහිද අන්තයෙහිද; වෙවෙ, දෙදෙනෙක් දෙදෙනෙක් හෙවත් දෙපද දෙපද කෙනෙක්; පඨම මජ්ඣිම උත්තමා, ප්‍රථමපුරුෂ මධ්‍යම පුරුෂ උත්තමපුරුෂනම්වෙත්; කෙසේද? වර්තමාන විභක්තියෙහි පරස්සෙපදය සම්බන්ධ ති අන්ති යන දෙපදය ප්‍රථමපුරුෂනම්, සි ථ යන දෙපදය මධ්‍යමපුරුෂ නම්, මි ම යන දෙපදය උත්තමපුරුෂනම් මේ නයින් මෙහිම ආත්මනෙපදයාගේ හා අනික් සප්ත විභක්තීන්ගේද පුරුෂභෙදය දතයුතුයි.

මෙසේ පුරුෂභෙද දක්වා එකී එකී පුරුෂයක්හුගේ විවිධ විවිධ භෙද දක්වන්නේ "තෙසෙවෙකෙකාපිදුවිධා" යනාදිය කීහ.

151. තෙසු, ඒ ප්‍රථම මධ්‍යම උත්තම පුරුෂත්‍රය අතුරෙන්; එකෙකාඅපි, එකී එකී පුරුෂයෝද; වචන භෙදතො පන, වචනභෙද වසයෙන් වනාහි; දුවිධා, ද්විප්‍රකාරවෙත්; තෙසු, ඒවචනයන්අතුරෙන්; පුබ්බාපුබ්බා, පූර්වපූර්වවූ හෙවත් ඒ පුරුෂයන්ගේ පළමුවෙනි පළමුවෙනි වචනයෝ, එකා, ඒකවචනවෙත්; පරා, අන්තයෙහිවූ වචනයෝ; බහු වාචකා; බහුවාචක නම්වෙත්; හෙවත් බහුවචනයෝ නම්වෙත්. (මෙහි තුම්හශබ්දය පක්ඛාන්තරාර්ථයි; බහන්ති වඩ්ඪන්ති'ති= බහු; වචීයන්ති එතෙහී ති= වාචකා; බහුන්නං වාචකා=බහු වාචකා; යනු විග්‍රහයි.)

මෙසේ විභක්තීන්ගේ ජාතිවශයෙන්හා පදවශයෙන්ද පුරුෂවශයෙන්ද වචනවශයෙන්ද විභාගදක්වා දූන් ගණසංඛ්‍යාවශයෙන් දක්වන්නේ "විභත්ති ජාතිතො අට්ඨ" යනාදියකීහ.

152 විභත්තී, විභක්තීහු; ජාතිතො, ජාතීහුවිසින්; අට්ඨ, අටදෙනෙක්වෙති; (එනම් වර්තමානවිභක්තිය පංචමී විභක්තිය සත්තමී විභක්තිය හීයත්තනී විභක්තිය අජ්ජතනීවිභක්තිය පරොක්ඛාවිභක්තිය කාලාතිපත්තිවිභක්තිය භවිස්සන්තිවිභක්තිය යනමොහුයි.) පදතො, පදවි

**153 ජනහවුතිතු හොණොන්‍යතෙ වචනස්‍ස පභෙදතො,**
**පරො පුරිස භෙදෙන අසීතිති පකාසිතා.**

---

සින්; සොළසසියුං, සොළසෙක්වෙති; (එනම් වත්මානවිභකති පර සෙමපදයහා ආත්මනෙපදයද, පංචමි විභකති පරසෙමපදයහා ආත්මනෙපදයද සප්තමිවිභකති පරසෙමපදයහා ආත්මනෙපදයද හිය ත්තනීවිභකති පරසෙමපදයහා ආත්මනෙපදයද අජ්ජතනීවිභක්ති පරසෙමපදයහා ආත්මනෙපදයද පරොක්ඛාවිභක්ති පරසෙමපදය හා ආත්මනෙපදයද කාලාතිපත්ති විභක්ති පරසෙමපදයහා ආත්ම නෙපදයද භවිස්සන්ති විභක්ති පරසෙමපදයහා ආත්මනෙපදයදැයි යනමේ සොළසය.) යොගෙන, යොගවිසින්; අඪතාළීස, සතලිස් අටෙක්වෙති; (කෙසේද? වත්තමානවිභක්තියෙහි නාමයෝග තුම්හා මහශබ්දයෝග සයෙක. එසේම පංචමිවිභක්තිආදි අනික් විභක්තිස තෙහිද නාමයොගතුම්හාම්හශබ්දයොගයෝ සදෙනසදෙනවෙති. මේ සියල්ල පිඩුකළකල්හි සතලිස් අටෙකැයි දතයුතුයි.) පුරිසෙනච, පුරුෂවිසින්ද; තථෙව එසේමසතලිස්අටෙක් වෙති. (කෙසේද? වත්තමාන විභක්තියෙහි පරසෙමපදයෙහි ප්‍රථම පුරුෂ මධ්‍යමපුරුෂ උත්තමපුරුෂ යනපුරුෂත්‍රයක්වෙයි. ආත්මනෙපදයෙහිද ප්‍රථමපුරුෂාදි පුරුෂත්‍රයක් වෙයි. ප .. ළකල්හි වත්තමානවිභක්තිය සම්බන්ධවපුරුෂසයක්වෙත්. මේ නියායෙන් එකී එකී විභක්තියකට පුරුෂ සසය බැගින් ඒ සියල්ල පිඩුකළකල්හි සතලිස්අටෙකැයි දතයුතුයි සේයි.)

මෙසේ විභක්ත්‍යාදි සඞ්ඛ්‍යාවදක්වා වචනපරො පුරිස (ගණන) සඞ්ඛ්‍යා දක්වන්නේ "ජනහවුති තුහොණොන්‍යතෙ යනාදිය කීහ.

153 එතෙ, මේප්‍රථමාදී පුරුෂයෝ නොහොත් මේ විභක්තීහු අට දෙන; වචනස්‍ස පභෙදතො, එකවචන බහුවචන ප්‍රභෙදයෙන්; ජන්නවුති තුභෙ නති, සයානුවක්වෙති; (කෙසේද? වත්තමානවිභක්තිප රසෙම්පදයෙහි එකවචන විභක්ති තුනෙක බහුවචන විභක්ති තුනෙක, ආත්මනෙ පදයෙහිද එසේම එකවචන විභක්ති තුනෙක බහුවචන විභක්ති තුනෙක මේ නියායෙන් වත්මාන විභක්තියෙහි එකවචන බහුවචන දෙළසෙක්වෙත්. මේනයින් අනික් විභක්තීන් හේද දෙළස දෙළසබැගින් මේ ගණන් සියල්ල පිඩුකළකල්හි සයානුවක්වෙති.) පරො පුරිසභෙදන, පරොපුරිසභෙදයෙන්; අසීතිහි, අසූවකැයි; පකාසිතා, ප්‍රකාශකරණ ලද්දහුය.

154 **තිසිඨඤ්ච තිම්මඤ්ච සිම්මං තිසිමං තථා,**
**ත්‍යානතිසිඨම්මඤ්චෙති පඤ්චවාරා පකාසිතා.**

155 **වත්තමානා පච්චුප්පන්නෙ භවිස්සන්ති අනාගතෙ,**
**පඤ්චමී සත්තමී තිසු අතීතෙ හොන්ති සෙසකා.**

---

මෙහි අසූවිවන්නේ කෙසේදැයි යන චොදනාව පරිහරණය කරමින් ආචාර්‍ය්‍යතෙම "**තිසිඨඤ්ච තිම්මඤ්ච**" යනාදිය කීහ.

154 තිසිඨංච, තිසිඨයනවචනයද; තිම්මඤ්ච, තිම්ම යනවචනය ද; සිම්මංච, සිම්මයන වචනයද; තිසිමංච, තිසිමයනවචනයද; තථා; එසේ; ත්‍යානාතිසිඨ මිමඤ්ච; ති අනතිසිඨ මිමයනවචනයද; ඉති, මේ ප්‍රකාරයෙන්; පංචවාරා; පංචවාරයෝ; පකාසිතා; ප්‍රකාශකරණ ලද්දාහුය.

(මෙසේ මේපංචවාරයෝ සොළොස්පදයන්අතුරෙන් එකීඑකී පදයෙක්හි ප්‍රකාශකරණ ලද්දාහ. එහෙයින් අසූවක්වන්නාහුවෙති. උදහරණනම් සොචපචති § ත්වංචපචසි තුම්හෙපචථයනු මේ ප්‍රථම වාරයවේ.; සොච පචති අහංචපචාමි මයංපචාමයනු මේ දෙවෙනිවාරයවේ; ත්වංච පචසි අහංච පචාමි මයං පචාමයනු තෘතිය වාරයවේ; සොච පචති ත්වංච පචසි මයං පචාමයනු සතරවෙනි වාරයවේ; සො චපචති තෙචපචන්ති ත්වංචපචසි තුම්හෙචපචථ අහංචපචාමි මයංපචාම යනු පස්වෙනි වාරයවේ; මෙසේ පරස්සෙපදයෙහි පංචවාරයකි ආත්මනෙපදයෙහිත් මෙසේ පංචවාරයෙක්යෙදෙන්නාහ. මෙහි කියනලද්දනයින්ම සෙසු පංචමී සප්තමී ආදිවිභක්තීන් කෙරෙහි දස දස වාරයෝ වෙති. එහෙයින් අෂ්ටවිභක්තීන් කෙරෙහි අසූවාරයෙක් වෙතියි දතයුතු.)

මෙසේ විභක්තීන්ගේ පරොපුරිස වසයෙන් වාරදක්වාදැන් යථොක්ත විභක්තීන්ගේ කාලනියමය දක්වන්නේ **වත්තමානාපච්චුප්පන්නෙ** යනාදිය කීහ.

155 වත්තමානා; වර්‍තමාන විභක්තිතොමෝ; පච්චුප්පන්නෙ; ප්‍රත්‍යුත්පන්නකාලයෙහිවේ; භවිස්සන්ති; භවිස්සන්තිවිභක්තිතොමෝ;

---

§ සොචපචති යනාදීන් සියළුවාරයන්හි පචධාතුවෙන්ම ක්‍රියායොගය බූරුමපොත්හිපෙනේ.

156 පරස්ස පද මාඛ්‍යාතං කත්තුනො යෙව වාචකං,
අත්තනො පද මාඛ්‍යාතං භාවෙ කම්මනි කත්තරි.

157 ඛජසා ආයීයාණෙච ණයොණාපෙථ ණාපයො,
අලලාණයාරාලොයොච අකාරාමෙ ඉවණ්ණකා.

158 එ ඛ කාරා යොණුණාච උණානාවප්පණ්හා තථා,
ඛයිරාණෙණයාවෙති පච්චයාඑකතිංසිමෙ.

---

අනාගතෙ, අනාගතකාලයෙහිවේ; පංචමී සත්තමී, පංචමීවිභක්තිය හා සප්තමීවිභක්තිය; තීසු,තුන්කල්හිවෙත්; සෙසකා, සෙසුවිභක්තීහු; අතීතෙභොතති අතීතකාලයෙහිවෙති.

මෙසේ කාලනියමය දක්වා දූන් වාචකනියමය දක්වන්නේ "**පරස්සපද මාඛ්‍යාතං**" යනාදිය කීහ.

156. පරස්සපදං, අෂ්ටවිභක්තීන්ගේ පරස්මෛපදයතෙම; නොහොත් පූර්වෂට්කය; කත්තුනොයෙවවාචකං, කර්තෘවාචකමවේ. හෙවත් කර්තෘ ප්‍රකාශකරන්නේමවේයයි; ආඛ්‍යාතං, කියනලද්දේය; අත්තනොපදං, ආත්මනෙපදයතෙම; නොහොත් අපරෂට්කය; භාවෙ, භාවයෙහිද; කම්මනි, කර්මයෙහිද; කත්තරි, කර්තෘයෙහිදවේ; හෙවත් භාවකර්ම කර්තෘතුන ප්‍රකාශකරන්නේයයි කියනලද්දේය.

මෙසේ විභක්තීන්ගේ වාචකනියමය දක්වා දූන් ප්‍රත්‍යයභෙද දක්වන්නේ "**ඛජසා**" යනාදිය කීහ.

157 ඛජසාච, ඛප්‍රත්‍යයද ජප්‍රත්‍යයද සප්‍රත්‍යයද; ආයීයාච, ආයප්‍රත්‍යයද ඊයප්‍රත්‍යයද; ණෙච, ණෙප්‍රත්‍යයද; ණයොච, ණයප්‍රත්‍යයද; ණාපෙච, ණාපෙප්‍රත්‍යයද; අථ,ඉක්බිති; ණාපයොච ණාපය ප්‍රත්‍යයද; අලොච, අලප්‍රත්‍යයද: ණයොච, ණයප්‍රත්‍යයද; ආරොච, ආරප්‍රත්‍යයද; ආලොච, ආලප්‍රත්‍යයද; යොච, යප්‍රත්‍යයද; මෙ අකාරා, අප්‍රත්‍යයෝදෙදෙදනාද; ඉවණ්ණකා, ඉ ඊ ප්‍රත්‍යයෝද;

158 එ ඔකාරාච, එ ප්‍රත්‍යයද ඔප්‍රත්‍යයද; යොච, යප්‍රත්‍යයද; ණුණාච, ණුප්‍රත්‍යයහාණාප්‍රත්‍යයද; උණානාච, උණා ප්‍රත්‍යයද නාප්‍රත්‍යයද; ප්පණ්හාච,ප්පප්‍රත්‍යයද ණ්හාප්‍රත්‍යයද;තථා,එසේ;ඔයිරාච,ඔප්‍රත්‍යයද ඉරප්‍රත්‍යයද;ණෙණයාච,ණෙප්‍රත්‍යයද ණයප්‍රත්‍යයද;ඉති,මෙප්‍රකාරයෙන්; ඉමෙ එකතිංසපච්චයා, මේ එක් තිස් ප්‍රත්‍යයෝ වෙත්

**159 තෙසු ණෙවණයොණාපෙ ණාපයොච අලොතථා,**
**පච්ඡුවන කාරිතෙයෙව සෙසා අකාරිතෙසිතා.**

---

මෙහි "තිජගුපකිතමානෙහි ඛඡසාවා" යන සූත්‍රයෙන් ඛඡස ප්‍රත්‍යයොවෙති, තිතිකඛති ජිගුච්ඡති වීමංසති යනු උදාහරණයි. "ආය නාමතො කත්තුපමානා දචාරෙ" යන්නෙන් ආයප්‍රත්‍යයවේ.පබ්බතායති යනාදිය උදාහරණයි "ඊයූපමානාච" යන්නෙන් ඊය ප්‍රත්‍යයවේ. ඡත්තීයති යනාදිය උදාහරණයි. "නාමම්හාතනිච්ඡත්‍ථෙ" යන්නෙන් ඊය ප්‍රත්‍යයවේ, පත්තීයති යනාදිය උදාහරණයි. "ධාතුහි ණෙණය ණාපෙ ණාපයා කාරිතානි හෙතුවත්‍ථෙ" යන්නෙන් "ණෙණය ණාපෙ ණාපය යන ප්‍රත්‍යයොවෙත්,කාරෙති කාරයති කාරාපෙති කාරාපයති යනාදිය උදාහරණයි.එමසූත්‍රයෙහි අත්‍ථග්‍රහණයෙන් අල ප්‍රත්‍යයදවේ. ජොතලති යනාදිය උදාහරණයි. "ධාතුරූපෙ නාමස්මා ණයොච"යන්නෙන්ණයප්‍රත්‍යයවේ,අතිහත්‍ථයති යනාදිය උදාහරණයි. එහිම චග්‍රහණයෙන් ආර ආල ප්‍රත්‍යයොවෙත්, සන්තරාරති උපක්කමාලති යනාදිය උදාහරණයි. "භාවකම්මෙසුයො" යන්නෙන්ය ප්‍රත්‍යයවේ. සීයතෙ බුජ්ඣතෙ යනාදිය උදාහරණයි. "භූවාදිතොඅ" යන්නෙන්හා"රුධාදිතොනිග්ගහිතපුබ්බංච"යන්නෙන්දඅප්‍රත්‍යයෝ දෙදෙනෙක් වෙත්; භවති පඨති රුන්ධති ජින්දති යනාදිය උදාහරණයි. එහිම චග්‍රහණයෙන් ඉ ඊ එ ඔ ප්‍රත්‍යයෝදවෙත්, රුන්ධිති රුන්ධීති සුම්භෙති සුම්භොති යනාදිය උදාහරණයි. "දිවාදිතොයො" යන්නෙන් යප්‍රත්‍යයවේ, දිබ්බති බුජ්ඣති යනාදිය උදාහරණයි. "ස්වාදිතොණුණා උණාච" යන්නෙන්ණුණා උණා ප්‍රත්‍යයොවෙත්, අභිසුණොති අභිසුණාති සංවුණොති සංවුණාතියනාදියඋදාහරණයි. "කියාදිතොනා" යන්නෙන් නාප්‍රත්‍යයවේ, කිණාති ධුනාති යනාදිය උදාහරණයි. "ගහාදිතොප්පණ්හා"යන්නෙන් ප්පණ්හා ප්‍රත්‍යයෝ වෙත්, ඝෙප්පති ගණ්හාති යනාදිය උදාහරණයි, "තනාදිතො ඔයිරා" යන්නෙන් ඔයිර ප්‍රත්‍යයොවෙත්; කරොති කයිරති යනාදිය උදාහරණයි;'චුරාදිතො ණෙණයා' යන්නෙන් ණෙණය ප්‍රත්‍යයොවෙත්, චොරෙති චොරයති යනාදිය උදාහරණයි.

මෙසේ ප්‍රත්‍යයන්ගේ සරූප දක්වා ඔවුන්කෙරෙහි කාරිත අකාරිත වශයෙන් විභාග දක්වන්නේ''**තෙසුණෙච ණයොණාපෙ**,, යනාදියකීහ.

159 තෙසු, ඒ එක්තිස් ප්‍රත්‍යයන් අතුරෙන්; **ණෙච, ණෙ**

**160 ජොතකා පච්චයාතෙව විකරණා පකාසිතා,**
**නිග්ගහීතඤ්ච වණ්ණාති ආගමාමෙ පකාසිතා.**

ප්‍රත්‍යයද; ණෙයොච, ණය ප්‍රත්‍යයද; ණාපෙච, ණාපෙප්‍රත්‍යයද; ණාප යොච, ණාපයප්‍රත්‍යයද; තථා, එසේ; අලොච; අලප්‍රත්‍යයද යනු; එතෙපඤ්ච; මේ ප්‍රත්‍යයෝ පස්දෙන; කාරිතෙ එව; කාරිතයෙහිම වෙත්; සෙසා; සෙසුප්‍රත්‍යයෝ; අකාරිතෙ; අකාරිතයෙහි; සිතා; සි පියාහුයි.

මෙසේ කාරිතවිසින් ප්‍රත්‍යයන් විභාගකොට නැවත විකරණ අවිකරණවශයෙන් විභාගකරන්නේ **ජොතකා "පච්චයාතෙව"** ය නාදිය කීහ.

160 ජොතකාපච්චයා; යම් ජොතක ප්‍රත්‍යයකෙනෙක්වෙද; තෙව; ඔහුම;විකරණා; විකරණ ප්‍රත්‍යයෝයයි; පකාසිතා; ප්‍රකාශක රණලද්දහුය; නිග්ගහිතඤ්ච. නිග්ගහිතයද; ඉවණ්ණාච; ඉවර්ණ යද; ඉති; යන මේ ආකාරයෙන්; වෙ ආගමා; ආගමදෙකෙක්; පකා සිතා; ප්‍රකාශකරණලද්දහුය. §

විකරීයන්තී'ති= විකරණා; විසෙසන්තං ධාතවො විකරොන්ති භවන්ති එතෙහී'තිවා= විකරණා, සත්තරසපච්චයා යානු ටීකාහෙයි න් විකරණ ප්‍රත්‍යයෝ සතළොස්දෙනෙකි; ඔවුහුනම්— අ. ආ. ඉ. ඊ. එ. ඔ. ය. ණු. ණා. උණා. නා. ප්ප. ණ්හා. ඔ. සිර. ණෙ. ණය. යන මොහුයි. මොහුද භුවාදිතො අ, රුධාදිතො නිග්ගහිත පුබ්බංච මෙහිම චග්‍රහණයද, දිවාදිතොයො, සුවාදිතොණුණාඋණාච, කියා දිතොනා; ගහාදිතො ප්පණ්හා; තනාදිතො ඔයිරා;චුරාදිතො ණෙ ණයා; යනමේ සූත්‍ර අටින්වෙති. විකරණ ප්‍රත්‍යය භෙදයෙන් ධාතු ගණඅටෙකි. එනම්—භුවාදි රුධාදි දිවාදි සුවාදි කියාදි ගහාදි තනා දි චුරාදි යන මේ වශයෙනි.

නිග්ගහිතාගමනම් රුධාදිතො නිග්ගහිතපුබ්බංච යන්නෙන් වනනිග්ගහිතාගමයයි රුන්ධති යනාදිය උදාහරණයි ඉවර්ණ ආගමය නම් " ඉවණ්ණාගමොවා " යන්නෙන් වන ඉවර්ණ ආගමයයි.

§ "නිග්ගහිතඤ්චාති සුත්තෙන නිග්ගහිතාගමොහොති යථා චං කමති චංචලතීත්‍යාදි; තස්මා තයොතිපි වත්තබ්බෙ ගන්ථකාරො ජා තිවසෙනවා ගහිතා ගහණවසෙනවා ආගමා වෙති වුත්තං"සි=ටීකා.

161 භවෙය්‍යං තෙන පුඤ්ඤෙන ස්වාක්ඛාත ධම්මිකො අහං
බාලානං ජොතකො චෙව සද්ධා බලාදිකොපිච.

සප්පයොගං ආඛ්‍යාතභෙදං සමත්තං.

162 කංඛං ඡිරති සිස්සානං හිතං වා යං පකාසති,
සඤ්ඤස්සහෙතු භූතං තං කිතකනති පවුච්චති.

---

කරීයතෙ යනාදියෙහි උදාහරණයි. මෙහි ආගමා යි උපලක්ෂණවශයෙන් හෝ ප්‍රධානවශයෙන් කියනලදි. එහෙයින් ආදෙශයද ගතයුතු. ධාතුආදෙශ ප්‍රත්‍යය ආදෙශ විභක්ති ආදෙශ ආදිආදෙශ උත්තර ආදෙශ විභාවසංඛ්‍යාත අබ්භාස ආදෙශ වශයෙන් ආදෙශය ෂට් ප්‍රකාර වේ, ඒබව කියනලදි.

"ආදෙසො ඡබ්බිධො හොති ධාතුප්පච්චයා දෙසතො,
විභත්ත්‍යාදෙසතොආදී උත්තරබ්භාස දෙසතො" යි

මෙසේ යථොක්තනයින් ආඛ්‍යාතභෙදය දක්වා ඊට අනුරූප වූ ප්‍රාර්ථනාවදක්වන්නේ "භවෙය්‍යංතෙනපුඤ්ඤෙන" යනාදිය කීහ.

161 අහං, මම; අතෙන පුඤ්ඤෙන, මේ ආඛ්‍යාත භෙද කාරක පුණ්‍යය හේතුකොටගෙණ; ස්වාක්ඛාතධම්මිකො, ස්වාඛ්‍යාත ධර්ම ඇත්තෙක්; භවෙය්‍යං, වෙම්වා; බාලානං, මූලාවූ අඥනපුද්ගලයන්; ජොතකොචෙව, ප්‍රඥප්‍රදීපයෙන් බබුලුවන්නෙක්ද වෙම්වා; අපි, නැවත; සද්ධාබලාදිකොච, ශ්‍රද්ධාබල වීර්‍ය්‍යබල ප්‍රඥාබලාදිය ඇත්තෙක්ද වෙම්වා.

මම ආඛ්‍යාත නාලක්ෂණවූ ආඛ්‍යාතයාගේ යම් කථනයක් කෙළෙම්ද මේ පුණ්‍යයහෙතුකොටගෙණ බුදුන් විසින් ආදි මධ්‍ය පර්‍ය්‍යවශාන සඞ්ඛ්‍යාත ත්‍රිවිධස්ථානය පරිසුද්ධව දෙශනාකරණලද ධර්මය ඇතිවෙම්වා, අඥානවූ බාලජනයන්ගේ මොහාන්ධකාරය නසන්නාවූ ප්‍රඥාප්‍රදීපයෙන්ද යුක්තවෙම්වා. ශ්‍රද්ධාවීර්‍ය්‍යාදි බලයෙන්ද යුක්ත වෙම්වා කියා ප්‍රාර්ථනාකෙළේය යනු භාවයි.

සප්‍රයොග ආඛ්‍යාතභෙදය සම්පූර්ණ කරණ ලද්දේය.

---

මෙසේ සප්‍රයෝගවූ ආඛ්‍යාතභෙදය දක්වා දැන් සප්‍රයොග කිතකභෙදය දක්වන්ට "කංඛං ඡිරති සිස්සානං" යනාදිය කීහ.

162 සිස්සානං, පර්‍ය්‍යාප්තිය උද්ග්‍රහණ ධාරණාදිය කරණලද පුද්ගලයන්ගේ; කංඛං, විමතිය; ඡිරති, හරණේද; වා, නොහොත්; යං,

**163 කිතකං තිවිධං තත්‍ථ කිතකිච්චුභයං කමා,**
**කත්තරි භාවකම්මෙසු තිසු තෙ වාචකා මතා.**

**164 යො කරොතීති කත්තා’ව පච්චයන්තීති පච්චිතා,†**
**කාතවෙ ඉති කත්තබ්බං ඉදං තෙසං නිදස්සනං.**

---

යම් ප්‍රත්‍යයසමූහයක්; හිතං පකාසතීති, ශිෂ්‍යයන්ට හිත ප්‍රකාශක රේද; ඤාණස්ස, ඥානයට නොහොත් ශබ්දපිජානනයට; හෙතුභූතං, හේතුවූයේද; තං, ඒ ප්‍රත්‍යය සමූහය; කිතකන්ති පවුච්චති, කිතක යයි කියනු ලැබේ.

(කංසද්දො සුබචාචකො පාටිපදිකො සිස්සානං කංඛං කිරති වික්ඛිපති අපනෙතීති කිතො, සිස්සානං වා හිතං කරොතීති කිතො කිතොඑවකිතකො තබ්භාවපෙක්ඛපච්චයො.) .

මෙසේ කිතකශබ්දයට විග්‍රහ දක්වා ඒ කිතක භෙද දක්වන්නේ **“කිතකං තිවිධං තත්‍ථ”** යනාදිය කීහ.

163 කිතකං, කිතකප්‍රත්‍යය; තිවිධං, ත්‍රිවිධාකාරවේ; තත්‍ථ, ඒ ත්‍රිවිධාකාරයන් අතුරෙහි; කිතකිච්චුභයං, කිතප්‍රත්‍යය කිච්චප්‍රත්‍යය කිතකිච්චප්‍රත්‍යය (යනමොහු); කමා, යථාක්‍රමයෙන් වෙත්, කත්තරිභාවකම්මෙසු තිසු කර්තෘ භාව කර්ම යනතුනෙහි; තෙ, ඒ ත්‍රිවිධප්‍රත්‍යයෝ; වාචකා මතා, වාචකයෝයයි දන්නාලද්දාහුය.

(කෙසේද? යම්ප්‍රත්‍යයකෙනෙක් කර්තෘකාරකයෙහි වෙද්ද ඔව්හු කිතප්‍රත්‍යයෝ නම්වෙත්, යම් ප්‍රත්‍යයකෙනෙක් භාවකර්ම දෙක්හිවෙද්ද ඔව්හු කිච්චප්‍රත්‍යයෝ නම් වෙත්. යම් ප්‍රත්‍යයකෙනෙක් කර්තෘකාරකයෙහි හා භාවකාරක කර්මකාරකයෙහිත් වෙද්ද ඔව්හු කිතකිච්ච ප්‍රත්‍යයෝ නම් වන්නාහුයි.)

එහෙයින් කියනලදි.

“තයො පච්චයා විඤ්ඤෙය්‍යා කිතකා කිච්චකා තථා,
කිතකිච්ච ගණාචෙති සද්ද සත්‍ථෙ පකාසිතා.
කිතකා කත්තරි ඤෙය්‍යා භාවකම්මෙසු කිච්චකා.
කිතකිච්චාතු සබ්බත්‍ථ යෙභුය්‍යෙන පවත්තරෙ,, සී·

මෙසේ ප්‍රත්‍යය භෙද දක්වා ඊට උදාහරණ දක්වන්නේ “යොකරොතීති” යනාදිය කීහ.

164 යො කරොතී ති, කත්තා’ව, යො කරොතී ති කත්තා යනුද;- පච්චයන්ති පච්චිතා, පච්චයන්ති පච්චිතා යනුද; කාතවෙ ඉති කත්තු

---

† ‘පච්චිතා’, සීද පාඨයි-

165 තඤ්ඤාකාරෙච ණො ණ්වුච තාවී ක්වි රම්ම ණී යුරූ,
ණුකො රෙ තබ්බා ණී යො ණ්‍යාතෙය්‍යා* රිච්චයූතිච

166 අතිච රිරියො තොච තාවී තවන්තු තාබපි,
තවෙතුං තූනත්වානත්වා මානනෙනාරිතුර තුච,
තුකො ඡත්තිංස සාමඤ්ඤා නාමතො හොන්ති පච්චයා

---

ක්‍ඛව, කාතවෙ ඉති කත්තුං යනුද; ඉදං මේ; තෙසං, ඒකිතකිච්චකිතති ච්චප්‍රත්‍යයන්ට; නිදස්සනං, නිදර්ශනයි හෙවත් උදාහරණයි.

මෙහි භාව නම්. කරොතීති කාරකො යනු කර්තෘවාචකවූ කිතප්‍ර ත්‍යයට උදාහරණය. පචීයතෙති පච්චිතා යනු භාව කර්ම වාචක කිච්ච ප්‍රත්‍යයට උදාහරණය. කාතවෙ ඉති කත්තුං යනු (ටීකාවෙහි දැක්වූ කරිස්සාමීති කත්තුං කාරීයතෙති කත්තුංකරණං කත්තුං යනුද) කර්තෘ කර්ම භාව යන කාරකත්‍ර යෙහි වන කිතකිච්ච ප්‍රත්‍යයට උදාහරණය යනු භාවයි.

මෙසේ උදාහරණ දක්වා දැන් ත්‍රිවිධවූ කිතකිච්ච කිතකිච්ච යන ප්‍රත්‍යයන්ට සාමාන්‍ය වශයෙන් ස්වරූප දක්වන්නේ "තඤ්ඤාකා රෙච" යනාදියකිහ.

165 තඤ. ඒ ත්‍රිවිධ ප්‍රත්‍යයන් කෙරෙහි; අකාරොච, අ ප්‍රත්‍යයද, ණොච, ණ ප්‍රත්‍යයද; ණ්වුච, ණ්වු ප්‍රත්‍යයද; තුච, තු ප්‍රත්‍යයද; ආවී ච, ආවි ප්‍රත්‍යයද; ක්විච, ක්විප්‍රත්‍යයද; රම්මච, රම්මප්‍රත්‍යයද; ණී ච, ණීප්‍රත්‍යයද; යුච, යුප්‍රත්‍යයද; රූච, රූප්‍රත්‍යයද; ණුකච, ණුකප්‍ර ත්‍යයද; රොච, රප්‍රත්‍යයද; තබ්බච, තබ්බප්‍රත්‍යයද; අනීයොච, අනීයප්‍ර ත්‍යයද; ණ්‍යච, ණ්‍යප්‍රත්‍යයද; තෙය්‍යාච. තෙය්‍යප්‍රත්‍යයද; රිච්ච ච. රිච්චප්‍රත්‍යයද; යුච යුප්‍රත්‍යයද; තිච, තිප්‍රත්‍යයද;

166 අච, අප්‍රත්‍යයද; තිච, තිප්‍රත්‍යයද; රිරියොච, රිරිය ප්‍රත්‍ය යද, තොච, තප්‍රත්‍යයද; තාවීච, තාවී ප්‍රත්‍යයද; තවන්තුච, තව න්තුප්‍රත්‍යයද; ඉනච, ඉනප්‍රත්‍යයද; බපිච, බප්‍රත්‍යයද; තවෙච තවෙප්‍රත්‍යයද; තුංච, තුංප්‍රත්‍යයද; තූනච, තූනප්‍රත්‍යයද; ත්වානච, ත්වා නප්‍රත්‍යයද; ත්වාච, ත්වාප්‍රත්‍යයද; මානච, මානප්‍රත්‍යයද; අනෙනාච, අනන ප්‍රත්‍යයද; රත්‍ථුච, රත්‍ථුප්‍රත්‍යයද; § රිතුච, රිතුප්‍රත්‍යයද; රාතුච, රා

---

* ඇතම්කෙනෙක් තය්‍යප්‍රත්‍යයසිද්ද දිට්ඨය්‍යං පත්තය්‍යං යි උදාහ රණදකෙරෙත්.

§ රත්‍ථුප්‍රත්‍යයක් ගාථාවෙහි නැත්තේනමුදු ටීකාවෙහි සතිස්ප්‍ර ත්‍යයන් විස්තර කිරීමේදී දක්වා 'අතිචරිරියො' යනාදි ගාථාවට අනතරුව.

තුප්‍රත්‍යයද; තුංකොව, තුකප්‍රත්‍යයද්දයි කියා මේ ප්‍රභේදයෙන්; සාමඤ්ඤනාමතො, සාමාන්‍යනාමවශයෙන්; ඡත්තිංසපච්චයා හොන්ති, සතිස්ප්‍රත්‍යයකෙනෙක් වන්නාහුය.

මෙහි අද්‍රත්‍යය නිද්‍රත්‍යය දෙක අගහිතග්ගහණවිසයෙන් කියනලද්දහ නොහොත් ගාථාවන්ගේ ඡන්දනුරක්ෂණය පිණිස කියනලද්දහ එහිද සතිස් ප්‍රත්‍යයෝ යථාගතවශයෙන් මෙසේ දතයුක්තාහ 'ණඤ්ඤදා සමතු' යනසූත්‍රයෙන් අප්‍රත්‍යයවූයේය. අරිංදමෙති'ති= අරින්දමො යනාදිය උදාහරණය. 'ධාතුයා කම්මාදිම්හි ණො' යන්නෙන් ණප්‍රත්‍යයවී කම්මං කරොති'ති= කම්මකාරො, යනාදිය උදාහරණය. 'සබ්බතො ණ්වුත්වාවී වා' යන්නෙන් අණ්වුතු ආ වි යන ප්‍රත්‍යයෝ වෙති, හිතං කරොතී'ති= හිතකරො, රථං කරොතී'ති= රථකාරකො, තස්ස කත්තා= තස්සකත්තා, භයං පස්සතී'ති= භයදස්සාවී යනාදිය උදාහරණය. "ක්විච" යනසූත්‍රයෙන් ක්විප්‍රත්‍යයවී, විසෙසෙනභවතී'ති= විභූ, අභිභවිත්වා භවතී'ති= අභිභූ යනාදිය උදාහරණය, 'ධරාදීහිරම්මො' යන්නෙන් රම්මප්‍රත්‍යයවේ, ධරතීතෙනා'ති= ධම්මො, කරීයතෙ'ති= කම්මං යනාදිය උදාහරණය, 'තස්සීලාදිසුණීත්වාවීච' යන්නෙන් ණී තු ආවී යන ප්‍රත්‍යයෝවෙත්, පියං පසංසිතුං සීලං යස්සරඤ්ඤො සො හොති රාජා= පියපසංසී, පසය්හපවත්තිතුං සීලං යස්සරඤ්ඤො සොහොතිරාජා= පසය්හපවත්තා, භයං පස්සිතුං සීලං යස්ස සමණස්ස සොහොති සමණො=භයදස්සාවී, යනාදිය උදාහරණය,'සද්දකුධචලමණ්ඩත්ථරුචාදීහියු, යන්නෙන් යු ප්‍රත්‍යයවේ, ඝොසනසීලො=ඝොසනො යනාදිය උදාහරණය, 'පාරාදිගම්මිහාරූ' යන්නෙන් රූප්‍රත්‍යයවේ. භවපාරංගන්තුං සීලං යස්ස පුග්ගලස්ස සොහොති පුග්ගලො= භවපාරගූ යනාදිය උදාහරණය. 'හනත්‍යාදීනං ණුකො' යන්නෙන් ණුකප්‍රත්‍යයවේ. ආහනනසීලො= ආඝාතුකො, කරණසීලො= කාරුකො, යනාදිය උදාහරණය, 'සංහනඤ්ඤායවා රොසො' යන්නෙන් රප්‍රත්‍යයවේ; සමග්ගං කම්මං

---

" රිරියො පච්චයො තොවතාවිතවන්තු නාඛපි
තවෙතුංතුනත්වානත්වා මානනෙනා රත්‍ථු රීතුච
රාතු තුකොති ඡත්තිංස නාම්මතා හොන්ති පච්චයා" සී=දක්වා

'අතිච රිරියො'යනාදිගය පුරාණයයිද, 'රිරියො පච්චයො' යනාදිගය අභිනවයයිද ඉතා දීඝීවදක්වනලදි- සාරාත්‍ථදීපිකාසිතිසයෙහිද එසේම දක්වා සතිසයේ අනූන අනධිකත්වය සඳහා 'රිරියො' යනාදිය සඩාකබැව්ද නමුත් විචාරනය කටයුතුබවද කියනලදී.

සමුපගච්ඡතී'ති= සංසො යනාදිය උදාහරණය, 'භාවකම්මෙසු ත බ්බානීයා' යන්නෙන් තබ්බඅනීය ප්‍රත්‍යයෝවෙත්. භූයතෙ= භවිත බ්බං භවනීයං යනාදිය උදාහරණය 'ණ්‍යාච' යන්නෙන් ණ්‍ය ප්‍රත්‍ය යවේ, කත්තබ්බං= කාරියං, ජෙතබ්බං= ජෙය්‍යං, යනාදිය උදාහර ණය, මෙම සුත්‍රයෙහි චග්‍රහණයෙන් තෙය්‍යප්‍රත්‍යයවේ, පස්සීයතෙ= දිට්ඨෙය්‍යං ,පාපුනීයතෙ= පත්තෙය්‍යං, යනාදිය උදාහරණය. 'කරම්හාරිච්ච' යන්නෙන් රිච්ච ප්‍රත්‍යයවේ. කත්තබ්බං= කිච්චං යනාදි යඋදාහරණය, 'නන්දාදීහියු'' යන්නෙන් යුප්‍රත්‍යයවේ. නන්දීයතෙ න න්දිතබ්බං= නන්දනං යනාදිය උදාහරණය, 'තිකිත්වාසිඩෙ' යන් නෙන් තිප්‍රත්‍යයවේ, ජිනොඑතං බුජ්ඣිතුනි= ජිනබුද්ධි, යනාදිය උදාහරණය, 'කරතොරිරිය' යන්නෙන් රිරිය ප්‍රත්‍යයවේ, කත්ත බ්බා= කිරියා යනාදිය උදාහරණය, 'අතීතෙතතවන්තුතාවී' යන් නෙන් තතවන්තුතාවීයන ප්‍රත්‍යයෝවෙත්; හුතො හුතවා හුතාවීයනා දිය උදාහරණය. 'ජිතොඉන සබ්බත්ථ' යන්නෙන් ඉන ප්‍රත්‍යයවේ, පාපකෙ අකුසලෙ ධම්මෙ අජිනිජිනාති ජිතිස්සතී'ති= ජිනො යනා දිය උදාහරණය, 'ඊසදුස්සුහිඛ' යන්නෙන් ඛප්‍රත්‍යයවේ. ඊසස්සයො දුස්සයො සුස්සයොයනාදියඋදාහරණය. 'ඉච්ඡත්ථෙසුසමානකත්තුකෙ සු තවෙතුංවා' යන්නෙන් තවේතුං ප්‍රත්‍යයෝවෙත්. පුඤ්ඤානිකා තුමිච්ඡතී'ති= කාතවෙ, සද්ධම්මංසොතුමිච්ඡතී'ති= සොතවෙ, යනාදි ය උදාහරණය. 'පුබ්බකාලෙකකත්තුකානං තුනත්වානත්වාවා' යන් නෙන් තුනත්වානත්වා ප්‍රත්‍යයෝවෙත්. අකාතූන පුඤ්ඤං කිලමිස්ස න්ති සත්තා සුත්වාන ධම්මං මොදන්ති සුත්වා ජානිස්සාමි යනාදිය උදාහරණය. 'වත්තමානෙ මානන්තා' යන්නෙන් මානඅන්ත ප්‍රත්‍ය යෝවෙත්, සරතී'ති= සරමානො, ගච්ඡන්තො ගණ්හන්තො යනා දිය උදාහරණය, 'සාසාදීහිරත්ථු' යන්නෙන් රත්ථුප්‍රත්‍යයවේ. සාසතී ති= සත්ථා යනාදිය උදාහරණය. 'පාදිතොරිතු' යන්නෙන්රිතුප්‍රත්‍ය යවේ. පාලෙතිපුත්තං'ති=පිතායනාදිය උදාහරණය. 'මානාදීහිරාතු යන්නෙන් රාතුප්‍රත්‍යයවේ. ධම්මෙනපුත්තං මානෙතී'ති= මාතා, ය නාදිය උදාහරණය. 'ආගමාතුකො' යන්නෙන් තුකප්‍රත්‍යයවේ. ආ ගච්ඡතී'ති= ආගන්තුකො, යනාදිය උදාහරණයි. මෙසේ අගහිතග්‍ර හණයෙන් ප්‍රත්‍යයෝ සනිසෙක්වෙති යි දතයුතුයි.

අගහිතග්‍රහණයෙන් වනප්‍රත්‍යය දක්වා දැන් යථාගතවශයෙන් ප්‍රත්‍යයදක්වන්නේ "**තෙසුවකාරො කාසොණොච**" යනාදිය කීහ.

**167 තෙසුවකාරා තයො ණොව චතස්සො ත්වාවියොදුවෙ,**
**රූතාදුවෙ තයො යූනිපඤ්චතාළිස අත්ථතො.**

**168 තත්‍රා කාරෙච ණොණීචත්වා විරූතොණු කොචිතො,**
**අනෙනා රිතුදසෙකොච කත්තාරිසෙච ඤුකති.**

---

167 තෙසු, යථොක්ත ප්‍රත්‍යයන් අතුරෙන්; අකාරොතයොව, අප්‍රත්‍යය තුනද; චතස්සොණො, ණප්‍රත්‍යය සතරද; තු ආවියොදුවෙ, තු ආවිප්‍රත්‍යයදෙකද; රූතාදුවෙ, රූත ප්‍රත්‍යයදෙදෙනද; තයොයූනි යුනි ප්‍රත්‍යය තුනද්දූයි; අත්ථතො, අර්ථවශයෙන්; පඤ්චතාළිස, ප්‍රත්‍යයෝ පන්සාළිසෙක් වන්නාහුය.

මෙහි භාවනම් තුන් සූත්‍රයකින් කරණලද බැවින් අප්‍රත්‍යයෝ තුනෙක් වූහ. සිව් සූත්‍රයකින් කරණලද බැවින් ණ ප්‍රත්‍යය සතර ක්වූහ. සූත්‍රවයකින් කරණලදබැවින් තු ආවීප්‍රත්‍යයෝ දෙදෙනෙක් වූහ. රූතප්‍රත්‍යයෝද සූත්‍රවයකින් කරණ ලද බැවින් දෙකක්වූහ. සූත්‍ර ත්‍රයකින් කරණ ලදබැවින් යුනිප්‍රත්‍යයෝ තුන්දෙනෙක් වූහයි දතයුතුයිසේයි. යථොක්ත ප්‍රත්‍යයෝ පිළිවෙලින් "සඤ්ඤායමනු" "සබ්බතො ණ්වුත්වාවීවා" 'ඉවණ්ණ මනිය චොවා' යනසූත්‍ර තුනින්අප්‍රත්‍යය තුනෙක්වෙති, "ධාතුයා කම්මාදිම්හිණො" "විසරුජ පදාදිතොණ" "භාවෙච" "කම්මණිණො" යනසූත්‍රසතරින් ණප්‍රත්‍යය සතරෙක්වෙති. "සබ්බතො ණ්වුත්වාවීවා" "තක්කසීලාදි සුණීත්වාවීච" යනසූත්‍රවයෙන් තු ආවී ප්‍රත්‍යයදෙකෙක් වෙති. "පාරාදි ගම්මිහාරූ" 'භික්ඛාදි තොච' යන සූත්‍රවයෙන් රූප්‍රත්‍යයෝ දෙදෙනෙක්වෙති"භාවකම්ම සුත""බුධාගමාදිත්‍ථෙකත්තරි" යනසූත්‍රවයෙන්තප්‍රත්‍යයෝදෙදෙනෙක්වෙති."සඤ්කුධචලමණ්ඩත්‍ථරුචාදීහියු""නන්දාදීහියු" කත්තුකරණ පපදෙසෙසුච"යනසූත්‍රත්‍රයෙන්යුප්‍රත්‍යයෝ තිදෙනෙක්වෙති. 'ඉවණ්ණ මනියචොවා'යනසූත්‍රයෙන්වනයුප්‍රත්‍යය පළමුයුප්‍රත්‍යයන්ටවඩාවිශෙෂව සත්‍රිවාචකවේ; මේසූත්‍රයෙන්හා' තිකිත්වාසිසෙ"යනසූත්‍රයෙනුත් ප්‍රත්‍යයදෙකෙක්වෙත්, මෙසේ ගහිතාගහණවශයෙන්වූ ප්‍රත්‍යයනව ය සතිස් ප්‍රත්‍යයන් කෙරෙහි බනාහිණුකල්හි පන්සාළිස් ප්‍රත්‍යය කෙනෙක්වෙතියි යදුභාවයි.

මෙසේ ප්‍රත්‍යයාගේ භෙදදක්වා නැවත වාචක නියමය දක්වන්නේ **'තත්‍රා කාරොචණොණීච'** යනාදිය කීහ.

168 තත්‍ර, ඒසතිස් ප්‍රත්‍යයන් අතුරෙන්; අකාරොච, අප්‍රත්‍යය ද; ණොච, ණප්‍රත්‍යයද; ණීච, ණීප්‍රත්‍යයද; තු ආවීච, තුප්‍රත්‍යයහා ආ

169 තබ්බානීයාණ්‍ය රිච්චාච රිරිශොචාපි පච්චයා,
පඤ්චිමෙහාවකම්මෙසු මාතෙනාකත්තරිකම්මනි.

170 සෙසා එකූනවීසාච පච්චයා තිසු ජායරෙ,
තාවෙතුං තූනත්වා නත්වා හාවෙ ව්‍යාකරණෙ මතා.

---

වීප්‍රත්‍යයද; රූව, රූප්‍රත්‍යයද; තොව, තප්‍රත්‍යයද; ණුකොව, ණුකප්‍රත්‍යයද; ඉතොව, ඉතප්‍රත්‍යයද; අනන්තොව, අනන්ත ප්‍රත්‍යයද; රිතුව, රිතුප්‍රත්‍යයද; දසෙකෙව, එකාදස ප්‍රත්‍යයෝම; කත්තරි එව, කර්තෘ අර්ථයෙහිම(වත්නාහුයයි;) සඤ්ඤිතා, දත්තාලැබේ.(එහි අ.ණ.ණී. තු, ආවී. රූ.ත. ණුක.ඉත. අනන්ත. රිතු යනමේ එකාදසප්‍රත්‍යයෝ කර්තෘ අර්ථයෙහිම වත්නාහුය යනු භාවයි )

මෙසේකර්තෘකාරකයෙහි ප්‍රයමුඛයෙන් වාචකත්වයදක්වා දැන් භාව කර්මාදීන්ගේ වාචකය දක්වන්නේ 'තබ්බානීයා ණ්‍යරිච්චාච' යනාදිය කීහ.

169 තබ්බානීයා ණ්‍යරිච්චාච, තබ්බප්‍රත්‍යයද අනීය ප්‍රත්‍යයද ණ්‍ය ප්‍රත්‍යයද රිච්චප්‍රත්‍යයද; අපි.නැවත; රිරියොව, රිරියප්‍රත්‍යයදැයි යන; ඉමෙ පඤ්චපච්චයා, මේප්‍රත්‍යයෝපස්දෙන; භාවකම්මෙසු, භාවකර්ම දෙක්හිවෙති; මාතෙනා,මානප්‍රත්‍යය; කත්තරි කම්මනි,කර්තෘකර්ම දෙක්හිවේ.(තබ්බ. අනීය. ණ්‍ය. රිච්ච. රිරිය. යනමේ ප්‍රත්‍යයෝ පස්දෙන භාවාර්ථ කර්ම.ඒ දෙක්හි නොහොත් භාවකාරක කර්ම කාරක දෙක්හිවෙති. මානප්‍රත්‍යය කාර්තෘාර්ථ කර්මාර්ථ දෙක්හි වත්නේය යනු භාවයි.)

මෙසේ එක ඒවාචක විකාර්ථ වාචක ප්‍රත්‍යයන් දක්වා දැන් ත්‍රිකාර්ථ වක ප්‍රත්‍යයන් දක්වන්නේ 'සෙසා එකූන වීසාච' යනාදිය කීහ.

170 සෙසා,සෙසු; පච්චයාඑකූන වීසාච එකුන්විසි ප්‍රත්‍යයෝම; තීසු ජායරෙ, කර්තෘ කර්මභාව යන කාරකත්‍රයෙහිඋපදින්නාහුය. ව්‍යාකරණෙ, ව්‍යාකරණ ශාස්ත්‍රයෙහි; තාවෙතුං තූනත්වා නත්වා, තවෙප්‍රත්‍යය තුංප්‍රත්‍යය තූනප්‍රත්‍යය ත්වාන ප්‍රත්‍යය ත්වාප්‍රත්‍යය යන මොහු; භාවෙ, භාවාර්ථයෙහි; මතා, දන්නා ලද්දාහුය.

(මෙහි භාවනම් ණු. ක්වි. රම්ම. යු. රූ. තෙය්‍ය. යු. ති. තාවි. තවන්තු. බ. තවෙ තුං, තූන. ත්වාන. ත්වා. රඤ්ඤ. රාතු තුක, යනමේ එකුන්විසි ප්‍රත්‍යයෝ කාර්තෘාර්ථ භාවාර්ථ කර්මාර්ථ යනතුනෙහි වත්නාහුය. ව්‍යාකරණ ශාස්ත්‍රයෙහිවූ තවෙ. තුං. තූන. ත්වාන. ත්වා යන

171 අන්තාතු වත්තමානම්හි අතීතෙ තතවන්තාදයො,
මානන්තු වත්තමානානාගතෙ සෙසා තිකාලිකා.

172 කත්තුකම්මඤ්ච කරණං සම්පදානමපාදනං,
අධිකරණභාවොචාති සත්තධා සාධනන්තු.

---

මේ ප්‍රත්‍යයෝ පස්දෙන භාවාර්ථයෙහි වෙති. කර්තෘ කර්මදෙක්හි නො වෙති. එහෙයින් තුදුස් ප්‍රත්‍යයකෙනෙක් කාරකත්‍රයෙහි වන්නාහු ය. ප්‍රත්‍යයෝ පස්දෙනෙක් භාවයෙහි වන්නාහුයයතු භාවති)

මෙසේ වාච්‍ය නියමය දක්වාදූන් කාලනියමය දක්වන්නේ 'අන්තාතුවත්තමානම්හි' යනාදියකීහ.

171 අන්තාතු, අන්ත ප්‍රත්‍යය වනාහි; වත්තමානම්හි, ප්‍රත්‍යුත්පන්නකාලයෙහිවේ; තතවන්තාදයො, තතවන්තුආදිප්‍රත්‍යයෝ; අතීතෙ, අතීත කාලයෙහිවේත්; මානන්තු මානප්‍රත්‍යය වනාහි; වත්තමානානාගතෙ, වර්තමාන අනාගත කාලවයෙහිවේ; සෙසා. ණප්‍රත්‍යය ආදිවූ සෙසු ප්‍රත්‍යයෝ; තිකාලිකා, අතීතානාගත වර්තමාන යන කාලත්‍රයෙහිවෙති; නොහොත් කාලත්‍රය ඇත්තාහුය.

(එහි අන්ත ප්‍රත්‍යය ප්‍රත්‍යුත්පන්නකාලයෙහි පවත්නේය. භුජන්තො වාචං භාසති යනාදිය උදාහරණය. තතවන්තු තාවීයන ප්‍රත්‍යයෝ තුන්දෙන අතීතකාලයෙහි පවත්නාහුය. හුතො හුතවා හුතාවී යනාදිය උදාහරණය. මානයන එක්ප්‍රත්‍යයක් වර්තමාන අනාගතකාලවයෙහිවේ. මිනෙතබ්බං වත්ථුං මිනායමානො ගච්ඡති වුය්හමානො රුක්ඛො නාසිස්සති යනාදිය උදාහරණය, සෙසු ණප්‍රත්‍යය ආදිකොටඇති ප්‍රත්‍යයෝ අතීතානාගත ප්‍රත්‍යුත්පන්න කාලයෙහි පවත්නාහුය. උදාහරණ කාත්‍යායන ග්‍රන්ථයෙහි ආනසින්දතයුතු.)

මෙසේ සතිස් ප්‍රත්‍යයන්ට කාල නියමයදක්වාදූන් යථොක්තප්‍රත්‍යයන් කෙරෙහි යථානුරූපවලභ්‍යමානවූ සාධනභෙද දක්වන්නේ 'කත්තු කම්මඤ්ච කරණං' යනාදියකීහ.

172 කත්තුකම්මඤ්ච, කර්තෘසාධනය හා කර්මසාධනයද; කරණං, කරණසාධනයද; සම්පදානං, සම්ප්‍රදානසාධනයද; අපාදනං, අපාදන සාධනයද; අධිකරණභාවො ඉති, අධිකරණසාධනය හා භාවසාධන යදූයි; සාධනන්තු, සාධනයන්කරණකොටගෙණ නොහොත් සාධනයෝ; සත්තධා, සත්වැදෑරුම්වේ.

මෙසේ සාධනයාගේ සප්තප්‍රභෙදයදක්වා කර්තෘසාධන ආදීන්ට උපලක්ෂණදක්වන්නේ "සොවාකොයකාරකොකත්තා," යනාදියකීහ.

**173 යො වාක්‍යෙ කාරකො කත්තා පසිද්ධෙසොව ලබ්භති,**
**කත්තුසාධනමීරයන්ති සෙසෙස්වපි අයං නයො.**

**174 උදාහරණමෙතෙසං කතමන්තිතු පුච්ඡිතො,**
**කත්තුකම්මාදයො එව දස්සෙතබ්බා යථාක්කමං.**

---

173 යො, යමෙක් තෙම; වාක්‍යෙ, වාක්‍යාවස්ථාවෙහි; කාරකො, කාරකයෙක්වේද; කත්තා, ක්‍රියාවකරන්නෙක්වේද; පසිද්ධෙ, ප්‍රසිද්ධියෙහි හෙවත් කිතකනිෂ්ඨාවඇතිකල්හි; සොඑව, ඒකර්තෘම; ලබ්භති, ලැබේද; කත්තුසාධනං ඊරයන්ති, ඒ කර්තෘසාධනයයි කියත්; සෙසෙසු අපි, ඉතිරි කර්මසාධන කරණසාධනාදියෙහිද; අයං නයො, මේක්‍රමය දතයුතුවේ.

එහි යමෙක් වාක්‍ය අවස්ථාවෙහි කර්තෘක්‍රියාව කරන්නෙක් වේද ප්‍රසිද්ධියෙහින් එම කර්තෘ ලැබේද මේ කර්තෘසාධනය නම, ගො අස්සො ඉත්ථි පුරිසො යනාදිය උදාහරණයි. යම්කාරකයක් වාක්‍යාවස්ථාවෙහි දී කර්මක්‍රියාවට කර්මවේද ප්‍රසිද්ධියෙහිදීත් නොහොත් නිම් කල්හිත් එම කර්මය ලැබේද මේ කර්මසාධන නම, කිච්චං කරණීයං යනාදිය උදාහරණයි. යම්කාරකයක් වාක්‍යාවස්ථාවෙහි ක්‍රියාවට කරණවේද ප්‍රසිද්ධියෙහිත් එම කරණය ලැබේද මේකරණසාධනයනම්, මජ්ජනං හනනං කරණං යනාදිය උදාහරණයි. යම් කාරකයක් වාක්‍යාවස්ථාවෙහි ක්‍රියාවට සම්ප්‍රදානයවේද ප්‍රසිද්ධියෙහිත් එම සම්ප්‍රදානයලැබේද මේ සම්ප්‍රදාන සාධනයනම සම්පදානං යනාදිය උදාහරණයි. යම්කාරකයක්වනාහි වාක්‍යාවස්ථාවෙහි ක්‍රියාවට අපාදානවේද ප්‍රසිද්ධියෙන් එම අපාදානයවේද මේ අපාදාන සාධනයනම අපාදානං යනාදිය උදාහරණයි. යම් කාරකයක් වනාහි වාක්‍යවස්ථාවෙහි ක්‍රියාවට අධිකරණවේද ප්‍රසිද්ධියෙහිත් එම අධිකරණය ලැබේද මේ අධිකරණ සාධනයනම ඨානං පුරං යනාදිය උදාහරණයි. යමෙක් ධාතුප්‍රත්‍යයන්ගේ අර්ථයවේද විශෙෂයෙක් නැද්ද මේ භාවසාධනයනම, නජ්ජී නන්දනං යනාදිය උදාහරණයි.

මෙසේ සාධනයට උපලක්ෂණ දක්වා මේ සාධනයන්ට උදාහරණ කවරේදැයි යන චොදනාවට පරිහාර දක්වන්නේ "**උදාහරණමෙතෙසං**" යනාදිය කීහ.

174 එතෙසං, මේ සත්ප්‍රකාර සාධනයන්ට; උදාහරණං, උදාහර

175 වුත්තා වුත්ත වසා කත්තු ද්විධා බුද්ධොතු නිස්සයො,
සුද්ධහෙතු වසෙනාපි නාමං එව පකාසිතං.

---

ණ; කතමංඉති, කවරේදැයි; පුච්ඡිතොතු, විචාරණලද්දේ වනාහි; ක ත්තුකම්මාදයොඑව, කර්තෘකර්මාදිහුම; යථාක්කමං, පිළිවෙලින්; දස්සෙ තබ්බා, දක්විය යුක්තාහුය.

මේ කර්තෘසාධනාදියට උදාහරණ කවරේදැයිකියා අනුන් විසින් විචාරණලද්දාවූ යමෙක් ඇතිනම් ඔහුවිසින් අනික් උදාහරණයක් නොසොයා කර්තෘ කර්ම කරණ සම්ප්‍රදාන අපාදාන අධිකරණ යන මොහුම උදාහරණ පිණිස දක්වියයුක්තාහුයයි සේයි.

ඒ උදාහරණයන් අතුරෙන් “කරොතී'ති=කත්තා” කියා විග්‍රහ දක්වූයේ කර්තෘසාධන නම. ඒ කර්තෘසාධනයට එම කත්තා යන් න උදාහරණබවය, “කරීයතෙ'ති=කම්මං” මේ කර්මසාධනය හා ඊට එම කම්මං යන පදය උදාහරණවූබවය, “කරීයතෙ අනෙන.'ති=කර ණං” මේ කරණසාධනය හා ඊට එම කරණං යන පදය උදාහරණ බවය, “සම්පජ්ජ අස්ස දදාතී'ති=සම්පදානං” මේ සම්ප්‍රදාන සාධන ය හා ඊට සම්පදානං යන පදය උදාහරණවූබවය, අපෙනච්ච ඉතො ආදදාති'ති=අපාදානං” මේ අපාදානසාධනය හා ඊට එම අපාදානං යන පදය උදාහරණවූ බවය, “අධිකරොති පතිට්ඨාති එත්ථා'ති= අධි කරණං” මේඅධිකරණය හා ඊට එම අධිකරණං යන පදය උදාහ රණවූ බවය, “භවනං=භාවො” මේ භාවසාධනය හා ඊට එම භාවො යන පදය උදාහරණවූ බවයයි සේයි.

මෙසේ සත්ප්‍රකාර සාධනයාගේ සාමාන්‍ය භෙදදක්වාඔවුන්අ තුරෙන් කර්තෘසාධනයාගේ භෙදදක්වන්නේ “වුත්තාවුත්ත වසා” ය නාදිය කීහ.

175 කත්තු, කර්තෘසාධනය; වුත්තාවුත්තවසා, උක්තාකර්තෘ සාධන ය අනුක්තකර්තෘසාධනය යන මොවුන්ගේ වසයෙන්; ද්විධා, ද්විප්‍රකාර වේ; බුද්ධොතු, බුද්ධො යනු වනාහිඋක්තකර්තෘ සාධනය නම; නිස්ස යො,නිස්සයො යනුඅනුක්ත කර්තෘසාධනයනම; සුද්ධහෙතුවසෙනාපි, සුද්ධකර්තෘසාධනය හෙතුකර්තෘ සාධනය යන මොවුන්ගේ වශයෙන්ද ද්විප්‍රකාරවේ; නාමං එව, නාමශබ්ද උදාහරණයම; පකාසිතං, ප්‍රකාශ කරණලදි.

එහි යථොක්ත නයින් වාක්‍ය විසර්ථාවෙහිද පසිඬාවිසර්ථාවෙහිද කර්තෘහුම ලැබේද මේ උක්තකර්තෘසාධන නම “බුජ්ඣතී'ති = බුද්ධො” යනාදිය උදාහරණයි. යමෙක් වනාහි වාක්‍යාව ර්ථාවෙහිදී කර්තෘ

176 ධාතු ධාත්වත්ථතො චෙව බුද්ධො සත්ථා පකාසිතා,
සපද සපදතො චෙව බුද්ධො එව පකාසිතො,

---

ලැබේද ප්‍රසිද්ධියෙහි වනාහි කර්මය ලැබේද මේ අනුක්තකර්තෘසාධන යනම "නිස්සායනංවසතී'ති=නිස්සයො" යනු උදාහරණයි. මෙහි වාක්‍යාවස්ථාවෙහි වසති යන ආඛ්‍යාත පදයෙන් කර්තෘ ප්‍රකාශ කරණු ලැබේ. ප්‍රසිද්ධියෙහිවනාහි අප්‍රත්‍යයතෙම කර්මය ප්‍රකාශකෙරේ් එහෙසින් කිත ප්‍රත්‍යය විසින් නොකියනලද කර්තෘව අනුක්තකර්තෘ සාධනය නමැයි දතයුතු. සුද්ධකර්තෘසාධන හෙතුකර්තෘසාධනයන්ගේවශයෙන්ද විප්‍රකාරවේ. එහි යම්සාධනයක් හෙවත්යම්කර්තෘකෙනෙක් වාක්‍යාවස්ථාවෙහිදි කාරිත ප්‍රත්‍යයෙන් යුක්තනුවූයේද හේ සුද්ධකර්තෘසාධනය නම. "නමතී'ති=නාමං" යනාදිය උදාහරණයි. යම් සාධනයක්වනාහි හෙවත් යම් කර්තෘකෙනෙක් වනාහි වාක්‍යාවස්ථාවෙහිදී කාරිතප්‍රත්‍යයෙන් යුක්තවූයේද ඒ හේතුකර්තෘ සාධනය නම. "නාමෙතී'ති=නාමං" යනාදිය උදාහරණයි. නාමංඑව යන පදයෙන් නාම ශබ්දයම සුද්ධකර්තෘසාධනයට හා හේතුකර්තෘ සාධනයටත් උදාහරණබව දක්වනලද්දේ "නමතී'ති=නාමං" කියා ගත් කල්හි කාරිතප්‍රත්‍යය රහිත හෙයින් සුද්ධකර්තෘසාධනයටද "නාමෙතී'ති=නාමං" කියා ගත්කල්හි කාරිතප්‍රත්‍යය සමග යෙදුනු හෙයින් හෙතුකර්තෘසාධනයටද උදාහරණපිණිසය යනු භාවයි.

මෙසේ උක්තකර්තෘ අනුක්තකර්තෘ සුද්ධකර්තෘ හෙතුකර්තෘන්ගේවශයෙන් භෙද දක්වා ධාතුවිග්‍රහ ධාත්වර්ථවිග්‍රහ ආදි වශයෙන් විග්‍රහවගේ භෙද දක්වන්නේ "**ධාතු ධාත්වත්ථතො චෙව**" යනාදිය කීහ.

176 ධාතු ධාත්වත්ථතො, ධාතුවිග්‍රහ ධාත්වර්ථවිග්‍රහවශයෙන් චෙව, විග්‍රහව විප්‍රකාරදවේ; බුද්ධො සත්ථා පකාසිතා, බුද්ධො සත්ථා යනු උදාහරණපිණිස ප්‍රකාශකරණලද්දුහ (නිස්පන්නපද ධාතුසඞ්ඛ්‍යාත නමාහට මුල්වූ ධාතුයෙන් කරණලද විග්‍රහධාතු විග්‍රහනම්වේ. සබ්බධම්මෙ බුජ්ඣතී'ති= බුද්ධො, බුජ්ඣනතො'ති= බුද්ධො යනාදිය උදාහරණයි, වාක්‍යයෙහිවූ ධාතුවගේ අර්ථඇති අන්‍යපදයකින් කරණ විග්‍රහව ධාත්වර්ථවිග්‍රහනම, කිලෙසාදයොහිංසතී'ති=සත්ථා, හිංසනතො 'ති= සත්ථා. යනාදියයි ) සපද සපදතොච, සවපදවිග්‍රහ අසවපද විග්‍රහ වශයෙන්ද; චෙ, විග්‍රහව විප්‍රකාරවේ; බුද්ධොඑව, බුද්ධො යනුම; පකාසිතො, උදාහරණපිණිස ප්‍රකාශ කරණලද්දේය.

එහි තමාගේ පදයවූ කිතද්‍රව්‍යයෙන් හෝ කිතපදයෙන්හෝ කරණලද විග්‍රහව සවපද විග්‍රහ නම්වේ, "බුජ්ඣතෙතා'ති=බුද්ධො" ජානනෙතා'ති=බුද්ධො" යනාදියයි. තමාගේ පදයනුවූ ආඛ්‍යාත පදයෙන් කරණලද විග්‍රහව අසවපද විග්‍රහ නම් වේ, "බුජ්ඣතී'ති= බුද්ධො ජානාතී'ති=බුද්ධො" යනාදියයි. ධාතුවිග්‍රහ ධාත්වර්ථවිග්‍රහ යන මේ ක්‍රමයද සවපදවිග්‍රහ අසවපදවිග්‍රහ යන මේ දෙක.කාරයද සත්වැදෑරුම් සාධනයන් කෙරෙහිම ලැබේ. ප්‍රකටභාවයෙන් ආචාර්‍ය්‍යයන් විසින් කර්තෘසාධනයම සඳහා කියනලද්දේය, කර්ම සාධන ආදියෙහිද වේ, කර්මසාධනයෙහි කාරිතබ්බන්ති කිච්චං යනාදිය ධාතුවිග්‍රහනම්, උප්පජ්ජිතබ්බන්ති= කිච්චං යනාදිය ධාත්වර්ථවිග්‍රහනම්, කාරිතබ්බන්ති= කිච්චං යනාදිය සවපද විග්‍රහනම්, කරීයතෙ'ති=කිච්චං යනාදිය අසවපදවිග්‍රහව නම් වෙයි, කරණසාධනයෙහි කරීයතෙ අනෙනා'ති= කරණං යනාදිය ධාතුවිග්‍රහනම්, නිප්ඵාදියතෙ අනෙනා'ති= කරණං යනාදිය ධාත්වර්ථ විග්‍රහ නම්, කාරිතබ්බං අනෙනා'ති= කරණං යනාදිය සවපද විග්‍රහනම්, කරීයතෙ අනෙනා'ති= කරණං යනාදිය අසවපදවිග්‍රහ නම්වේ. සම්ප්‍රදාන සාධනයෙහිද- සම්පජ්ජ අස්ස දදාතී'ති= සම්පදානං යනාදිය ධාතු විග්‍රහනම්. සම්පජ්ජ අස්ස පාපුනාතී'ති= සම්පදානං යනාදිය ධාත්වර්ථ විග්‍රහනම්, සම්පජ්ජ අස්ස දදෙනතා'ති= සම්පදානං යනාදිය සවපද විග්‍රහනම්, සම්පජ්ජ අස්ස දදාතී'ති= සම්පදානං යනාදිය අසවපද විග්‍රහනම්වේ, අපාදාන සාධනයෙහිද- අපනෙත්වා ඉතො ආදදාතී'ති= අපාදානං යනාදිය ධාතු විග්‍රහනම්, අපනෙත්වා ඉතො ගණ්හාතී'ති= අපාදානං යනාදිය ධාත්වර්ථ විග්‍රහ නම්, අපනෙත්වා ඉතො ආදදනතො'ති= අපාදානං යනාදිය සවපදවිග්‍රහනම්, අපනෙත්වා ඉතො ආදදාතී'ති= අපාදානං යනාදිය අසවපද විග්‍රහනම්වේ,අධිකරණ සාධනයෙහිද-අධිකරොති එත්ථා'ති=අධිකරණං යනාදිය ධාතුවිග්‍රහනම්, අධිපතිකාති එත්ථා'ති=අධිකරණං යනාදිය ධාත්වර්ථවිග්‍රහනම්, අධිකරොනෙතා එත්ථා'ති=අධිකරණං යනාදිය සවපදවිග්‍රහනම්, අධිකරොති එත්ථා'ති=අධිකරණංයනාදිය අසවපදවිග්‍රහනම්වේ, භාවසාධනයෙහිද-භවතී'ති=භාවො යනාදිය ධාතුවිග්‍රහනම්, භවනං=භාවො යනාදිය ධාත්වර්ථ විග්‍රහනම්, භවිතබ්බං= භාවො යනාදිය සවපදවිග්‍රහනම්. භූයතෙ'ති= භාවො යනාදිය අසවපද විග්‍රහනම්වේ.

මෙසේ විග්‍රහවගේ භෙද දක්වා වාචකයාගේ භෙදදක්වන්නේ "නාමානුරූපතොචෙව" යනාදිය කීහ.

177 නාමානුරූපතො චෙව දස්සෙතබ්බා වච්චාපිච,
කිතකච්චකෙසුච දස්සෙතබ්බා විජානතා.

178 භවෙයාං තෙනපුඤ්ඤෙන කංඛාවිතරණා සතතා,
ලොභො දොසොච මොහොච තනුකාච භවාභවෙ.

සප්පයොගං කිතකභෙදං සමත්තං.

# නිට්ඨිතො කච්චායන භෙදො.

177 නාමානුරූපතොචෙව, සංඥාවට අනුරූප වශයෙන්ම;(කිතප්‍රත්‍යය කිච්චප්‍රත්‍යය කිතකිච්චප්‍රත්‍යය සංඛ්‍යාත නාමානුරූපයෙන් මයයිසේයි.) වච්චාපිච, කර්තෘකර්ම භාවසංඛ්‍යාත වච්චයෝද; දස්සෙතබ්බා,දක්වියයුක්තාහුය; ඔවුහුද; කිතක වාචකෙසුළුව, කිතකවාචකයන්කෙරෙහිම; නොහොත් කිතකිච්ච කිතකිච්ච වාචකයන්කෙරෙහිම;විජානතා, පණ්ඩිතයාවිසින්; දස්සෙතබ්බා, දක්වියයුක්තාහුය.

මෙහිභාවනම් කිත්සංඥවට අනුරූපවශයෙන් කිත්ප්‍රත්‍යයෝකර්තෘවාචකවූහ.ඔවුන්විසින් කියනලදවච්චයනම් කර්තෘ අර්ථයයි, කිච්ච සංඥාවට අනුරූපවශයෙන් කිච්චප්‍රත්‍යයෝ භාවකර්ම වාචකවූහ. ඔවුන්විසින් කියනලදවච්චයෝනම් භාවාර්ථ කර්මාර්ථයෝයි, කිතකිච්ච සංඥාවට අනුරූපවශයෙන් කිතකිච්චප්‍රත්‍යයෝ කර්තෘකර්මභාවයන් වාචකයෝය. ඔවුන්විසින්කියන ලද වච්චයෝනම් කර්තෘඅර්ථ කර්මාර්ථ භාවාර්ථයෝය. යනුභාවයි.

මෙසේ සප්‍රයොග කිතකභෙදදක්වා දූන් තදනුරූප ප්‍රාර්ථනාව දක්වන්නාවූ ආචාර්ය්‍යතම "භවෙයාංතෙන පුඤ්ඤෙන"යනාදි යකීහ.

178 අනෙනපුඤ්ඤෙන, මේ කිතක ප්‍රභෙද ප්‍රකාශක පුණ්‍යය හෙතුකොටගෙණ; කංඛාවිතරණා සතතා භවෙයාං, විමතිය දුරුකරන්ටහැකිවෙම්වා නොහොත් කාංක්‍ෂා දුරුකිරීමට සමර්ථවෙම්වා; භවාභවෙ, භවයක් භවයක්පාසා නොහොත් කුදු මහත් භවයෙහි; ලො

හොව, වස්තුකාම කෙලශකාමයත් කෙරෙහි උපදනා ලොභයද; දෙසොව, එකූනවිසති ආඝාතවස්තුවෙන් උපදනා ද්වෙෂයද;මොහොව, අවිද්‍යා සංඛ්‍යාත මොහයද; තනුකාව, තුනීවෙනා හෙවත් මඳවූවාහු වෙත්වායි කියා ප්‍රාර්ථනාකෙළේයි.

**සප්‍රයොගවූ කිතකභෙදය සම්පූර්ණකරණලද්දේයි.**

---

# කාත්‍යායන භෙදය නිමවූයේය.

ශ්‍රී ජිනෙන්ද්‍ර වර්ෂප්‍රමාණයෙන් දෙදස් සාරසිය එක්වෙනි වර්ෂයෙහි නිකිනි මස පෞර්ණමිදින මේ **කච්චායනභෙද** නම් ප්‍රකරණය සිංහලභාෂාවට නගා නිමකරන්ට යෙදුනේ ගාලුවලල්ලාවිටිකෝරළය බද කොස්ගොඩ නම් ග්‍රාමයෙහි සියලු සාලිග්‍රාම බ්‍රාහ්මණවංශිකයන්ට පළමුවෙනි වන **විජයසිරිවර්ධන වික්‍රමනායක රාජපක්ෂ** මහමුදලි මන්ත්‍රීශ්වරයානන් විසින් කරවනලද ත්‍රිවිධ චෛත්‍යයෙන් සමලංකෘත ගණේගොඩැල්ලනම් ආරාමයෙහි වැඩසිටි ප්‍රියසිලිවූ **නන්දාතිස්ස** මහා ස්ථවිරයන් වහන්සේගේ පැවිදි අතවැසිවූ දඩල්ලේ වාලුකාරාමාධිවාසී ලංකාගොඩ **සිරිසද්ධම්මවංසපාල ධීරානන්ද** මහාස්ථවිරපාදයන්වහන්සේගේ ධර්මාන්තෙවාසිකවූ මිටමත්තෙන් ප්‍රේතවසතු අටුවාව හා අභිනව ශාසනවංශයද කුසජාතක කාව්‍යයද සිංහලකරන්ට යෙදුනාවූ **ජිනවංස සිරිපඤ්ඤාසාරාභිධාන** උන්නාසේ වන මාවිසින.

සිංහලභාෂාවට නගනලද මේ ප්‍රකරණයන් හේතුකොටගෙණ ශාසනාභිවෘද්ධිවර්ධනය කරමින් ශ්‍රද්ධාබුද්ධිසම්පන්න උපාසක උපාසිකාදීහු ආත්මාර්ථ පරාර්ථ සාධනය කෙරෙත්වා.

---

විසුද්ධ වජ්‍රත්තය රාජිතො දිනෙ
විබුද්ධ සද්දන් විද්ධි ලඞ්කාතෙ
පසිද්ධ භූපාල ධිවාස මන්දිරෙ
සුසිද්ධ කප්පෙහි යතීහි වණ්ණිතෙ.

ලඞ්කාදීපවරෙ රම්මෙ රොහණෙ ජනපදෙ සුභෙ
අනෙකධනධඤ්ඤාදි සඤ්චිතෙ විය සොභිතෙ.

සද්ධාදිගුණසම්පන්න ජනසඞ්ඝනිසෙවිතෙ
තත්ථ තත්ථ ඨිතානෙක මහාජින්ද කුලමණ්ඩිතෙ.

යත්ථිනං රමණීයෙන බහුඨානෙසු පාකටෙ
පනසත්ථලනාමස්මිං ගාමස්මිං සාධුවාසිතෙ.

යො අහු මහා මන්තින්දො රාජපක්ඛො සුපූජිතො
විජයසිරිවඩ්ඪනාදි නාමිකො ගුණභූසිතො.

රූපවා යසවා පුඤ්ඤා පසිද්ධකුලජො මති
ඛෙත්තවත්ථුහිරඤ්ඤාදි අනෙකධනසාමිකො
ධනෙන ඌනතා තස්ස නාහු පුඤ්ඤඵලං අහො.

කෙසරී විය සබ්බත්ථ නානාබල පරක්කමො
සද්ධාපඤ්ඤාදි සම්පන්නො චතුත්තයෙසු මාමකො.

යථා තාරාපථෙ චන්දෙ සූරියො වා පදිප්පති
තථෙව සො මහාමන්ති නිජවංසෙ විරොචයි.

තෙන රාජපක්ඛමහා මන්තින්දෙනාභිකාරිතෙ
පාකාරෙන පරික්ඛිත්ත ගහපනාහි විභූසිතෙ.

බොධීතරුවරෙනාපි චෙතියෙනව ලංකතෙ
මුනින්ද පටිබිම්බෙන රාජිතෙ යතිවණ්ණිතෙ.

රම්භා අම්බ ජම්බු සන්නිර නාගපුන්නාග සොභිතෙ
නාලිකෙරාදි කානෙක තරුසණ්ඩෙන මණ්ඩිතෙ.

නානා පුප්ඵලතා කිණ්ණෙ යතීහි සමලඞ්කතෙ
ධම්මරතන නාමෙන ථෙරෙන අපි වඩ්ඪිතෙ.

ගණේගොඩැල්ලාභිධාන විහාරෙ මනනන්දනෙ
සීලාදිගුණසම්පන්නො සාධුජන සුපූජිතො
නන්දතිස්සොති නාමෙන ථෙරොසි පියසීලියො

තස්ස මහාථෙරපාද සාමිනො පියසීලිනො
සිස්සො හං සුවචො ආසිං පඤ්ඤාසාරොති විස්සුතො.

මහා යසාභිධානො යො ථෙරපාදෙ කවිස්සරො
කච්චායනස්ස යං හෙදං රචයී මූලභාසයා.

තං මයා පරිවත්තෙත්වා දීපභාසාය සාධුකං
පඤ්ඤාසාරාභිධානෙන ථෙරෙන විරචෙතසා.

හිතාය සබ්බපාණීනං සාසනස්සච වුඩ්ඪියා
ව්‍යාඛ්‍යායං රචිතාටීකං නිස්සායාභිනවං වරං.

තෙන මෙ පුඤ්ඤකම්මෙන සුකතෙන සුබොධියා
ආකාසට්ඨාච යෙ දෙවා යෙ දෙවා පඨවිනිස්සිතා
සබ්බෙතෙ සුඛිතා හොන්තු අථ පප්පොන්තු නිබ්බුතිං.

අපද දිපද චෙව යත්තකා එත බහුප්පද
චතුප්පදුච යෙසත්තා තෙ හොන්තු අනුපද්දවා

දෙවා සම්මා පවස්සන්තු ලොකස්සිද්ධිං කරොතුහි
පීතො භවතුලොකොයං භූමිපා හොන්තු ධම්මිකා.

ඉමිනා පුඤ්ඤකම්මෙන සංසරං භවසාගරෙ
උප්පජ්ජිස්සං කුලෙ අඩ්ඪෙ ඛත්තියෙ ච පි බ්‍රාහ්මණෙ
භොගෙන ඌනත්තා මය්හං මාහොතු ජාතිජාතියං.

යථාකාමං භවෙ භොගෙ පරිභුඤ්ජං පුනප්පුනං
පාරමිං පූරයිත්වාන බුද්ධො හෙස්සං අනාගතෙ ති.

# ශුද්ධි පත්‍රය.

—ං කච්චායන භෙදයෙහි ං—

| ගාථාඞ්ක. | අසුද්ධ. | සුද්ධ. |
|---|---|---|
| 29 | කණ්හකපෙපා | කණ්හසපෙපා |
| 40 | තිලිඞෙෂ | තිලිඞෙග |
| 60 | විජාසිහි | විජාසීහි |
| 64 | දතෙතන | දතෙතන |
| 77 | යසසවාදිසු | සසසමාදිසු |
| 97 | ගෙතෙතන ගොතමො [නථො | ගොතෙතන ගොතමො [නාථො |
| „ | බ්‍රාහ්මනාදිනං | බ්‍රාහමණාදිනං |
| „ | බ්‍රාහ්මනො | බ්‍රාහමණො |
| 124 | හතතිපද විරූපතො | විහතතිපද රූපතො |
| 125 | පුකෙඩුනානෙ | පුකෙඩුනානෙන |
| „ | අසෙඩුදා | පසෙඩුදා |
| 126 | සිසස ස සමූහානං | සිසස සමූහානං |
| 142 | ජොත්‍යඑ | ජෙජාත්‍යඑ |

—ං සන්නයෙහි ං—

| පිට. | පෙල. | අසුද්ධ. | සුද්ධ. |
|---|---|---|---|
| 3 | 33 | ආඛාත | ආඛ්‍යාත |
| 13 | 8 | සප්‍රයොග | ප්‍රයොග |
| 17 | 16 | පසසථ්‍යත | පසසත්‍යථ |
| 18 | 7 | 'සකිංච' | 'සකිච' |
| „ | 9 | 'සකිංරිච' | 'සකිරිච' |
| „ | 11 | නැමැයි | නමැයි |
| 22 | 20 | ඉසත්‍රියගේ | සත්‍රියගේ |
| 25 | 25 | පුලලියතෙම | පුලලිඞගයතෙම |
| 34 | 8 | වනදති පූජෙති | වනෙදති පූජෙති |
| 36 | 13 | පටිගහහා | පටිගගාහා |
| 40 | 16 | නමින්ම | නයින්ම |
| 41 | 14-15 | වන්නාහුය, | වන්නේය; |
| 42 | 21 | බහුසසුතතමා | බහුසසුතතමො |

| පිට. | පෙල. | අසුබ. | සුබ. |
|---|---|---|---|
| 43 | 2 | නතං" | ඤාතං" |
| ,, | 10 | යාතාදිය | යතාදිය |
| 49 | 13 | අඨාරසහී | අට්ඨාරසහි |
| 51 | 10 | අසඝභොජීත්‍යාදි | අසඛභොජීත්‍යාදී |
| 52 | 7 | කියාදි | කියාද |
| 54 | 19 | වන්දසමාසයාගේ | චන්දසමාසයාගේ |
| 57 | 4 | මිප්‍රකාරය | ඊප්‍රකාරය |
| 53 | 3 | තද්ගුණ විසංඥත | තද්ගුණ සංවිඥත |
| 59 | 4 | පරිමණ්ඩලො | පරිමණ්ඩලො |
| 60 | 18 | පඤ්ඤා | පඤ්ඤෙඤා |
| 61 | 7 | වාසිඨාදි | වසිඨාදි |
| 64 | 12 | ව්‍යමහං | ව්‍යමහං |
| ,, | 15 | විසඞ්ඛ්‍යා | වීසඞ්ඛ්‍යා |
| ,, | 26 | ණොච, | නොච, |
| 69 | 7 | අපත්‍යාපද | අපත්‍යාදිපද |
| ,, | 9 | වසිඨාදිවූද | වසිට්ඨාදිවූද |
| 70 | 8 | ප්‍රතයද | ප්‍රත්‍යයද |
| 71 | 15 | කණ ප්‍රත්‍යය | කණ් ප්‍රත්‍යය |
| ,, | 28 | *ණිණපි | ණිණාපි |
| 78 | 1 | පංචමී විභක්තිය | පඤ්චමී විභත්තිය |
| 80 | 16 | ආ, | අ, |
| 82 | 9 | කිකකං | කිතකං |
| 84 | 33 | *සධා | සාධ |
| 86 | 23 | ප්‍රත්‍යය දෙකක් | නිප්‍රත්‍යය දෙකක් |
| 91 | 10 | ඉගවත් | භගවත් |
| 96 | 15 | බතනියෙවපි | බතතියෙවාපි |

62 පිටේ 8 පෙලේ පටන් පේළි හයක තථතතා යි වියයුතුතැන් තථා කියා යෙදී තිබේ. මේ හැර හ්‍රස්ව දීර්ඝයන්ගේද ණකාර නකාරයන්ගේද ළකාර ලකාරයන්ගේහා ශ ෂ ස යන මොවුන්ගේද විපර්‍ය්‍යාසය ඇතම් තැන දක්නාලැබේ. අර්‍ථාවබොධයට බාධානොවූ එබඳුතැන් මීට ඇතුලත්නොකළෙමු.

---

* අධොලිපියෙහි

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු